

# ජිනචරිත

# JINACARITA

OR

"THE CAREER OF THE CONQUEROR."

WITH THE ANCIENT COMMENTARY

BY

**BHADANTA MĒDHANKARA MAHĀ THĒRA,**

OF

WIJAYABĀHU PIRIVENA.

---

SECOND EDITION

REVISED BY

**Rev. DIYAPATTUGAMA WACISSARA THERA**

OF

SHRĪ WARDHANĀRĀMAYA,

KOLLUPITIYA.

---

# ජිනචරිතය

පුරාණ සන්නයෙන් යුක්තයි.

විජයබාහුපාරිවෙණික

භදන්ත මෙධඞ්කරාභිධ මහා ස්වාමිපාදයන් විසින් විරචිතයි.

---

ද්විතීය සංස්කරණය.

කොල්ලුපිටියේ ශ්‍රී වර්ධනාරාමවාසී

දියපත්තුගම

වාචිස්සර ස්ථවිරයන්වහන්සේ විසිනි.

---

සද්ධර්ම ශ්‍රී වර්ධන සමිතියේ භාණ්ඩාගාරික තැන්පත්

ඩබ්ලියූ. එම්. බාලසූරිය මහතානන් විසින්

මුද්‍රණය කරවනලදී.

---

1930.

(මිල ශත 75.)

සන්න සහිත

# ජිනචරිතය

විමලාණෝ

පරමධම්මචෛතිය පරිවේණාධිස්වාමිව වැඩවිසූ පණ්ඩිතාචාර්ය

## වලාණේ ශ්‍රී සිද්ධාර්ථ ධර්මානන්දාභිධාන

**ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝසභාවේ**

මහා නායක මාහිමියානන්වහන්සේගේ හා

**කොළඹ**

මාලිගාකන්දේ විද්‍යෝදය පරිවේණාධිස්වාමිව වැඩවිසූ

ත්‍රිපිටක වාගීස්වරාචාර්ය

## ශ්‍රී ඥානේශ්වරාභිධාන

නායක මාහිමියානන්වහන්සේගේත්

**ශිෂ්‍ය වූ**

**කොල්ලුපිටියේ ශ්‍රී වර්ධනාරාමවාසී**

**දියපත්තුගම**

## වාචිස්සර ස්ථවිරයන්වහන්සේ විසින්

ප්‍රතිසංස්කරණය කරණලද.

---

**සධර්ම ශ්‍රී වර්ධන සමිතියේ** භාණ්ඩාගාරික තැන්පත්

**ඩබ්ලිව්. එම්. බාලසූරිය** මහතාණන් විසින්

මුද්‍රණය කරවනලදි

---

බු. ව. 2474.

ක්‍රි. ව. 1930.



රත්මලානේ

පරම ධම්මචෙතිය පරිවෙණාධිපතිව වැඩවිසූ

පූජ්‍ය පණ්ඩිතාචාර්‍ය්‍ය

වලානේ ශ්‍රී සිද්ධාර්ථ ධම්මානන්දාභිධාන

ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්මමහාසඞ්ඝ සභාවේ

ප්‍රධාන නායක මාහිමියානන්වහන්සේ.

උපන්නේ 1857, ජුනි — අපවත්වූයේ 1911, ජනවාරි 7.

# විඥාපනය.

---

මේ ග්‍රන්ථය මෙයින් සිවුසාළිස්වසකට පෙර (ක්‍රි: ව: 1886)දී ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්‍ම මහා සඞ්ඝ සභාවේ ප්‍රධාන නායකධුරන්ධර රත්මලානේ පරමධම්මචෛත්‍ය පරිවෙණාධිපතිව වැඩවිසූ අසමදචාර්‍ය්‍ය වලානේ ශ්‍රී සිද්ධාර්ථධර්‍මානන්දාභිධාන මාහිමියානන් වහන්සේ විද්‍යෝදය මහා විද්‍යාලයේ ආචාර්‍ය්‍ය ධුරයක් උසුලමින් වැඩසිටි කාලයේදී ස්වාචාර්‍ය්‍යෝපදේශ පරිදි සංස්කරණයට පමුණුවා තිබෙන බැව් ප්‍රථම මුද්‍රාඞ්කිත විඥාපනයේ මෙසේ දක්වා තිබේ:-

"ජිනචරිතයනම්වූ මෙම ප්‍රකරණයෙන් බොධිසම්භාරහරණය පටන් පිරිනිර්‍වාණ දක්වා සර්‍වඥයන් වහන්සේගේ චරිතය ප්‍රකාශිතයි. එය යථොක්ත අභිධානාමයෙන්ම අවගන්තව්‍යයි. මෙහි කර්‍තෘ විජයබාපිරිවෙන්වැසි "මේධඞ්කර"නම් මහා ස්ථවිර කෙනෙකැයි මෙහිම අවසානයෙහි නිර්දිෂ්ටයි. මෙම තෙරුන්වහන්සේ ගැණ වැඩිදුර කරුණු කියන්නට පොතක පතක තබා ශ්‍රැතිමාත්‍රයකුදු නොමැති හෙයින් ඊට නොපොහොමි. එසේම කාලය ගැණත් නිශ්ශඞ්කීව කියනොහැකියි. ඒ කෙසේවුවත් මුන්වහන්සේ මහාලේඛ ධර්‍මශාස්ත්‍රාදිය උගත් ස්ථවිරකෙනෙකැයි ස්වප්‍රතිපාදිත මෙම ප්‍රකරණයෙන් පැහැදිලිව ප්‍රකාශකළහැකියි. ගද්‍යපද්‍යාදි ශිෂ්ටොපදිෂ්ටකාව්‍යයන් අතුරෙන් මේ පද්‍යකාව්‍යයි. මෙම පද්‍යබන්ධනය ඡන්දොලඞ්කාරාදියෙන්ද ස්වලඞ්කෘතව **පථ්‍යාවක්ත්‍ර-ඉන්ද්‍රවජ්‍රා-උපෙන්ද්‍රවජ්‍රා උපජාති-වංශස්ථ-වසන්තතිලකාදි** මධුරමනොහර වෘත්තවලින් ගොතාතිබේ. මෙහි වාක්‍යයොජනාදිය ආප්‍රතිමප්‍රෞඪත්වාදියෙන් අතිශයින් සමෙතයි. එසේම කාව්‍යප්‍රාණ අනුප්‍රාසලක්ෂණයන්ගෙන්ද රම්‍යතරයි. දාඨාවංශාදි මනොහර මාගධීකාව්‍යයන්ටද වඩා ප්‍රශංසනීයතරයයි කියනු විනා තන්නිහීනයයි කිසිසේත් නොකිය හැකියි. ඒ ප්‍රාඥයන් විසින් ප්‍රමාණකළයුතුයි. ඇතැම්තැන විභක්තිභෙද ආගමාක්ෂරාදිය ශ්ලිෂ්ටොච්චාරණයට යොග්‍ය ලෙස යොදාතිබේ. හෙද මාගධව්‍යාකරණරීතියෙන් සාධ්‍යනොවන්නේ නොවේ. ඒවූකලි යථාඵාසුවශයෙනි.

"තදල්පමපි නොපෙක්ෂ්‍යං කාව්‍යෙදුෂ්ටං කථඤ්චන
ස්‍යාද්වපුස්සුන්දරමපි ශ්විත්‍රෙණෛකෙන දුර්භගම්" යි.

ශ්‍රී දණ්ඩ්‍යාචාර්‍ය්‍යමතවූ නමුත්—

"එකො හි දෙසොගුණසන්නිපාතෙ
නිමජ්ජතීන්දොඃ කිරණෙෂ්විවාඞ්කඃ" යි.

ශ්‍රී කාලිදාසමත හෙයින් මෙහි ආප්තත්වාදියට ඒ බාධා නොවේ. මෙහි ප්‍රස්තුතත්ත්වය ගැණ වැඩිදුර කරුණුකීම ආවශ්‍යක නමුදු ඒ අතිප්‍රපඤ්ච හෙයින් මේ පමණි. ශෞද්ධෝදනිය සම්බුද්ධ චරිතය ප්‍රභාසුවෙන් දැනගැණීමෙහි අභිලාෂීන් විසින් මෙය අවශ්‍ය යෙන්ම භාවිතව්‍යයි. මෙය ග්‍රන්ථය කළ අදහසත් ඒම වියයුතුයි. පිණ්ඩීකෘතව දක්වා තිබෙන හෙයිනි. ඇරත් මාගධීභාෂාතත්ත්ව ඥානයෙහි හා පද්‍යබන්ධනකරණයෙහිත් නියැලියන් විසින් ගතයුතු උපදේශ බොහෝකොට තිබෙන හෙයින් ඔවුන් විසින්ද අවශ්‍ය භාව්‍යයි. මෙය කාලාන්තර සඤ්ජාතදෝෂයන්ගෙන් ඉතා ඝනව ශුද්ධනොකටහෙන තරමට ව්‍යාකූලව තුබුන හෙයින් ඉතා පරිශ්‍රම දාකව්ය. 334, 438, 439, වන ගාථා සහ අන්තිම පිටේ අනන්තිම ගාථා සතරක් නැතිව සන්හ පමණක්ව තුබුන හෙයින් හෙද ගාථා බන්ධනයට යොද **කොළඹ විද්‍යෝදය පරිවෙණාධිපති සිප්සඳුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන** නායක ස්ථවිර පාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ **වලානේ ධම්මානන්ද** නමැති මා විසින් යථොක්ත ආචාර්යයන් වහන්සේගෙන් ලබනලද ආධාරත් ඇතිව යථාශක්තියෙන් ශුද්ධ කරණලදී.

සම්බුද්ධ මිද්ධං සුවිබුද්ධධම්මකං
නිරඞ්ගනං සඞ්ගණීනං ගණනන්තනං
සදත්ථදන්තං සිරිසන්තිකේතනං
නමාමි කන්තං මුනිකොමුදීසකං.

(සිලෙසො)

චිරපරිගතතොයං ව්‍යාකුලත්තං ගතංහි
බලිතතරමනප්පං තස්ස සුද්ධිම්පකප්පං
මුනිවරසුත "ධම්මානන්ද"නාමො සධම්මා
ඉධසීනතුපදෙසො සොකිරාහං කරොමි" යනුයි.

යථොක්ත විඥාපනයෙන් පොත සම්බන්ධ ආධුනිකයන්ගේ ප්‍රයොජනය පිණිස දැක්වූ කරුණු ප්‍රමාණවත බැවින් ග්‍රන්ථනිර්මාණ කාලය හා තත් කර්තෘන් වහන්සේ ගැණ පමණක් කරුණු ස්වල්ප යක් මේ වාරයේදී දක්වන්නෙමු. බොධිසත්ත්වචරිතාභරණ චිත්‍රිත භදන්තමෙධඞ්කර මාහිමිපාණන් **විජයබාහු** නම් පිරිවෙණක වාසයකෙරෙමින් මේ ග්‍රන්ථ ග්‍රන්ථය කළබැව් අවසානු තෙගය කින් පැවැසේ.

දකුණු ලක්දිව **තොටගමුවේ 1. විජයබාහු පිරිවෙණය,** පැසුළු ලක්දිව **වත්තල 8 විජයබාහුපිරිවෙණයයි** තන්නාමාඞ්කිත පිරිවෙණ් දෙකක්ම විද්‍යමානවූ බැව් මහාවංශයේ සටහන්ව තිබේ. එබැවින් මේ දෙතැනින් එක්තැනකම මුන්වහන්සේ වැඩසිටි බැව්, නිශ්චයකට හැකිවේ.

සිංහල භාෂාවෙන් ලියා තිබෙන ධර්මග්‍රන්ථ කීපයක්ම මේ ග්‍රන්ථාගතගාථාවන්ගෙන් සරසා තිබෙන හෙයින් මේ ග්‍රන්ථය අති ප්‍රසිද්ධ ධර්මශාස්ත්‍රඥයන්ගේ පරිශීලනයෙන් ගෞරව ලබමින් සිංහල භාෂාමය ධර්මග්‍රන්ථාවලියේ වෘද්ධතරග්‍රන්ථ අතුරෙන් වර්ෂ 700ට ප්‍රථම යයි චින්තනයකර තිබෙන සද්ධර්මරත්නාවලියටත් වෘද්ධතරවැ සිටින හෙයින් ග්‍රන්ථනිර්මාණකාලය එයින් දත හැකි වේ.

තවද මෙම ග්‍රන්ථය පරිශීලනයෙන් මහදැණියක් ලත් “ චාල්ස් ඩ්‍යූරෝයිසැලි ”නම් යුරෝපීය පඬිවරයෙකු විසින් මෙම ග්‍රන්ථය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනයකොට පෙර අපරදෙදිගම ප්‍රචාරයට පමුණුවා තිබීමෙනුත් විශේෂයෙන් ගෞරවයට භාජන වේ.

මෙයට අයිති තවත් ගාථාවක් අභාවයට පැමිණ තිබෙන බව කනගාටුවෙන් සටහන්කරණ අතරම ඒ පාඩුව පිරිමැසීමට සමර්ථ මේ ග්‍රන්ථයෙහිම්යයි සිතිය හැකි ගාථාවක් සංග්‍රහ පොතක තිබී දකිනු ලැබ මෙහි 266 වන ගාථාව ළඟට යෝග්‍යයයි වැටහුණු බැවින් එය නැණවතුන්ගේ පරීක්ෂාවට භාජනකර මෙහි බහාලන්නෙමු.

“සම්පත්තාථ නිසාකනාතා—පූජේතුංව මුනිස්සරං
පුබ්බාපරම්බරේ ලග්ග—රවිසඤ්කාණ්ණභූසණා”යනුයි.

මෙහි තවත් ප්‍රමාදජනිත දෝස් ඇතිවිය හැකි බැවින්
නැණවතුන්ගේ අනුග්‍රහය අයදිමු.

දිඹපත්තුගම වාචිස්සර ස්ථවිර,
ශ්‍රී වර්ධනාරාමය,
කොල්ලුපිටිය.

$\frac{2474}{1930}$ 12—10 දිනදීය.

# JINACARITAYA.

සන්න සහිත

# ජිනචරිතය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

1 උත්තමං උත්තමඞ්ගෙන නමස්සිත්වා මහෙසිනො
නිබ්බානමධුදං පාදපඞ්කජං සජ්ජනාලිනං.

2 මහාමොහතමං ලොකෙ ධංසෙන්තං ධම්මභාකරං
පාතුභූතං මහාතෙජං ධම්මරාජොදයාචලෙ.

3 ජනතාචිත්තසරෙ ජාතං පසාදකුමුදං සදා
බොධෙන්තං සඞ්ඛචන්දං ච සීලොරුකිරණුජ්ජලං.

“මහෙසිනො පාදපඞ්කජං නමස්සිත්වා ජිනස්ස චරිතං පවක්ඛාමි” යනු මෙහි ක්‍රියාකාරකපදසම්බන්ධයි.

මහෙසිනො, මහර්ෂිවූ සර්වඥයන්ගේ; පාදපඞ්කජං, පාදනාමැති පද්මය; නමස්සිත්වා, වැඳ; ජිනස්සචරිතං, ජිනචරිතය; පවක්ඛාමි, කියමි; කෙබඳුවූද? යත්

(1) සජ්ජනාලිනං, සත්පුරුෂ නාමැති භෘඞ්ගයන්ට; නිබ්බානමධුදං, නිර්වාණනාමැතිමධුදායකවූ; මහෙසිනො, මහර්ෂිවූ සර්වඥයන්ගේ; උත්තමං, උතුම්වූ; පාදපඞ්කජං, පාදනාමැති පද්මය; උත්තමඞ්ගෙන, උත්තමාඞ්ගයෙන්; නමස්සිත්වා, වැඳ.

(2) ධම්මරාජොදයාචලෙ, සර්වඥ නාමැති උදයපර්වතමස්තකයෙහි; පාතුභූතං, පහළවූ; ලොකෙ, ලොකයෙහි; මහාමොහතමං, මහත්වූ මොහ නාමැති අන්ධකාරය; ධංසෙන්තං, නසන්නාවූ; මහාතෙජං, මහත්වූ තෙජස් ඇති; ධම්මභාකරං, ධර්ම නාමැති සූර්‍ය්‍යයාද; (නමස්සිත්වා,) වැඳ.

(3) ජනතා, සත්ත්වයන්ගේ; චිත්තසරෙ, සිත්නාමැතිවිල්හි; ජාතං, හටගත්තාවූ; පසාදකුමුදං, ප්‍රසාදනාමැතිකෙරවය; සදා, හැමකල්හි; බොධෙන්තං, ප්‍රබොධකරන්නාවූ; සීල, සිල්නාමැති; උරු, මහත්වූ; කිරණ, රශ්මීන්; උජ්ජලං, දිලියෙන්නාවූ; සඞ්ඛචන්දං ච, සඞ්ඛ නාමැති චන්ද්‍රයාද; (නමස්සිත්වා,) වැඳ.

4 තහිං තහිං සුවිත්ථිණ්ණං ජිනස්ස චරිතං හිතං
පවක්ඛාමි සමාසෙන සදා'නුස්සරණත්ථිකො.

5 පණීතං තං සරන්තානං දුල්ලභම්පි සිවං පදං
අදුල්ලභං භවෙ භොගපටිලාභම්හි කා කථා?

6 තස්මා තං භඤ්ඤමානං මෙ චිත්තවුත්තපදක්කමං
සුන්දරං මධුරං සුද්ධං සොතුසොතරසායනං.

7 සොතහත්ථපුටා සම්මා ගහෙත්වාන නිරන්තරං
අජරාමරමි'ච්ඡන්තා සාධවො පරිභුඤ්ජථ.

---

8 කප්පසතසහස්සස්ස චතුන්නං චා'පි මත්ථකෙ
අසඞ්ඛෙය්‍යානමා'වාසං සබ්බදා පුඤ්ඤකාමිනං.

---

(4) තහිංතහිං, ඒ ඒ ප්‍රබන්ධයෙහි; සුවිත්ථිණ්ණං, විශෙෂයෙන් පතළා වූ; හිතං, (සියලුසත්ත්වයන්ට) හිතවූ; ජිනස්ස චරිතං, සර්වඥයන්ගේ චරිතය; (හෙවත් ජිනචරිතනම්වූ ප්‍රබන්ධය) සදා, හැමකල්හි; අනුස්සරණත්ථිකො, සිහිකරණු කැමැත්තාවූ (මම); සමාසෙන, සංක්ෂෙපයෙන්; පවක්ඛාමි, විශෙෂයෙන් කියමි.

(5) පණීතං, උතුම්වූ; තං, ඒ ජිනචරිතය; සරන්තානං, සිහිකරන්නාවූ සත්ත්වයන්ට; දුල්ලභම්පි, දුර්ලභවූත්; සිවං පදං, නිර්වාණපදය; අදුල්ලභං භවෙ, දුර්ලභ නොවන්නේය; භොගපටිලාභම්හි, අවශෙෂ සම්පත්තිප්‍රතිලාභයෙහි; කා කථා, කියනුම කිම්ද?

(6) තස්මා, එහෙයින්; මෙ, මා විසින්; භඤ්ඤමානං, කියනු ලබන්නාවූ; චිත්ත, විසිතුරුවූ; වුත්තපදක්කමං, වෘත්ත හා පදපඞ්ක්ති ඇති; සොතූ, අසන්නවුන්ගේ; සොතරසායනං, කර්ණරසායනවූ; සුද්ධං, පිරිසුදුවූ; සුන්දරං, සොඳුරුවූ; තං මධුරං, ඒ මධුරය; (හෙවත් ඒ ජිනචරිතනම්වූ) අමෘතය.

(7) අජරාමරමිච්ඡන්තා, ජරාමරණ නොකැමැත්තාවූ; සාධවො, සත්පුරුෂයෙනි! සොතහත්ථපුටා, ශ්‍රොත්‍ර නමැති හස්තපුටයෙන්; සම්මා, මනාකොට; ගහෙත්වාන, ගෙණ; නිරන්තරං, අනවරතයෙන්; පරිභුඤ්ජථ, (තෙපි) වළඳව්.

(8) කප්පසතසහස්සස්ස, කල්පලක්ෂයක්හුගේ ද; චතුන්නං අසඞ්ඛෙය්‍යානං චාපි මත්ථකෙ, සතර අසඞ්ඛ්‍යයක්හුගේද මස්තකයෙහි; (හෙවත්) සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් මත්තෙහි; සබ්බදා, හැමකල්හි; පුඤ්ඤකාමිනං, කුසල්කැමැත්තවුන්ට; ආවාසං, වාසස්ථානවූ.

9 නානාරතනසම්පන්නං නානාජනසමාකුලං
විචිත්තාපණසංකිණ්ණං තොරණග්ඝිකභූසිතං.

10 යුත්තං දසහි සද්දෙහි දෙවිඥපුරසන්නිභං
පුරං අමරසඞ්ඛාතං අහොසි රුචිරං වරං,

11 තහිං බ්‍රහ්මඤ්ඤයෙ ජාතො සබ්බලොකාභිපූජිතො
මහාදයො මහාපඤ්ඤො අභිරූපො මනොරමො.

12 සුමෙධො නාම නාමෙන වෙදසාගරපාරගූ
කුමාරො'සි ගරූනං සො අවසානෙ ජිනඞ්කුරො.

13 රාසිවඩ්ඪකමච්චෙන දස්සිතං අමිතං ධනං
අනෙකසතගබ්භෙසු නිචිතං තං උදික්ඛිය.

14 ධනසන්නිචයං කත්වා අහො මය්හං පිතාදයො
ගතා මාසකමෙ'කම්පි නෙවා'දාය දිවං ඉති.

---

(9) නානාරතනසම්පන්නං, මුක්තාමාණික්‍යාදි අනෙකප්‍රකාර දශවිධරත්නයෙන් සමෘද්ධවූ; නානාජනසමාකුලං, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි නොයෙක් ජනයන් විසින් ගැවසිගත්තාවූ; විචිත්ත, විසිතුරුවූ; ආපණ, සල්පිලින්; සංකිණ්ණං, සංකීර්ණවූ; තොරණ, තොරණින් හා; අග්ඝික, ඇගෑයෙන්; භූසිතං, අලඞ්කෘතවූ.

(10) දසහි සද්දෙහි, හස්ත්‍යශ්වාදිදශවිධශබ්දයෙන්; යුත්තං, යුක්තවූ; දෙවිඥපුරසන්නිභං, ශක්‍රපුරය හා සමානවූ; රුචිරං, සිත්කලුවූ; වරං, උතුම්වූ; අමරසඞ්ඛාතං, අමරයයිකියනලද; පුරං, පුරයෙක්; අහොසි, වී.

(11) තහිං, ඒපුරයෙහි; බ්‍රහ්මඤ්ඤයෙ ජාතො, බ්‍රාහ්මණවංශයෙහි උපන්නාවූ; සබ්බලොකාභිපූජිතො, සියලුලොකවාසී සත්ත්වයන් විසින් පුදනලද්දාවූ; මහාදයො, මහත්වූකරුණාඇති; මහාපඤ්ඤො, මහත්වූප්‍රඥාඇති; අභිරූපො, විශිෂ්ටවූරූපඇති; මනොරමො, සිත්කලුවූ.

(12) වෙදසාගරපාරගූ, වෙදසාගරයාගේ පරතෙරට පැමිණියාවූ; නාමෙන, නමින්; සුමෙධො නාම කුමාරො, සුමෙධනම්කුමාරයෙක්; ආසි, විය; ජිනඞ්කුරො, බුද්ධාඞ්කුරවූ; සො, ඒ සුමෙධකුමාරතෙම; ගරූනං අවසානෙ, දෙමවුපියන්ගේ ඇවෑමෙහි.

(13) රාසිවඩ්ඪකමච්චෙන, අයකැමිඅමාත්‍යයාවිසින්; දස්සිතං, දක්වනලද; අනෙකසතගබ්භෙසු, නොයෙක් සියගණන් ගබඩාවල්හි; නිචිතං, රැස්කොට තබනලද; තංඅමිතංධනං, ඒප්‍රමාණාතික්‍රාන්තවූ ධනය; උදික්ඛිය, බලා.

(14) මය්හං, මාගේ; පිතාදයො, දෙමවුපිය ආදිවූ නෑයෝ; ධනං, ධනය; සන්නිචයං කත්වා, රැස්කොටතබා; එකංමාසකම්පි, (ඉන්) එක්මදටකුදු; නෙවාදාය, නොමගෙණ; දිවංගතා, ස්වර්ගයට ගියාහ; අහො ඉති, ඛෙදයෙක; (ආශ්චර්යයෙකැයි).

15 සංවෙගමු'පයාතො'ව චින්තෙසී'ති ගුණාකරො
ධනසාරං ඉමං ගය්හ ගන්තුං යුත්තන්ති මෙ පන.

16 රහොගතො නිසීදිත්වා සුන්දරෙ නිජමන්දිරෙ
දෙහෙ දොසෙ උදික්ඛන්තො ඔවදන්තො'පි අත්තනො.

17 භෙදනං තනුනො දුක්ඛං දුක්ඛො තස්සො'දයො'පි ච
ජාතිධම්මො ජරාධම්මො ව්‍යාධිධම්මො අහං ඉති.

18 එවමා'දීහි දෙහස්මිං දිස්වා දොසෙ අනෙකධා
පුරෙ භෙරිං චරාපෙත්වා ආරොචෙත්වාන රාජිනො.

19 භෙරිනාදසුගන්ධෙන යාචකාලිසමාගතෙ
දනකිඤ්ජක්ඛඹසෙන සත්තාහං පීණයී තතො

20 දනගඟහිමබින්දූනං නිපාතෙනා'පි ධංසනං
අයාතං තං විලොකෙත්වා රතනම්බුජකානනං.

---

(15) ගුණාකරො, ගුණයන්ට උත්පත්තිස්ථානවූ; (ඒ සුමෙධකුමාර තෙමේ) ඉති, මෙසේ; සංවෙගමුපයාතොව, කලකිරීමට පැමිණියේම; ඉමංධනසාරං, මේ සම්පත්තිසාරය; ගය්හ, ගෙණ; මෙ පන, මාවිසින් වනාහි; ගන්තුං, යන්නට; යුත්තන්ති; සුදුසුයයි; චින්තෙසි, සිතී.

(16) සුන්දරෙ,සොඳුරුවූ; නිජමන්දිරෙ, සවකීයවූභවනයෙහි; රහොගතො, රහසිගතව; නිසීදිත්වා, හිඳ; දෙහෙ, ශරීරයෙහි; දොසෙ, දොෂයන්; උදික්ඛන්තොපි, බලන්නේද; අත්තනො, තමනට; ඔවදන්තොපි, අවවාදකරන්නේද.

(17) තනුනො, ශරීරයාගේ; භෙදනං, බිඳීමත්; දුක්ඛං, දුකටකාරණය; තස්ස,ඒශරීරයාගේ;උදයොපිච,උත්පත්තියද;දුක්ඛො,දුකට කාරණය; අහං, මම; ජාතිධම්මො, ජාතිය සවභාවකොටඇත්තෙමි; ජරාධම්මො, ජරාව සවභාවකොට ඇත්තෙමි; ව්‍යාධිධම්මොඉති. ව්‍යාධිය සවභාවකොට ඇත්තෙමි යී.

(18) එවමාදීහි, මේආදිවූ (කාරණයෙන්); දෙහස්මිං, ශරීරයෙහි; දොසෙ, දොෂයන්; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; දිස්වා, දැක; රාජිනො, රජහට; ආරොචෙත්වාන, දන්වා; පුරෙ, නුවර; භෙරිං චරාපෙත්වා, බෙර හසුරුවා.

(19) භෙරිනාදසුගන්ධෙන, භෙරිනාදනමැති සුවඳින්; යාචකාලිසමාගතෙ, යාචකනාමැති භෘඞ්ගයන් රැස්වූකල්හි; දනකිඤ්ජක්ඛඹසෙන, දන්නමැතිමුවරදවතුරෙන්; සත්තාහං, සතියක්මුලුල්ලෙහි; පීණයී,සන්තර්පණයකොළේයි,(හෙවත්) පිණවී;තතො, ඉක්බිත්තෙන්;

(20) දනගඟ, දන්සොවස්නමැති; හිමබින්දූනං, තුෂාරබින්දූන්ගේ; නිපාතෙනාපි, හීමෙනුදු; ධංසනංඅයාතං, විධ්වංශනයට නොපැමිණියාවූ, (හෙවත්) විනාශයට නොපැමිණියාවූ; තං රතනම්බුජකානනං, ඒ රත්නනමැතිපද්මවනය; විලොකෙත්වා, බලා.

21 රුදතො ඤාතිසංඝස්ස ජලිතානලකානනා
ගජින්දෙව විය ගෙහම්හා නික්ඛමිත්වා මනොරමා.

22 මහන්තං සො මහාවීරො උපගඤ්ඡි හිමාලයං
හරිචන්දනකප්පූරාගරුගන්ධෙහි වාසිතං.

23 සුඵුල්ලචම්පකාසොකපාටලීතිලකෙහි ච
පූගපුන්නාගනාගාදිපාදපෙහි ච මණ්ඩිතං.

24 සීහව්‍යග්ඝතරච්ඡෙහි ඉභදීපිකපීහි ච
තුරඞ්ගමාදිනෙකෙහි මිගෙහි ච සමාකුලං.

25 සාළිකාරවිහංසෙහි හංසකොඤ්චසුවෙහි ච
කපොතකරවීකාදිසකුණෙහි ච කූජිතං.

26 යක්ඛරක්ඛසගන්ධබ්බදෙවදානවකෙහි ච
සිද්ධවිජ්ජාධරාදීහි භූතෙහි ච නිසෙවිතං.

---

(21) ජලිත, දිලියෙන්නාවූ; අනල, වහනිඇති; කානනා, වනය කින්; (නික්මුනාවූ) ගජින්දෙවිය, හස්තිරාජයක්හුපරිද්දෙන්; ඤාති සංඝස්ස, ඤාතිසමූහයා; රුදතො, හඬමින්සිටියදී; මනොරමා, සිත් කලුවූ; ගෙහම්හා, ගෘහයෙන්; නික්ඛමිත්වා, නික්ම.

(22) මහාවීරො, මහත්වූවීර්‍යයීඇති; සො, ඒසුමෙධකුමාරතෙම; හරිචන්දන, රත්සඳුන; කප්පූර, කපුරුය; අගරු, අගිල්ය යන; ගන්ධෙහි, සුවඳින්; වාසිතං, සුවඳකවනලද්දවූ; මහන්තං, මහත්වූ; හිමාලයං, හිමාලය වනප්‍රදෙශයට; උපගඤ්ඡි, පැමිණියේයි.

(23) සුඵුල්ල, මනාව පිපියාවූ; චම්පක, සපුනසින්ද; අසොක, හෝපලුගසින්ද; පාටලී, පලොල්ගසින්ද; තිලකෙහි ච, ඇසළගසින්ද; පූග, පුවක්ගසින්ද; පුන්නාග, දොඹගසින්ද; නාගාදි, නාගස් ආදිවූ; පාදපෙහි ච, වෘක්ෂයන් විසින්ද; මණ්ඩිතං, සැරහුනාවූ.

(24) සීහ, සිංහයන්විසින්ද; ව්‍යග්ඝ, ව්‍යාඝ්‍රයන්විසින්ද; තරච්ඡෙහි, කරබානවලසුන්විසින්ද; ඉභ, හස්තීන්විසින්ද; දීපි, දිවියන්විසින්ද; කපීහි ච, වඳුරන්විසින්ද; තුරඞ්ගමාදි, අශ්වයන්ආදීවූ; නෙකෙහි, අනෙකප්‍රකාරවූ; මිගෙහිච, මෘගයන්විසින්ද; සමාකුලං, ගැවසීගත් තාවූ.

(25) සාළිකා, සැළලිහිණියන්විසින්ද; රවිහංසෙහි, ඇල්බෝවියන්විසින්ද; හංස, හංසයන්විසින්ද; කොඤ්ච, කොස්ලිහිණියන් විසින්ද, සුවෙහිච, ගිරවුන්විසින්ද; කපොත, පරෙවියන්විසින්ද; කරවීකාදි, කුරවිකෙවිල්ලන්ආදිවූ; සකුණෙහි, පක්ෂීන්විසින්ද; කූජිතං, රැවිපිළිරැවිදෙනලද්දවූ.

(26) යක්ඛ, යක්ෂයන්විසින්ද; රක්ඛස, රාක්ෂසයන්විසින්ද; ගන්ධබ්බ, ගන්ධර්වයන්විසින්ද; දෙව, දෙවියන්විසින්ද; දානවකෙහි ච,

27 මනොසිලිඤ්ජනීලොරුචාරුපබ්බතපන්තිහි
සජ්ඣුහෙමාදිනෙකෙහි භූධරෙහි ච භාසුරං.

28 සුවණ්ණමණිසොපානනෙකතිත්ථසරෙහි ච
සොභිතං තත්ථ කීළන්තනෙකදෙවඞ්ගනාහි ච.

29 සීතසීකරසඤ්ඡන්නනිජ්ඣරානං සතෙහි ච
කිණ්ණරොරගරඞ්ගෙහි රම්මෙහි ච විරාජිතං.

30 සිඛණ්ඩිසණ්ඩනච්චෙහි ලතානං මණ්ඩපෙහි ච
සෙතවාලුකසඤ්ඡන්නමාලකෙහි ච මණ්ඩිතං.

31 සුවණ්ණමණිමුත්තාදි අනෙකරතනාකරං
ඉච්ඡන්තානං ජනාලීනං පුඤ්ඤකිඤ්ජක්ඛමා'ලයං.

---

අසුරයන්විසින්ද; සිද්ධ, සිද්ධයන්විසින්ද; විජ්ජාධරාදීහි, විද්‍යාධරාදීවූ; භූතෙහි ච, භූතයන්විසින්ද; නිසෙවිතං, සෙවුනාලද්දාවූ.

(27) මනොසිල, මනොසිලපර්වතයෙන්ද; ඉඤ්ජනීල, ඉන්ද්‍රනීලපර්වතයෙන්ද; උරු, මහත්වූ; චාරු, මනොඥවූ; පබ්බතපන්තිහි, පර්වතපඞ්ක්තීන්විසින්ද; සජ්ඣු, රජතපර්වතයෙන්ද; හෙමාදි, ස්වර්ණපර්වතාදීවූ; නෙකෙහි, අනෙකප්‍රකාරවූ; භූධරෙහි ච, පර්වතයන්විසින්ද; භාසුරං, බබලන්නාවූ.

(28) සුවණ්ණමණිසොපාන, ස්වර්ණමයපියගැටපඞ්ක්තියෙන්ද; මාණික්‍යමයපියගැටපඞ්ක්තියෙන්ද; නෙක, අනෙකප්‍රකාරවූ; තිත්ථ, තොටින්යා; සරෙහි ච, විලින්ද; තත්ථ, ඒ විල්හි; කීළන්ත, කෙළිනාවූ; නෙකදෙවඞ්ගනාහි ච, අනෙකප්‍රකාරවූ දිව්‍යාඞ්ගනාවන්විසිනුද; සොභිතං, හෙබියාවූ.

(29) සීත, සිහිල්වූ; සීකර, ජලකණිකාවන්ගෙන්; සඤ්ඡන්න, ගැවසීගත්තාවූ; නිජ්ඣරානංසතෙහි ච, (නොයෙක්) සියගණන් ගඞල්හැල්ලෙන්ද; රම්මෙහි, සිත්කලුවූ; කිණ්ණර රඞ්ගෙහිච, කිඳුරන්ගේ නැටීමෙන්ද; උරගරඞ්ගෙහිච, නාගමාණවකයන්ගේ නැටීමෙන්ද; විරාජිතං, බබලන්නාවූ.

(30) සිඛණ්ඩිසණ්ඩ, මයුරසමූහයන්ගේ; නච්චෙහි, නෘත්‍යයෙන්ද; ලතානංමණ්ඩපෙහිච, ලියමඬුයෙන්ද; සෙතවාලුකසඤ්ඡන්න; සුදුවැල්ලෙන් ගැවසීගත්තාවූ; මාලකෙහිච, මලුයෙන්ද; මණ්ඩිතං, සොඳුරුවූ. *

(31) සුවණ්ණමණිමුත්තාදි, ස්වර්ණමාණික්‍යමුතුආදිවූ; අනෙකරතනාකරං, නොයෙක්රත්නයන්ටආකරවූ; ඉච්ඡන්තානං, කැමැතිවන්නාවූ; ජනාලීනං, සත්ත්ව නමැති භෘඞ්ගයන්ට; පුඤ්ඤ, කුසල් නමැති; කිඤ්ජක්ඛ, රේණුවට; ආලයං, වාසස්ථානවූ.

---

* හෙබියාවූ-සමනර.

32 තම'ජ්ඣොගය්හ සො ධීරො සහස්සක්ඛමාපිතෙ
දිස්වා ඉසිපරික්ඛාරෙ පණ්ණසාලවරෙ තහිං.

33 ඉසිවෙසං ගහෙත්වාන විහරන්තො සමාහිතො
සත්තාහ'බ්භන්තරෙ පඤ්ච අභිඤ්ඤ'ට්ඨවිධා'පි ච.

34 උප්පාදෙත්වා සමාපත්තිසුඛෙනෙ'ව තපොධනො
නභසා දිවසෙ'කස්මිං ගච්ඡන්තො ජනතං ඉසි.

35 සොධෙන්තම'ඤ්ජසං දිස්වා ඔතරිත්වා නභා තහිං
ඉති තං ජනතං පුච්ඡි කස්මා සොධෙථ අඤ්ජසං.

36 සුමෙධ ත්වං න ජානාසි දීපඞ්කරතථාගතො
සම්බොධිමු'ත්තමං පත්වා ධම්මචක්කම'නුත්තරං

37 පවත්තෙත්වාන ලොකස්ස කරොන්තො ධම්මසඞ්ගහං
රම්මං රම්මපුරං පත්වා වසතී'හ සුදස්සනෙ.

---

(32) ධීරො, ධෛර්ය්‍යවත්වූ; සො, ඒබොධිසත්ත්වතෙම; තං, ඒ හිමාලය වනයට; අජ්ඣොගය්හ, වැද; සහස්සක්ඛමාපිතෙ, ශක්‍රදෙවෙන්ද්‍රයන්විසින්මවනලද; තහිං පණ්ණසාලවරෙ, ඒ උතුම්වූ පන්සල්හි; ඉසිපරික්ඛාරෙ, තවුස්පිරිකර; දිස්වා, දැක.

(33) ඉසිවෙසංගහෙත්වාන, සෘෂිවෙස් ගෙණ; විහරන්තො, වසන්නාවූ; සමාහිතො, එකඟවූසිත්ඇති (ඒසුමෙධතාපසතෙම); සත්තාහබ්භන්තරෙ, සතියඇතුළත; පඤ්චඅභිඤ්ඤ, පඤ්චඅභිඥවන්ද; අට්ඨවිධාපි ච, අෂ්ටප්‍රකාරවූ (සමාපත්තීන්ද).

(34)-(35) උප්පාදෙත්වා, උපදවා; සමාපත්තිසුඛෙනෙව, සමාපත්තිසැපයෙන්ම (දවස්යවන්නාවූ); තපොධනො, තපසම ධනකොට ඇත්තාවූ (ඒසුමෙධතාපසතෙම); එකස්මිංදිවසෙ, එක්දිනයෙක්හි; නභසා, ආකාශයෙන්; ගච්ඡන්තොඉසි, යන්නාවූ සෘෂිතෙම; අඤ්ජසං, මාර්ගය; සොධෙන්තං ජනතං, සරහන්නාවූ ජනසමූහයා; දිස්වා, දැක; තහිං, ඒස්ථානයට; නභා, ආකාශයෙන්; ඔතරිත්වා, බැස; අඤ්ජසං, මාර්ගය; කස්මා සොධෙථ, කවරකාරණයකින් සරහවුදැයි; තංජනතං, ඒජනසමූහයාඅතින්; ඉතිපුච්ඡි, මෙසේවිචාළේයි.

(36–37) සුමෙධ, සුමෙධතාපසයන්වහන්ස; ත්වං, නුඹවහන්සේ; නජානාසි, නොදන්නාසේක්ද; දීපඞ්කරතථාගතො, දීපඞ්කරනම්සර්වඥයන්වහන්සේ; උත්තමං,උතුම්වූ; සම්බොධිං පත්වා, සම්‍යක්සම්බොධියටපැමිණ; අනුත්තරං, නිරුත්තරවූ; ධම්මචක්කං, ධර්මනමැතිචක්‍රය; පවත්තෙත්වාන, පවත්වා; ලොකස්ස, ලොකවාසීසත්ත්වයාහට; ධම්මසඞ්ගහං කරොන්තො, ධර්මසඞ්ග්‍රහකරණසේක්; රම්මං, සිත්කලුවූ; රම්මපුරං පත්වා, රම්මනම්පුරයට පැමිණ; ඉහ, මේනුවරසමීපයෙහිවූ; සුදස්සනෙ, සුදර්ශනවිහාරයෙහි; වසති, වාසයකරණසේක්.

38 භික්ඛුසතසහස්සෙහි චතූහි විමලෙහි තං
නිමන්තයිම්හ දූතෙන මයං ලොකෙකනායකං.

39 තස්ස ආගමනත්ථාය මග්ගං සොධෙම චක්ඛුම
ඉති සොතස්ස සො තස්ස සුඛං දෙන්තො ජනො' බ්‍රවී.

40 බුද්ධො'ති වචනං සුත්වා පීතියො'දග්ගමානසො
සකභාවෙන සණ්ඨාතුං නෙවසක්ඛි ගුණාකරො.

41 තෙනා'රද්ධඤ්ජසා ධීරො යාචිත්වාන පදෙසකං
ලභිත්වා විසමං ඨානං සමං කාතුං සමාරභි.

42 නා'ලඞ්කතෙයෙව තහිං පදෙසෙ
ලොකෙකනාථො සනරාමරෙහි
සම්පූජිතො ලොකහිතො මහෙසි
වසීහි සද්ධිං පටිපජ්ජි මග්ගං.

---

(38) විමලෙහි, නිර්මලවූ; චතූහි භික්ඛුසතසහස්සෙහි, සාරලක්ෂයක් භික්ෂූන්වහන්සේ හා සමග; ලොකෙකනායකං, ලොකයට එක ස්වාමිවූ; තං, ඒසර්වඥයන්වහන්සේ; මයං, අපි; දූතෙන, දන්දීමෙන්; නිමන්තයිම්හ, පැවරූම්හ.

(39) චක්ඛුම, චක්ෂුෂ්මත්වූ (සුමෙධතාපසයන්වහන්ස); තස්ස, ඒසර්වඥයන්වහන්සේගේ; ආගමනත්ථාය, වැඩීමපිණිස; මග්ගං සොධෙම ඉති, මාර්ගය සරහම්හයි; තස්ස, ඒ සුමෙධතාපසයන්වහන්සේගේ; සොතස්ස, ශ්‍රොත්‍රයට; සුඛං දෙන්තො, සැපදෙන්නාවූ; සො ජනො, ඒ ජනතෙම; අබ්‍රවී, කී.

(40) බුද්ධොති, බුදුනුයයන; වචනං සුත්වා, වචනය අසා; පීතියා, ප්‍රීතියෙන්; උදග්ගමානසො, ඔදවැඩියාවූසිත්ඇතිව; ගුණාකරො, ගුණයට උත්පත්තිස්ථානවූ (සුමෙධතාපසතෙම); සකභාවෙන, ස්වකීය වූභාවයෙන්; සණ්ඨාතුං, සිටින්නට; නෙවසක්ඛි, අසමර්ථවී.

(41) ධීරො, ධෛර්‍ය්‍යගුණයෙන් යුක්තවූ; (ඒසුමෙධතාපසතෙම) තෙන, ඒජනයාවිසින්; ආරද්ධ, පටන්ගන්නාලද; අඤ්ජසා, මාර්ගයෙන්; පදෙසකං, ප්‍රදෙශයක්; යාචිත්වාන, ඉල්වා; විසමං ඨානං, විසමවූ ස්ථානයක්; ලභිත්වා, ලැබ; සමං කාතුං, සමකරණු පිණිස; සමාරභි, පටන්ගත්තේයි.

(42) සනරාමරෙහි, දෙව්මිනිසුන් සහිතවූලොකවාසීසත්ත්වයන් විසින්; සම්පූජිතො, විශෙෂයෙන් පුදනලද්දාවූ; ලොකහිතො, ලොකයටහිතවූ; මහෙසි, මහර්ෂිවූ; ලොකෙකනාථො, ලොකයාට එක ස්වාමිවූ සර්වඥයන්වහන්සේ; තහිං පදෙසෙ, ඒ ප්‍රදෙශය; නාලඞ්කතෙයෙව, සරහන්නාට පූර්වභාගයෙහිම; වසීහි සද්ධිං, (සාරලක්ෂයක්) භික්ෂූන්වහන්සේ හා සමග; තං මග්ගං, ඒමාර්ගයට; පටිපජ්ජි, පිළිපන්සේකි.

43 ඡබ්බණ්ණරංසිජාලෙහි පජ්ජලන්තං තථාගතං
ආගච්ඡන්තං තහිං දිස්වා මොදමානො විචින්තයි.

44 යන්නූනි'මස්ස ධීරස්ස සෙතුං කත්වාන කද්දමෙ
සකත්තානං නිපජ්ජෙය්‍යං සසඞ්ඝස්ස මහෙසිනො.

45 දීඝරත්තම'ලං තං මෙ හිතාය ච සුඛාය ච
ඉච්චෙ'වං චින්තයිත්වාන නිපන්නො සො ජිනඞ්කුරො.

46 පබොධෙත්වාන දිස්වාන චාරුලොචනපඞ්කජෙ
පුන'පෙ'වං විචින්තෙසි නිපන්නො ධිතිමා තහිං.

47 ඉච්ඡෙය්‍යං චෙ'හම'ජ්ජෙ'ව හන්ත්වා'නන්තරණෙ භවෙ
සඞ්ඝස්ස නවකො හුත්වා පවිසෙය්‍යං පුරං වරං.

---

(43) ඡබ්බණ්ණරංසිජාලෙහි, ෂඩ්වර්ණ ඝනබුද්ධරශ්මිමාලාවෙන්; පජ්ජලන්තං, දිලියෙන්නාවූ; තහිං, ඒ ස්ථානයට; ආගච්ඡන්තං, වඩනාවූ; තථාගතං, සර්වඥයන්වහන්සේ; දිස්වා, දැක; මොදමානො, සතුටුවූ සිත් ඇති (ඒ සුමෙධතාපසතෙම); විචින්තයි, (මෙසේ) සිතී.

(44) සසඞ්ඝස්ස, සඞ්ඝසහිතවූ; මහෙසිනො, මහර්ෂිවූ; ධීරස්ස, ප්‍රාඥවූ; ඉමස්ස, මේ සර්වඥයන්වහන්සේට; සකත්තානං, ස්වකීයවූ (මාගේ) ශරීරය; කද්දමෙ, මඩෙහි; සෙතුං කත්වාන, හෙයක්කොට; නිපජ්ජෙය්‍යං, හොත්තෙම්වීම්නම්; යන්නූන, යෙහෙක.

(45) දීඝරත්තං, බොහෝකලක් මුළුල්ලෙහි; මෙ, මට; හිතාය ච, හිතපිණිසද, සුඛායච, සැප පිණිසද; තං, ඒ මඩමත්තේ හෙවීම; අලං ඉති, සෑහෙන්නේයයි; එවං, මෙසේ (යථොක්තක්‍රමයෙන්); චින්තයිත්වාන, සිතා; නිපන්නො, හොත්තාවූ; ජිනඞ්කුරො, බුද්ධාඞ්කුරවූ; සො, ඒසුමෙධතාපසතෙම.

(46) චාරු, මනොඥවූ; ලොචනපඞ්කජෙ, නෙත්‍ර නමැති පද්ම යන්; පබොධෙත්වාන, ප්‍රබොධකොට; තං, ඒ සර්වඥයන්වහන්සේ; දිස්වාන, දැක; තහිං, ඒ ස්ථානයෙහි; නිපන්නො, හොත්තාවූ; ධිතිමා, ධෛර්‍ය්‍යවත්වූ (ඒ සුමෙධතාපසතෙම); පුනපි, නැවතද; එවං විචින්තෙසි, මෙසේ සිතී.

(47) අහං, මම; ඉච්ඡෙය්‍යං චෙ, ඉදින් කැමැත්තෙම්වීම් නම්; අජ්ජෙව, අදම; අනන්ත, අපරිමිතවූ; රණෙ, ක්ලෙශයුද්ධ ඇති; භවෙ, විවිධවූභවය; හන්ත්වා, නසා; සඞ්ඝස්ස නවකො හුත්වා, සඞ්ඝ නවකව; වරං, උතුම්වූ; පුරං, (ඒ රම්‍යනම්) පුරයට; පවිසෙය්‍යං, වද නෙම් වෙම්ද.

48 කිම්'ඤ්ඤාතකවෙසෙන කෙලසනිබ්බාපණෙන මෙ
අයං බුද්ධො'ව'හං බුද්ධො හුත්වා ලොකෙ අනුත්තරො.

49 ජනතං ධම්මනාවාය තාරෙත්වාන භවණ්ණවා
නිබ්බාණපුරමා'නෙත්වා සෙය්‍යං මෙ පරිනිබ්බුතං.

50 ඉච්චෙ'වං චින්තයිත්වාන නිපන්නො කද්දමෙ තහිං
සුවණ්ණකදලික්ඛන්ධසන්නිභො සො'තිසොභති.

51 ඡබ්බණ්ණරංසීහි විරාජමානං
දිස්වා මනුඤ්ඤං සුගතත්තභාවං
සඤ්ජාතපීතීහි උදග්ගචිත්තො
සම්බොධියා ඡන්දම'කාසි ධීරො.

52 ආගන්ත්වාන තහිං ඨානං ඉසිං පඞ්කෙ නිපන්නකං
ලොකස්ස සෙතුභූතො'පි සෙතුභූතං තම'ත්තනො.

53 දිස්වා උස්සීසකෙ තස්ස ඨත්වා ලොකෙකසෙතුනො
ලොකෙකලොචනො ධීරො දීපඞ්කරතථාගතො.

---

(48) අඤ්ඤාතකවෙසෙන, අප්‍රසිද්ධවූවෙශයෙන්; කෙලසනිබ්බාපණෙන, කෙලශක්ෂයකිරීමෙන්; මෙ, මට; කිං, ප්‍රයොජන කිම්ද; අයං බුද්ධොඉව, මේ දීපඞ්කරසර්වඥයන් වහන්සේමෙන්; අහං, මම; ලොකෙ, ලොකයෙහි; අනුත්තරො, නිරුත්තරවූ; බුද්ධො හුත්වා, බුදුව.

(49) ජනතං, ජනසමූහයා; ධම්මනාවාය, ධර්මනමැති නැවින්; භවණ්ණවා, භවනමැතිසාගරයෙන්; තාරෙත්වාන, එතරකොට; නිබ්බාණපුරං, නිර්වාණනමැතිපුරයට; ආනෙත්වා, ගෙණහැර; මෙ, මාගේ; පරිනිබ්බුතං, පරිනිර්වාණයකිරීම; සෙය්‍යං ඉති, උතුමැයි.

(50) ඉතිඑවං, මෙසේ; චින්තයිත්වාන, සිතා; තහිං කද්දමෙ, ඒමඩ මත්තෙහි; නිපන්නො, හොත්තාවූ; සුවණ්ණකදලික්ඛන්ධසන්නිභො, ස්වර්ණකදලිස්කන්ධයක් සමානවූ; සො, ඒ බොධිසත්වතෙම; අතිසොභති, අතිශයින් බබලන්නේයි.

(51) ඡබ්බණ්ණරංසීහි, සවණක්ඝනබුදුරැසින්; විරාජමානං, බබලන්නාවූ; මනුඤ්ඤං, මනොඥවූ; සුගතත්තභාවං, සර්වඥයන්වහන්සේගේ ආත්මභාවය; දිස්වා, දැක; සඤ්ජාත, හටගත්තාවූ; පීතීහි, ප්‍රීතීන්; උදග්ගචිත්තො, ඔද්වැඩියාවූසිත්ඇති; ධීරො, ප්‍රාඥවූ (සුමෙධතාපසතෙම); සම්බොධියා, සම්‍යක්සම්බොධිය පිණිස; ඡන්දමකාසි, ආලය කෙළේයි.

(52)-(53) ලොකස්ස, ලොකයාහට; සෙතුභූතොපි, හෙයක්වැනිවූද (සර්වඥයන්වහන්සේ); තහිං ඨානං, ඒස්ථානයට; ආගන්ත්වාන, වැඩ; පඞ්කෙ නිපන්නකං, මඩෙහි හොත්තාවූ; අත්තනො, තමන්වහන්සේට; සෙතුභූතං, හෙයක්වැනිවූ; තංඉසිං, ඒ ඍෂීනු; දිස්වා, දැක; ලොකෙකලොචනො, ලොකයහට අසහායනෙත්‍රයක් වැනිවූ; ධීරො, ප්‍රාඥවූ; දීපඞ්කරතථාගතො, දීපඞ්කරනම් සර්වඥයන්වහන්සේ; ලොකෙකසෙතුනො, ලොකයහට අසහායහෙයක්බඳුවූ; තස්ස, ඒ සුමෙධතාපසයන්වහන්සේගේ; උස්සීසකෙ ඨත්වා, ඉස්දෙරසිට.,

54 ගොතමො නාම නාමෙන සම්බුද්ධො'යං අනාගතෙ
භවිස්සතී'ති ව්‍යාකාසි සාවකෙ ච පුරාදිකෙ.

55 ඉදං වත්වාන ඤත්වාන සසඞ්ඝො තං පදක්ඛිණං
පූජෙසි අට්ඨමුට්ඨීහි කුසුමෙහි ගුණප්පියො.

56 ඉති කාතූන පායාසි සසඞ්ඝො ලොකනායකො
රම්මකං නාම නගරං රම්මාරාමාලයාලයං.

57 ජිනස්ස වචනං සුත්වා උට්ඨහිත්වාන පඞ්කතො
මුදිතො දෙවසඞ්ඝෙහි කුසුමාදීහි පූජිතො.

58 පල්ලඞ්කමා'භුජිත්වාන නිසීදි කුසුමාසනෙ
මහාතපො මහාපඤ්ඤො සුමෙධො දමිතින්ද්‍රියො.

59 දෙවා දසසහස්සෙසු චක්කවාළෙසු මොදිතා
අභිත්ථවිංසු තං ධීරං නිසින්නං කුසුමාසනෙ.

---

(54) අයං, මේතෙම; අනාගතෙ, මතුඑන්නාවූකාලයෙහි; නාමෙන, නමින්; ගොතමොනාම, ගෞතමනම්වූ; සම්බුද්ධොභවිස්සතීති, සම්‍යක්සම්බුද්ධ වන්නේයයිකියාද; සාවකෙච, අග්‍රශ්‍රාවකයන්ද; පුරාදිකෙ, පුරආදිධර්මයන්ද; ව්‍යාකාසි, ප්‍රකාශකොට වදාළසේක.

(55) ඉදං වත්වාන, මෙසේවදාරා; සසංඝො, සංඝසහිතවූ; ගුණප්පියො, ගුණයෙහි ප්‍රියවූ (ඒ දීපඞ්කරනම් සර්‍වඥයන්වහන්සේ); තං, ඒ සුමෙධතාපසයන්වහන්සේ; පදක්ඛිණං කාත්වාන, පැදකුණුකොට; අට්ඨමුට්ඨීහි කුසුමෙහි, අටමිටක් දූසමන්මලින්; පූජෙසි, පිදූසේක.

(56) ඉති කාතූන, මෙසේකොට වදාරා; සසඞ්ඝො, සඞ්ඝසහිතවූ; ලොකනායකො, ලොකස්වාමිවූ (දීපඞ්කරනම් සර්‍වඥයන්වහන්සේ); රම්ම,සිත්කලුවූ; ආරාම;උද්‍යානයන්හා; ආලය,ගෘහයන්ට; ආලයං,වාසයඵානවූ; රම්මකංනාම නගරං,රම්‍යනම්පුරයට; පායාසි, වැඩිසේකි.

(57) ජිනස්ස, සර්‍වඥයන්වහන්සේගේ; වචනං සුත්වා, වචනය අසා; පඞ්කතො, මඩින්; උට්ඨහිත්වාන, නැගිසිට; දෙවසඞ්ඝෙහි, දිව්‍යසමූහයන් විසින්; කුසුමාදීහි, පුෂ්පාදීන්; පූජිතො, පුදනලද්දවූ.

(58) මුදිතො, සතුටුවූසිත් ඇති, මහාතපො, මහත්වූතපස් ඇති; මහාපඤ්ඤො, මහත්වූප්‍රඥාඇති; දමිතින්ද්‍රියො, දමනලද පඤ්චෙන්ද්‍රියයන් ඇති; සුමෙධො, සුමෙධනම්තාපසතෙම; කුසුමාසනෙ, පුෂ්පාසන මස්තකයෙහි; පල්ලඞ්කං ආභුජිත්වාන, පළක්බැද; නිසීදි, හුන්නේයි.

(59) මොදිතා, සතුටුසිත් ඇති; දසසහස්සෙසු චක්කවාළෙසු දෙවා, දසදහසක්සක්වළදෙවියෝ; කුසුමාසනෙ, පුෂ්පාසනමස්තකයෙහි; නිසින්නං, හුන්නාවූ; තං ධීරං, ඒ ප්‍රාඥවූ (මහාබොධිසත්වයන්ට); අභිත්ථවිංසු, ස්තුතිකළාහුයි.

60 තිසිනෙතා උපධාරෙසි ධම්මෙ බුද්ධකරෙ තදා
කිමුද්ධං වා අධො වා'පි දිසාසු විදිසාසු ච.

61 ඉච්චෙ'වං විචිනන්තො සො සකලං ධම්මධාතුකං
අද්දක්ඛි සකසන්තානෙ පඨමං දානපාරමිං.

62 එවමෙ'වං ගවෙසන්තො උත්තරිං පාරමී විදූ
සබ්බා පාරමියො දිස්වා අත්තනො ඤාණචක්ඛුනා.

63 සංසාරෙ සංසරන්තො සො බහුං දුක්ඛං තිතික්ඛිය
ගවෙසන්තො'මතං සන්තො පූරෙත්වා දානපාරමිං.

64 සත්තානං කප්පරුක්ඛො'ව චින්තාමණී'ව කාමදො
ඉච්ඡිතිච්ඡිතමන්නාදිං දදන්තො දදතං වරො.

---

(60) තදා, එකල්හි; තිසිනෙතා, (පුෂ්පාසනමස්තකයෙහි) උන්නාවූ (සුමෙධතාපසතෙම); බුද්ධකරෙධම්මෙ, බුද්ධකාරකධර්මයන්; උද්ධං වාකිං, උඩදෙහෝ; අධොවාපිකිං, යටදෙහෝ; දිසාසු, සතරදිශා වෙහිදෙහෝ; විදිසාසුච, සතරඅනුදිශාවෙහිදෙහෝයි කියා; උපධා රෙසි, සැලකී.

(61) ඉච්චෙවං, මෙසේ (යථොක්තක්‍රමයෙන්); සකලං ධම්මධාතු කං, සියලුලොව; විචිනන්තො, පරීක්ෂාකරන්නාවූ; සො, ඒ සුමෙධ තාපසතෙම; සකසන්තානෙ, ස්වකීයවූසන්තානයෙහි; පඨමං, පළමු කොට; දානපාරමී, දානපාරමිතාව; අද්දක්ඛි, දුටුයේයි.

(62) එවමෙවං, එපරිද්දෙන්ම; උත්තරිං, මත්තෙහි; පාරමී, පාරමී ධර්මයන්; ගවෙසන්තො, සොයන්නාවූ; විදූ, නුවනැත්තාවූ (ඒ සුමෙධතාපසතෙම); අත්තනො, තමාගේ; ඤාණචක්ඛුනා, නුවණැසින්; සබ්බාපාරමියො, සියලුපාරමිධර්මයන්; දිස්වා, දැක.

(63) අමතං, අමෘතමහානිර්වාණය; ගවෙසන්තො, සොයන්නාවූ; සන්තො, සත්පුරුෂවූ (ඒ සුමෙධතාපසතෙම); සංසාරෙ, සසර; බහුං දුක්ඛං, බොහෝදුක්; තිතික්ඛිය, ඉවසා; සංසරන්තො, ඇවිදින්නේ; දානපාරමී, දානපාරමිතාව; පූරෙත්වා, පුරා.

(64) සත්තානං, සත්වයන්ට; කප්පරුක්ඛොව, කල්පවෘක්ෂයක් මෙන්ද; කාමදො, කැමැතිකැමැතිවස්තුදෙන්නාවූ; චින්තාමණීව චින්තාමාණික්‍යයක්මෙන්ද; ඉච්ඡිතිච්ඡිතං, කැමැතිකැමැතිවූ; අන්නා දිං, ආහාරාදී වස්තුව; දදන්තො, දෙන්නේ; දදතං වරො, දෙන්නා වුන් අතුරෙන් උතුම්වූ (ඒ බෝධිසත්වතෙම.)

65 තාරකාහි බහුං කත්වා නභෙ චාරුවිලොචනෙ
උප්පාටෙත්වා දදං ධීරො යාචකානං පමොදිතො.

66 මහියා පංසුතො වා'පි සමුද්දොදකතො'ධිකං
දදං සරීරමංසං ච ලොහිතම්පි ච අත්තනො.

67 මොලිනා'ලඞ්කතෙ සීසෙ'ධිකං කත්වා සිනෙරුතො
කම්පයිත්වා මහිං දෙන්තො සුතෙ චා'පි සකඞ්ගනා.

68 සීලනෙක්ඛම්මපඤ්ඤාදී පූරෙත්වා සබ්බපාරමී
වෙස්සන්තරත්තභාවෙ' වම්පත්වා තමහා චුතො පන.

69 උප්පජ්ජිත්වා සුරාවාසෙ සුන්දරෙ තුසිතෙ පුරෙ
වසන්තො සුචිරං කාලං භුත්වා'නන්තසම්පදං.

---

(65) නභෙ, ආකාශයෙහි; තාරකාහි, තාරකාවන්ටවඩා; බහුං කත්වා, බොහෝකොට; චාරු, මනොඥවූ; විලොචනෙ, නෙත්‍රයන්; උප්පාටෙත්වා, උපුටා; යාචකානං, යාචකයන්ට; දදං, දෙන්නාවූ; පමොදිතො, සතුටුසිත්ඇති; ධීරො, ප්‍රාඥවූ (ඒ බොධිසත්ත්වතෙම).

(66) මහියා, පෘථිවියගේ; පංසුතොවාපි, පසටත්වඩා; සමුද්දොදකතො, සමුද්‍රජලයටත්වඩා; අධිකං, අධිකකොට; අත්තනො, තමාගේ; සරීරමංසං ච, ශරීරමාංසයද; ලොහිතම්පි ච, රුධිරයද; දදං, දෙන්නාවූ (මහාබොධිසත්ත්වතෙම).

(67) සිනෙරුතො, මහාමෙරුපර්වතයටත්; අධිකං කත්වා, අධිකකොට; මොලිනා, කිරීටයෙන්; අලංකතෙ, සැරහුනාවූ; සීසෙ, ශීර්ෂයන්ද; මහිං, පෘථිවිය; කම්පයිත්වා, කම්පාකරවා; සුතෙවාපි, (ජාලිකෘෂ්ණජිනාආදි) දරුවන්ද; සකඞ්ගනා, (මද්‍රිදෙවීන්ආදිවූ) ස්වකීයභාර්‍ය්‍යාවන්ද; දදනෙතා, දෙන්නේ.

(68) එවං, මෙසේ; සීලනෙක්ඛම්මපඤ්ඤාදි, ශීලනෛෂ්ක්‍රම්‍යප්‍රඥාදිවූ; සබ්බපාරමී, සියලුපාරමිධර්මයන්; පූරෙත්වා, පුරා; වෙස්සන්තරත්තභාවෙ, වෙස්සන්තරාත්මභාවයෙහි; පත්වා, පැමිණ; තමහා, ඒ වෙස්සන්තරාත්මභාවයෙන්; චුතො පන, චුතවූයේවනාහි.

(69) සුන්දරෙ, සොඳුරුවූ; සුරාවාසෙ, දෙවියන්ට වාසස්ථානවූ; තුසිතෙ පුරෙ, තුසිතදිව්‍යලොකයෙහි; උප්පජ්ජිත්වා, ඉපිද; අනන්ත, අපරියන්තවූ; සම්පදං, සම්පත්; භුත්වාන, අනුභවකොට; සුචිරං කාලං, ඉතා බොහෝකලක්; වසන්තො, වසන්නේ.

70 කතඤ්ජලීහි දෙවෙහි යාචිතො දිපදුත්තමො
සම්බොධාය මහාවීර කාලො තුය්හන්ති ආදිනා.

71 විලොකෙත්වාන කාලාදිං ඤත්වා කාලන්ති බොධියා
පටිඤ්ඤං දෙවසඞ්ඝස්ස දත්වා නන්දනකානනං.

72 ගන්ත්වාන දෙවසඞ්ඝෙහි සුගතිං ගච්ඡ'තො චුතො
අභිත්ථුතො මහාපඤ්ඤො චවිත්වාන තතො ඉධ.

73 සුසජ්ජිතඞ්ගොරුතුරඞ්ගමාකුලෙ
විචිත්තනානාපණපණ්‍යසම්පදෙ
මනොරමුත්තුඞ්ගගජින්දරාජිතෙ
විභූසිතෙ තොරණකෙතුරාසිහි.

---

(70) කතඤ්ජලීහි, කරණලදබද්ධාඤ්ජලීඇති; දෙවෙහි, දෙවියන් විසින්; මහාවීර, මහත්වූවීර්‍ය්‍යඇති බොධිසත්ත්වයන්වහන්ස; තුය්හං, තුබවහන්සේට; සම්බොධාය, සම්‍යක්සම්බොධියට; කාලොඉති, කාලැයි යන; ආදිනා, මේ ආදීන්; යාචිතො, යාඥාකරණලද්දවූ; දිපදුත්තමො, ද්විපදෙත්තමවූ (ඒ බොධිසත්ත්වතෙම.)

(71)-(72) කාලාදිං, කල්ආදිය; විලොකෙත්වාන, බලා; බොධියා, සම්‍යක්සම්බොධියට; කාලොඉති, කලැයි; ඤත්වා, දැන; දෙවසඞ්ඝස්ස, දිව්‍යසමූහයහට; පටිඤ්ඤං දත්වා, ප්‍රතිඥාදී; නන්දනකානනං, නන්දනොද්‍යානයට; ගන්ත්වාන, ගොසින්; දෙවසඞ්ඝෙහි, දිව්‍යසමූහයන් විසින්; ඉතොචුතො, මේ තුසිතදිව්‍යලොකයෙන් චුතවූ (ඔබවහන්සේ); සුගතිං ගච්ඡ, සුගතිසංඛ්‍යාත මනුෂ්‍යලොකයට වැඩියමැනවැයි කියා; අභිත්ථුතො, ස්තුතිකරණලද්දවූ; මහාපඤ්ඤො, මහත්වූප්‍රඥා ඇති (බොධිසත්ත්වතෙම); තතො, ඒ තුසිතදිව්‍යලොකයෙන්; චවිත්වාන, චුතව; ඉධ, මේ මනුෂ්‍යලොකයෙහි

(73) සුසජ්ජිත, මනාකොට සරහනලද; අඞ්ග, ශරීරඇති; උරු, මහත්වූ; තුරඞ්ගම, අශ්වයන් විසින්; ආකුලෙ, ගැවසීගත්තාවූ; විචිත්ත, විසිතුරුවූ; නානා, අනෙකප්‍රකාරවූ; ආපණ, සල්පිලින් හා; පණ්‍ය, විකිණිබඩුයෙන්; සම්පදෙ, සමෘද්ධවූ; මනොරම, සිත්කලුවූ; උත්තුඞ්ග, උස්වූ; ගජින්ද, හස්තිරාජයන් විසින්; රාජිතෙ, බබලන්නාවූ; තොරණරාසිහි, තොරණසමූහයෙන්ද; කෙතුරාසිහි; ධ්වජසමූහයෙන්ද; විභූසිතෙ, අලඞ්කාරවූ.

74 අලඞ්කතට්ටාලවිසාලමාලයෙ
සුගොපුරෙ සුන්දරසුන්දරාලයෙ
සුදස්සනීයෙ කපිලවහයෙ පුරෙ
පුරින්දදස්සා'පි පුරස්ස හාසකෙ.

75 භූපාලමොළිරතනාලිනිසෙවිතඞ්ඝි
පඞ්කෙරුහං විමලනෙකගුණාධිවාසං
ඔක්කාකරාජකුලකෙතුමනාථනාථං
සුද්ධොදනං නරපතිං පවරං පටිච්ච.

76 සො සජ්ඣුදුමධවලාමලදස්සනීය
සොණ්ඩාය සංගහිතසෙතවරාරවින්දං
චන්දාවදාතවරවාරණරාජවණ්ණං
සන්දස්සයිත්‍වා සුපිනෙන විසාලපඤ්ඤො.

77 බිම්බාධරාය විකචුප්පලලොචනාය
දෙවින්දචාපරතිවඞ්කභමුලතාය
සම්පුණ්ණසොමවිමලින්දුවරානනාය
සොවණ්ණහංසයුගචාරුපයොධරාය.

---

(74) අලඞ්කත, සරසනලද; අට්ටාල, අට්ටාලයෙන් හා; විසාල, මහත්වූ; ආලයෙ, වාසස්ථානඇති; සුගොපුර, මනාවූදොරටුඇති; සුන්දර, දර්ශනීයවූ; සුන්දරි, ස්ත්‍රීන්ට; ආලයෙ, වාසස්ථානවූ; සුදස්සනීයෙ, අතිශයින් දර්ශනීයවූ; පුරින්දදස්සාපි, ශක්‍රදෙවෙන්ද්‍රයාගේද; පුරස්ස, (අමරවතී නම්) රාජධානියට; හාසකෙ, අපහාසකරන්නාවූ; කපිලවහයෙ පුරෙ, කිඹුල්වත්පුරයෙහි.

(75) භූපාල, රජදරුවන්ගේ; මොළි, කිරීටමස්තකයෙහි; රතන, රත්නනමැති; අලි, භෘඞ්ගයන් විසින්; නිසෙවිත, සෙවුනාලද; අඞ්ඝි පඞ්කෙරුහං, පාදපද්මඇති; විමල, නිර්මලවූ; නෙක, අනෙකප්‍රකාරවූ; ගුණාධිවාසං, ගුණයට වාසස්ථානවූ; ඔක්කාකරාජකුල, ඉක්ෂ්වාකුරාජවංශයට; කෙතු, ධ්වජයක් හා සමානවූ; අනාථනාථං, අනාථයන්ට ස්වාමිවූ; පවරං, උතුම්වූ; සුද්ධොදනං නරපතිං පටිච්ච, ශුද්ධොදනමහරජහුනිසා.

(76) විසාලපඤ්ඤො, මහත්වූප්‍රඥාඇති; සො, ඒ බොධිසත්ත්‍වතෙම; සජ්ඣුදුම, රජතද්‍රැමයක්සේ; ධවල, සුදුවූ; අමල, නිර්මලවූ; දස්සනීය, දර්ශනීයවූ; සොණ්ඩාය, සොඬකින්; සංගහිත, ගන්නාලද; සෙත, ශුභ්‍රවූ; වර, උතුම්වූ; අරවින්දං, පද්මයක්ඇති; චන්ද, චන්ද්‍රයාසේ; අවදාත, ධවලවූ; වර, උතුම්වූ; වාරණරාජවණ්ණං, හස්තිරාජවර්ණයක්; සුපිනෙන, ස්වප්නයෙන්; සන්දස්සයිත්‍වා, දක්වා.

(77) බිම්බ, බිඹුඵලයක් හා සමානවූ; අධරාය, අධරයුගලයක් ඇති; විකච, විකසිතවූ; උප්පල, නීලොත්පල හා සමානවූ; ලොච

78 පාදරවින්දකරපල්ලවසුන්දරාය
සොවණ්ණවණ්ණතනුවණ්ණවිරාජිතාය
සීලාදිනෙක ගුණභූසනභූසිතාය
මායාය රාජවනිතායු'පගඤ්ඡි කුච්ඡිං.

79 පටිසන්ධික්ඛණෙ තස්ස ජාතා'නෙකවිධබ්භුතා
අථා'යං ගහිතාරක්ඛො නරෙහි අමරෙහි ච.

80 මනුඤ්ඤරතනම්බුජකණ්ණිකාය
මා'සීනසිඞ්ගීපටිමා'ව රම්මා
සුවණ්ණවණ්ණො දිපදුත්තමින්දො
පල්ලඞ්කමා'භුඤ්ජිය මාතුගබ්භෙ.

---

තාය, ඇස්සහලක් ඇති; දෙවින්දචාප, ඉන්ද්‍රචාපයක් හා සමානවූ; රතිවඩ්ඪන, ඇලුම්වඩන්නාවූ; භූලතාය, බැමලියසහලක් ඇති; සම්පුණ්ණ, සම්පූර්ණවූ; සොම්ම, සෞම්‍යවූ; විමල, නිර්මලවූ; ඉන්දු, චන්ද්‍රමණ්ඩලයක් හා සමානවූ; වර, උතුම්වූ; ආනනාය, මුඛමණ්ඩලයක් ඇති; සොවණ්ණහංසයුග, ස්වර්ණහංසයුගලයක් සමානවූ; චාරු, මනොඥවූ; පයොධරාය, පයොධරයුගලයක් ඇති.

(78) පාදරවින්ද, පාදනමැති පද්මයෙන්ද; කරපල්ලව, හස්තනමැති පල්ලවයෙන්ද; සුන්දරාය, සොඳුරුවූ; සොවණ්ණවණ්ණ, ස්වර්ණවර්ණයක් හා සමානවූ; තනුවණ්ණ, ශරීරවර්ණයෙන්; විරාජිතාය, බබලන්නාවූ; සීලාදි, පඤ්චශීලාදීවූ; නෙක, අනෙකප්‍රකාරවූ; ගුණභූසන, ගුණනමැති අලඞ්කාරයෙන්; භූසිතාය, අලඞ්කෘතවූ; රාජවනිතාය, රාජමහෙසිකාවූ; මායාය, මහාමායාදෙවින්ගේ; කුච්ඡිං, කුක්ෂියට; උපගඤ්ඡි, පැමිණියේයි.

(79) තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ; පටිසන්ධික්ඛණෙ, ප්‍රතිසන්ධික්ෂණයෙහි; අනෙකවිධා, අනෙකප්‍රකාරවූ; අබ්භුතා, ආශ්චර්‍ය්‍යයෝ; ජාතා, පහලවූහ; අථ, ඉක්බිත්තෙන්; අයං, මේ බොධිසත්ත්වතෙම; නරෙහි, මනුෂ්‍යයන්විසින්ද; අමරෙහිච, දෙවියන්විසින්ද; ගහිත, ගන්නාලද; ආරක්ඛො, ආරක්ෂාවන්ඇත්තේ.

(80) මනුඤ්ඤ, මනොඥවූ; රතනම්බුජ, රත්නපද්මයක්හුගේ; කණ්ණිකාය, කෙමියමත්තෙහි; ආසීන, හුන්නාවූ; රම්මා, සිත්කලුවූ; සිඞ්ගීපටිමා ඉව, ජාම්බූනදස්වර්ණප්‍රතිමාවක් මෙන්; සුවණ්ණවණ්ණො, ස්වර්ණවර්ණවූ; දිපදුත්තමින්දො, ද්විපදොත්තමවූ බොධිසත්ත්වතෙම; මාතුගබ්භෙ, මාතෘගර්භයෙහි; පල්ලඞ්කං ආභුඤ්ජිය, පළක්බැඳ.

81 මණිම්හි විප්පසන්නම්හි රත්තසුත්තමි'වා' වුතං
මාතුචිත්තම්බුජං ධීරො බොධයන්තො පදිස්සති.

82 දසමාසාවසානම්හි දෙවී රඤ්ඤො කථෙසි'දං
මය්හං ඤාතිඝරං දෙව ගන්තුමි'ච්ඡාම'හං ඉති.

83 රඤ්ඤා'ථ සමනුඤ්ඤාතා ගච්ඡන්තී කුලම'ත්තනො
මහතා පරිහාරෙන දිබ්බඤ්ජස සමඤ්ජසෙ.

84 සුරභිකුසුමසණ්ඩාලඞ්කතසාලසණ්ඩං
සමදභමරමාලාගීයමානග්ගනාදං
නයනවිහඟසඞ්ඝෙ අව්හයන්තං'ව දිස්වා
විපුලරතිනිවාසං ලුම්බිනීකානනං තං.

---

(81) විප්පසන්නම්හි, විශෙෂයෙන් ප්‍රසන්නවූ; මණිම්හි, මාණික්‍යයෙක්හි; ආවුතං, අවුනලද; රත්තසුත්තං ඉව, රත්පලස්හුයක් මෙන්; ධීරො, ප්‍රාඥවූ (බොධිසත්වතෙම); මාතු, මෑනියන්ගේ; චිත්තම්බුජං, සිත්නමැති පද්මය; බොධයන්තො, ප්‍රබොධකෙරෙමින්; පදිස්සති, පෙණෙන්නේයි.

(82) දසමාසාවසානම්හි, දසමසක් ඇවෑමෙහි; දෙවී, (මහාමායා) දෙවියොම; රඤ්ඤො, (ශුද්ධොදන) රජහට; දෙව, රජ්ජුරුවන්වහන්ස; මය්හං ඤාතිඝරං, මාගේ නෑයන්ගේගෘහයට; අහං, මම; ගන්තුං, යන්නට; ඉච්ඡාමි ඉති, කැමැතිවෙමියි යන; ඉදං, මේ වචනය; කථෙසි, කීවූ.

(83) අථ, ඉක්බිත්තෙන්; රඤ්ඤා, රජහුවිසින්; සමනුඤ්ඤාතා, අනුදන්නාලද; (සා, ඒ මහාමායාදෙවීතොම;) අත්තනො කුලං, තමාගේගෘහයට; මහතාපරිහාරෙන, මහත්වූ පෙරහරින්; දිබ්බඤ්ජස, දිව්‍යමාර්ගයක් හා; සම, සදෘශවූ; අඤ්ජසෙ, මාර්ගයෙහි; ගච්ඡන්තී, යන්නී.

(84) සුරභි, සුවඳඇත්තාවූ; කුසුමසණ්ඩ, පුෂ්පසමූහයෙන්; අලඞ්කත, සැරසුනාවූ; සාලසණ්ඩං, ශාලවෘක්ෂසමූහඇති; සමද, මදසහිතවූ; භමරමාලා, භෘඞ්ගපඞ්ක්තීන් විසින්; ගීයමාන, ගායනාකරණු ලබන්නාවූ; අග්ගනාදං, උතුම්වූනාද ඇති; නයන, නෙත්‍රනමැති; විහඟසඞ්ඝෙ, පක්ෂිසමූහයන්; අව්හයන්තං ඉව, කැඳවන්නාක්වැනිවූ; විපුල, මහත්වූ; රති, ඇල්මට; නිවාසං, වාසස්ථානවූ; තං ලුම්බිනීකානනං, ඒ ලුම්බිනීවනය; දිස්වා, දැක.

85 විපුලතරරතිං සා තම්හි කාතූන රම්මෙ
අමරයුවතිලීලාචාරුලීලාභිරාමා
විකසිතවරසාලස්සෝ'පගන්ත්වාන මූලං
සයම්'තිනමිතෙ'කං සාලසාඛං අගණ්හි.

86 තස්මිං ඛණෙ කම්මජමාලුත'ස්සා
චලිංසු සානීහි පරික්ඛිපිත්වා
දෙවිං ජනො තං අභිපාලයන්තො
තම්හා පටික්කම්ම සුසණ්ඨිතා'ථ.

87 සා චාරුහෙමවලයාදිවිභූසිතෙන
අච්චන්තතම්බනඛරංසිසමුජ්ජලෙන
තූලාතිකොමලසුරත්තකරෙන සාඛං
ඔලම්බ තත්‍ථ මජනෙසි ඨිතා'ව ධීරං.

---

(85) අමරයුවති, දිව්‍යාඞ්ගනාවන්ගේ; ලීලා, ලීලාවක්හාසමානවූ; චාරු, මනොඥවූ; ලීලාභිරාමා, ලීලායෙන් සිත්කලුවූ; සා, ඒ මහාමායාදෙවීතොම; රම්මෙ, සිත්කලුවූ; තම්හි, ඒ ලුම්බිනීවනයෙහි; විපුලතර, මහත්වූ; රතිං, ඇල්මක්; කාතූන, කොට; විකසිත, සුපුෂ්පිතවූ; වර, උතුම්වූ; සාලස්ස, ශාලවෘක්ෂරාජයක්හුගේ; මූලං, සමීපයට; උපගන්ත්වාන, ගොස්; සයං, තොමෝම; අතිනමිත, ඉතා නැමුනාවූ; එකං සාලසාඛං, එක් සල් අත්තක්; අගණ්හි, ගත්තීසි.

(86) තස්මිං ඛණෙ, ඒ ක්ෂණයෙහි; අස්සා, ඒ මහාමායාදෙවීන්ට; කම්මජමාලුතා, කර්මජවාතයෝ; චලිංසු, චලිතවූහ; ජනො, ජන තෙම; තං දෙවිං, ඒ මහාමායාදෙවීන්; සානීහි, තිරයෙන්; පරික්ඛිපිත්වා, පරික්ෂෙපකොට; අභිපාලයන්තො, රකිමින්; තම්හා, ඒ ස්ථානයෙන්; පටික්කම්ම, පහව; සුසණ්ඨිතො, මනාව පිහිටියේසි; අථ, ඉක්බිත්තෙන්.

(87) සා, ඒ මහාමායාදෙවීතොම; චාරු, මනොඥවූ; හෙමවලයාදි, ස්වර්ණවලයාදීන්; විභූසිතෙන, අලඞ්කෘතවූ; අච්චන්ත, අතිශයින්; තම්බ, රත්වූ; නඛරංසි, නඛකිරණයෙන්; සමුජ්ජලෙන, බබලන්නාවූ; තූල, පුළුනටවඩා; අතිකොමල, ඉතා මොලොක්වූ; සුරත්ත, අතිශයින්රත්වූ; කරෙන, හස්තයෙන්; සාඛං, ශාලශාඛාව; ඔලම්බ, එල්බ; තත්‍ථ, ඒ ස්ථානයෙහි; ඨිතාඑව, සිටියාවූ රාජමහෙසිකාතොමෝ; ධීරං, ප්‍රාඥවූ (ඒ මහාබොධිසත්ත්වයන්); අජනෙසි, වැදූ.

88 සොවණ්ණවණ්ණතනුවණ්ණවිරාජමානං
නෙත්තාභිරාමමතුලං අතුලාය ගබ්භා
සම්මා පසාරිතකරඞ්ඝියුගාභිරාමං
පඞ්කෙරුහා කණකහංසමි'වො'තරන්තං.

89 බ්‍රහ්මා මනග්ඝරතිවඩ්ඪනහෙමජාල
මා'දාය තෙන උපගම්ම පටිග්ගහෙත්වා
"සම්මොද දෙවි අය ම'ග්ගතරො සුතො තෙ
ජාතො"ති තාය පුරතො කථයිංසු ඨත්වා.

90 ජායන්ති සෙසමනුජා මලමක්ඛිතඞ්ගා
ජාතො පනෙ'ස පවරො දිපදානමිද්ධෙ
අච්චන්ත සණ්හමලකාසිකවත්ථකම්හි
නික්ඛිත්තනග්ඝතරචාරුමණී'ව සුද්ධො.

---

(88) සොවණ්ණවණ්ණ, ස්වර්ණවර්ණයක්හාසමානවූ; තනුවණ්ණ, ශරීරවර්ණයෙන්; විරාජමානං, බබලන්නාවූ; නෙත්ත, නෙත්‍රයට; අභිරාමං, සිත්කලුවූ; අතුලාය, අසදෘශවූ (ඒ මහාමායාදෙවීන්ගේ); ගබ්භා, ගර්භයෙන්; සම්මා, මනාකොට; පසාරිත, දික්කරණලද; කරඞ්ඝියුග, හස්තපාදයුගලයෙන්; අභිරාමං, සිත්කලුවූ; පඞ්කෙරුහා, පද්මයකින්; ඔතරන්තං, බස්නාවූ; කණකහංසමිව, ස්වර්ණහංස රාජයෙකු වැනිවූ; අතුලං, අසදෘශවූ (ඒ මහාබොධිසත්ත්වයන්).

(89) බ්‍රහ්මා, බ්‍රහ්මයෝ; අනග්ඝ, අතිශයින් අනර්ඝවූ; රතිවඩ්ඪන, ඇලුම්වඩන්නාවූ; හෙමජාලං, රන්දැලක්; ආදාය, ගෙණ; උපගම්ම, සමීපයට එළඹ; තෙන, ඒ රන්දැලින්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; දෙවී, දෙවීන්වහන්ස; සම්මොද, සතුටුවුව මැනව; තෙ, තුබවහන් සේගේ; ජාතො, උපන්නාවූ; අයං සුතො, මේ පුත්‍රතෙම; අග්ගතරො ඉති, අතිශයින් උතුම්වූ පුත්‍රයෙකැයි; තාය, ඒ මහාමායාදෙවීන් ගේ; පුරතො, අභිමුඛයෙහි; ඨත්වා, සිට; කථයිංසු, කීවාහුයි.

(90) සෙසමනුජා, අවශෙෂසත්ත්වයෝ; මලමක්ඛිතඞ්ගා, (මාතෘකුක්ෂිගතවූ) මලයෙන්වැකුනාවූ ශරීරඇතිව; ජායන්ති, උපදනාහ; දිපදානමිද්ධෙ, 'ද්විපදොත්තමවූ; පවරො, උතුම්වූ; එසො පන, මේ බොධිසත්ත්වවනාහි; අච්චන්ත, අතිශයින්; සණ්හ, සියුම්වූ; අමල, නිර්මලවූ; කාසිකවත්ථකම්හි, කාසිවස්ත්‍රයෙක්හි; නික්ඛිත්ත, බහනලද; අනග්ඝතර, අතිශයින් අනර්ඝවූ; චාරු, මනොඥවූ; මණී ඉව, මාණික්‍යයක්මෙන්; සුද්ධො ජාතො, ශුද්ධවඋපන්නේයි.

91 එව'මපි සන්තෙ නභතො'පගන්ත්වා
ද්වෙ වාරිධාරා සුභගස්ස දෙහෙ
ජනෙත්තිදෙහෙ'පි උතුං මනුඤ්ඤං
ගාහාපයුං මඞ්ගලකිච්චතාය.

92 තෙසං කරා රතිකරා අජිනප්පවෙණිං
මා'දාය තෙන උපගම්ම පටිග්ගහෙසුං
දෙවා දුකූලමය චුම්බටකෙන වීරං
තෙසං කරා නරවරා නරසීහරාජං.

93 තෙසං කරා රතිකරො විමලො'ව චන්දො
චක්කඞ්කිතොරුචරණෙහි මහීතලස්මිං
සම්මා පතිට්ඨිය පුරත්ථිමකං දිසං සො
ඔලොකයිත්ථ කමලායතලොචනෙහි.

---

(91) එවමපි සන්තෙ, එසේඇතිකල්හිදු; ද්වෙවාරිධාරා, ජලධාරාවෝදෙදෙනෙක්; නභතො, ආකාශයෙන්; උපගන්ත්වා, අවුත්; සුභගස්ස, සුභලක්ෂණඇත්තාවූ; (තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ); දෙහෙ, ශරීරයෙහිද; ජනෙත්තිදෙහෙපි, මහාමායාදෙවීන්ගේ ශරීරයෙහිද; මනුඤ්ඤං, මනොඥවූ; උතුං, (සීතල) ඍතුව; මඞ්ගලකිච්චතාය, මඞ්ගලකෘත්‍යය පිණිස; ගාහාපයුං, ගැන්වූවාහුයි.

(92) රතිකරා, ඇලුම්කරන්නාවූ; තෙසං කරා, ඒ බ්‍රහ්මයන්ගේ හස්තයෙන්; දෙවා, දෙවියෝ; අජිනප්පවෙණිං, අඳුන්දිවිසමක්; ආදාය, ගෙණ; උපගම්ම, සමීපයටඑළඹ; තෙන, ඒ අඳුන්දිවිසමින්; පටිග්ගහෙසුං, පිළිගත්හ; තෙසං කරා, ඒ දෙවියන්ගේහස්තයෙන්; නරවරා, උතුම්මනුෂ්‍යයෝ; නරසීහරාජං, රාජශ්‍රෙෂ්ඨවූ; වීරං, වීරගුණයෙන් යුක්තවූ (ඒමහාබොධිසත්ත්වයන්); දුකූලමයචුම්බටකෙන, දුහුල්මයසුඹුළකින්; පටිග්ගහෙසුං; පිළිගත්තාහුයි.

(93) රතිකරො, ඇලුම්කරන්නාවූ; විමලො, නිර්මලවූ; චන්දො ඉව, චන්ද්‍රයාවැනිවූ (ඒ මහාබොධිසත්ත්වතෙම); තෙසං කරා, ඒ මනුෂ්‍යයන්ගේ හස්තයෙන් (ගිලිහී); චක්කඞ්කිත, චක්‍රලක්ෂණයෙන් චින්නිතවූ; උරු, මහත්වූ; චරණෙහි, පාදවන්දයෙන්; මහීතලස්මිං, පෘථිවිතලයෙහි; සම්මා, මනාකොට; පතිට්ඨිය, පිහිටා; පුරත්ථිමකං දිසං, පූර්වදිග; කමල, පද්මපත්‍රයන්හා සමානවූ; ආයත, දික්වූ; ලොචනෙහි, නෙත්‍රයෙන්; සො, ඒ බොධිසත්ත්වතෙම; ඔලොකයිත්ථ, බැලී.

94 එකග්ගතා නෙකසතානි චක්ක
වාළාන'හෙසුං සනරාමරා'ථ
ධීරං සුගන්ධප්පභුතීහි තෙසු
සම්පූජයන්තා ඉදම'බ්‍රවිංසු.

95 නත්ථෙ'ත්ථ තුම්හෙහි සමො සුධීස
එකො පුමා'ප'ග්ගතරො කුතො'ති
එවං දිසා ලොකිය ලොකනාථො
නපෙක්ඛමානො සදිස'මපි එකං.

96 උත්තරා'භිමුඛො සත්තපදං ගන්ත්වා කථෙසි'දං
"අග්ගො'හමස්මි ලොකස්ස ජෙට්ඨො සෙට්ඨො" තිආදිකං.

97 අනඤ්ඤසාධාරණනාදමු'ත්තමං
සුරාසුරබ්‍රහ්මනරින්දපූජිතං
නරින්ද'මාදාය ගතො මහාජනො
සුසජ්ජිතං තං කපිලව්හයං පුරං.

---

(94) අථ, ඉක්බිත්තෙන්; නෙකසතානි, නොයෙක් සියගණන්; චක්කවාළානි, චක්‍රවාටයෝ; එකග්ගතා අහෙසුං, එකාග්‍රගතවූහ; සනරාමරා, දෙවිමිනිසුන් සහිතවූ (ලොකවාසී සත්ත්වයෝ); ධීරං, ප්‍රාඥවූ (ඒ මහාබොධිසත්ත්වයන්); සුගන්ධප්පභුතීහි, සුවඳමල්සුවඳසුණු ආදියෙන්; තෙසු, ඒ ස්ථානයෙහිදී; සම්පූජයන්තා, පුදමින්; ඉදං, මේ වචනය; අබ්‍රවිංසු, කිවාහුයි.

(95) සුධීස, සුන්දරවූ ප්‍රඥාඇති (බොධිසත්ත්වයන්වහන්ස); එත්ථ, මේ ලොකයෙහි; තුම්හෙහි, තුඹවහන්සේ හා; සමො, සදෘශවූ; එකොපුමාපි, එකද්පුද්ගලයක්හුත්; නත්ථි, නැත; අග්ගතරො, (තුඹවහන්සේටවඩා) අතිශයින් අග්‍රවූ (එකද්පුද්ගලයෙක්); කුතොඉති, කොයින්දැයි; (එවං වදිංසු, මෙසේකීහ); එවං, මෙසේ (යථොක්ත ක්‍රමයෙන්); ලොකනාථො, ලොකස්වාමිවූ; (සො, ඒබොධිසත්ත්වතෙම); දිසාලොකිය, දිශාවිලොකනයකොට; සදිසමපි එකං, තමන්හාසදෘශවූ එකද පුද්ගලයකුත්; නපෙක්ඛමානො, නොදක්නේ.

(96) උත්තරාභිමුඛො, උත්තරදිසාභිමුඛව; සත්තපදං ගන්ත්වා, සත්පියවරක්ගොස්; අහං, මම; ලොකස්ස, ලොකයට; අග්ගො අස්මි, අග්‍රයෙමි; අහං, මම; ලොකස්ස, ලොකයට; ජෙට්ඨො අස්මි, ජ්‍යෙෂ්ඨයෙමි; අහං, මම; ලොකස්ස, ලොකයට; සෙට්ඨො අස්මිඉති, ශ්‍රෙෂ්ඨයෙමි යන; ආදිකං, (මේ) ආදිවූ; ඉදං, මේවචනය; කථෙසි, කීයේයි.

(97) උත්තමං, උතුම්වූ; අනඤ්ඤසාධාරණනාදං, අන්‍යසාධාරණ නොවන්නාවූ සිංහනාදඇති; සුර, දෙවියන්විසින්ද; අසුර, අසුරයන් විසින්ද; බ්‍රහ්ම, බ්‍රහ්මයන් විසින්ද; නරින්ද, නරෙන්ද්‍රයන් විසින්ද; පූ

98 භාරාතිභාරනගපාදපමෙරුරාජං
සබ්බ'මපි සාගරජලං වහිතුං සමත්ථා
ජාතක්ඛණේ'පි ගුණභාරම'සය්හමානා
සඞ්කම්පයී'ව පඨවී පවරස්ස තස්ස.

99 රමිංසු සොණා හරිණේහි සද්ධිං
කාකා උලූකේහි මුදග්ගුදග්ගා
සුපණ්ණරාජූහි මහොරගා ච
මජ්ජාරසඞ්ඝා'පි ච උන්දුරේහි.

100 මිගා මිගින්දේහි සමාගමිංසු
පුත්තෙහි මාතාපිතරො යථේ'ව
නාවා විදේස'මපි ගතා සදේසං
ගතා'ව කණ්ඩං සරභඞ්ගසත්ථු.

---

ජිතං, පුදනලද්දවූ; නරින්දං, නරේන්ද්‍රවූ (බොධිසත්ත්වයන්); ආදාය, ගෙණ; මහාජනො, මහාජනතෙම; සුසජ්ජිතං, මනාකොට සරහන ලද; තං කපිලවහයං පුරං, ඒ කිඹුල්වත්පුරයට; ගතො, ගියේයි.

(98) භාරාතිභාර, භාරයෙන් ඉතාබරවූ; නග, පර්වතයන්ද; පාදප, වෘක්ෂයන්ද; මෙරුරාජං, මහාමෙරුපර්වතරාජයාද; සබ්බම්පිසාගරජලං, සියලුම සාගරජලයද; වහිතුං, වහනයකරන්නට; සමත්ථාපි, සමර්ථවූත්; පඨවී, පෘථිවිතොමෝ; පවරස්ස, උතුම්වූ; තස්ස, ඒ බොධිසත්ත්වයන්ගේ; ජාතක්ඛණේ, උපන්නාවූක්ෂණයෙහි; ගුණභාරං, ගුණ නමැතිභාරය; අසය්හමානාඉව, සහනයකොට ගතනොහෙන් නියායමෙන්; සඞ්කම්පයි, විශේෂයෙන් කම්පාකෙළේයි.

(99) සොණා, සුණඛයෝ; හරිණේහි සද්ධිං, මුවන්හාසමග; රමිංසු, රමණයකළාහ; කාකාච, කපුටුවෝද; උලූකෙහි සද්ධිං, බකමූණන්හාසමග; උදග්ගුදග්ගා, ඔද වැඩියාවූසිත්ඇතිව; රමිංසු, රමණයකළාහ; මහොරගාච, මහත්වූ සර්පරාජයෝද; සුපණ්ණරාජූහි සද්ධිං, ගරුඩරාජයන්හා සමග; රමිංසු, රමණයකළාහ; මජ්ජාරසඞ්ඝාපිච, බළල් සමූහයෝද; උන්දුරේහි සද්ධිං, මීයන්හාසමග; රමිංසු, රමණයකළාහුයි.

(100) පුත්තෙහි, පුත්‍රයන් හා; මාතාපිතරො, දෙමවුපියෝ; යථේව, යම්සේද; (එපරිද්දෙන්ම) මිගා, මෘගයෝ; මිගින්දෙහි සද්ධිං, මෘගෙන්ද්‍රයන් හා සමග; සමාගමිංසු, එක්වූහ; සරභඞ්ගසත්ථු, සරභඞ්ගශාස්තෘන්ගේ; කණ්ඩංඉව, (ගෘහගතවූ) හියමෙන්; විදෙසං ගතා, විදෙශයට නියාවූ (හෙවත්) පරදෙශයටගියාවූ; නාවාපි, නෞකාවෝත්; සදෙසං ගතා, ස්වදෙශයටගියානුයි.

101 නානාවිරාගුජ්ජලපඞ්කජෙහි
විභූසිතො සන්තතරඞ්ගමාලො
මහණ්ණවො ආසි තහිං ජල'මපි
අච්චන්තසාතත්තමු'පාගමාසි.

102 සුඵුල්ලඔලම්බකපඞ්කජෙහි
සමාකුලත්තං ගගනං අගඤ්ඡි
ජහිංසු පක්ඛී ගමනං නභම්හි
ඨිතා'ව සිඛ්ඛු'පි අසඥමානා.

103 අකාලමෙඝප්පියසඞ්ගමෙන
මහීවධූ සොම්මතමා අහොසි
මරූහි වස්සාපිතනෙකපුප්ඵ
විභූසිතෙනා'තිවිභූසිතාව.

104 සුඵුල්ලමාලාභරණාභිරාමා
ලතඞ්ගනා'ලිඞ්ගිතපාදපින්ද
සුගන්ධකිඤ්ජක්ඛවරම්බරෙහි
දිසඞ්ගනායො අතිසොභසිංසු.

---

(101) මහණ්ණවො, මහත්වූසාගරයතෙම්; නානාවිරාග, නොයෙක්පැහැයෙන්; උජ්ජල, බබලන්නාවූ; පඞ්කජෙහි, පද්මයෙන්; විභූසිතො ආසී, අලඞ්කෘතවූයේදවිය; සන්තතරඞ්ගමාලො ආසි, සන්නුන්නාවූරලපතර ඇතිවූයේදවිය; තහිං, ඒ සාගරයෙහි; ජලම්පි, ජලයද; අච්චන්ත, අතිශයින්; සාතත්තං, මධුරබවට; උපාගමාසි, පැමිණියේයි.

(102) ගගනං, ආකාශයතෙම; සුඵුල්ල, මනාවපිපියාවූ; ඔලම්බක, එල්ලෙන්නාවූ; පඞ්කජෙහි, පද්මයෙන්; සමාකුලත්තං, ගැවසීගත්බවට; අගඤ්ඡි, පැමිණියේය; පක්ඛී, පක්ෂීහු; නභම්හි, ආකාශයෙහි; ගමනං, ගමනය; ජහිංසු, හළහ; සිඛුපි, ගහාවෝද; අසඥමානා, යටගංබලානොනොස්; ඨිතාඑව, සිටියාහුමැයි.

(103) අකාලමෙඝ, අකාලමෙඝනමැති; පියසඞ්ගමෙන, ප්‍රියවූ පුරුෂයන් හා එක්වීමෙන්; මහීවධූ, මහීකාන්තාතොම; සොම්මතමා අහොසි, අතිශයින් සෞම්‍යවූව; මරූහි, දෙවියන්විසින්; වස්සාපිත, වස්වනලද; අනෙකපුප්ඵවිභූසිතෙන, නොයෙක් පුෂ්ප නමැති අලඞ්කාරයෙන්; අතිවිභූසිතාව, අතිශයින් අලඞ්කෘතවූ.

(104) සුඵුල්ල, විකසිතවූ; මාලාභරණ, මල්නමැතිඅලඞ්කාරයෙන්; අභිරාමා, සිත්කලුවූ; ලතඞ්ගනා, ලියඟනන්විසින්; ආලිඞ්ගින, වැලඳනාලද; පාදපින්ද, වෘක්ෂරාජයෝ; සුගන්ධ, සුවඳැත්තාවූ; කිඤ්ජක්ඛ වරම්බරෙහි, රේණුනමැති උතුම්වූ වස්ත්‍රයෙන්; දිසඞ්ගනායො, දික්නමැතිකාන්තාවන්; අතිසොභසිංසු, විශෙෂයෙන් බැබලවූ.

105 සුගන්ධධූපෙහි නභං අසෙසං
පවාසිතං රම්මතරං අහොසි
සුරාසුරින්ද ජනවෙසධාරී
සඞ්ගීතියුත්තා විචරිංසු සබ්බෙ.

106 පියංවදා සබ්බජනා අහෙසුං
දිසා අසෙසා'පි ච විප්පසන්නා
ගජා'තිගජ්ජිංසු නදිංසු සීහා
හෙසාරවො චා'සි තුරඞ්ගමානං.

107 සවෙණුවීණා සුරදුන්දුභී නභෙ
සකං සකං චාරුසරම්පමොචයුං
සපබ්බතින්දපුථුලොකධාතුයා
උළාරඔභාසචයො මනොරමො.

108 මනුඤ්ඤගන්ධො මුදුසීතලානිලො
සුඛප්පදං වායි අසෙසජන්තුනො
අනෙකරොගාදුපපීළිතඞ්ගිනො
තතො පමුත්තා සුඛිනො සියුං ජනා.

---

(105) සුගන්ධධූපෙහි, සුවඳදුමින්; පවාසිතං, සුවඳකරණලද්දාවූ; අසෙසං නභං, සියලුආකාශය; රම්මතරං අහොසි, අතිශයින් සිත් කලුවිය; ජනවෙසධාරී, සැනවෙස්ගත්තාවූ; සබ්බෙසුරාසුරින්ද, සියලු සුරාසුරශ්‍රෙෂ්ඨයෝ; සඞ්ගීතියුත්තා, මනාවූගායනාවෙන් යුක්තව; විචරිංසු, ඇවිද්දහුයි.

(106) සබ්බජනා, සියලුජනයෝ; පියංවදා අහෙසුං, ප්‍රියවචනකිවාහුය; අසෙසා දිසාපිච, සියලුදිශාවෝද; විප්පසන්නා අහෙසුං, විශෙෂයෙන් ප්‍රසන්නවූහ; ගජා, හස්තීහු; අතිගජ්ජිංසු, අතිශයින්ගජිනාකළාහ; සීහා, සිංහයෝ; නදිංසු, නාදපැවැත්වූහ; තුරඞ්ගමානං, අශ්වයන්ගේ; හෙසාරවොච, හෙසාරවධ්වනියද; ආසී, වී.

(107) සවෙණුවීණා, වෙණුවීණාසහිතවූ; සුරදුන්දුභී, දිව්‍යසඞ්ගීතීහු; නභෙ, ආකාශයෙහි; සකංසකං, ස්වකීය ස්වකීයවූ; චාරු, මනොඥවූ; සරං, නාද; පමොචයුං, පැවැත්වූහ; සපබ්බතින්ද, පර්වතෙන්ද්‍රසහිතවූ; පුථු, මහත්වූ; ලොකධාතුයා, සක්වළෙහි; මනොරමො, සිත් කලුවූ; ඔභාසචයො, ආලොකසමූහයා; (අහොසි, වී).

(108) මනුඤ්ඤ, මනොඥවූ; ගන්ධො, සුවඳැත්තාවූ; මුදු, මොළොක්වූ; සීතල, සිහිල්වූ; අනිලො, මාරුතයතෙම; අසෙසජන්තුනො, සියලුසත්ත්වයන්ට; සුඛප්පදං, පිහිටව; වායි, හැමිය; අනෙකරොගාදි, අනෙකප්‍රකාරරොගාදීන්; උපපීළිතඞ්ගිනො, පෙළෙනලද ශරීර ඇතිවූ; ජනා, ජනයෝ; තතො, ඒ රොගාදීන්; පමුත්තා, මිදුනාහු; සුඛිනො සියුං, සුවපත්වූවාහුයි

109 විජම්භමානාමිතවාළවීජනිප්ප
භාභිරාමං භුවනං අහොසි
මහිංහි* හෙත්වා චු'දකානි සන්දයුං
ගමිංසු ඛුජ්ජා උජුගත්තතං ජනා.

110 අන්ධා පඞ්ගුලනච්චානි ලීලොපෙතානි පෙක්ඛයුං
සුණිංසු බධිරා මූග ගීතියො'පි මනොරමා.

111 සීතලත්තමු'පාගඤ්ඡි අවීචග්ගි'පි තාවදෙ
මොදිංසු ජලජා තස්මිං ජනතාවො පහසිංසු ච.

112 ඛුප්පිපාසාභිභූතානං පෙතානං ආසි භොජනං
ලොකන්තරෙ'පි ආලොකො අන්ධකාරනිරන්තරෙ.

113 අතිරෙකතරා තාරාවලී චන්දදිවාකරා
විරොචිංසු නභෙ භූමිගතානි රතනානි ච.

---

(109) භුවනං, ලොකයතෙම; විජම්භමාන, විජෘම්භමාණවූ; අමිත, ප්‍රමාණාතික්‍රාන්තවූ; වාළවීජනිප්පභා, චාමරප්‍රභායෙන්; අභිරාමං අහොසි, සිත්කලුවිය; උදකානිච, ජලස්කන්ධයෝද; මහිංහි, පෘථිවිය; හෙත්වා, පළාගෙණ; සන්දයුං, පැවැත්තාහුය; ඛුජ්ජා ජනා, කුදුවූ සත්ත්වයෝද; උජුගත්තතං, ඍජුවූගාත්‍ර ස්වභාව ඇතිව; ගමිංසු, ඇවිද්දාහුයි.

(110) අන්ධා, අන්ධසත්ත්වයෝ; ලීලොපෙතානි, ලීලොපෙතවූ; පඞ්ගුලනච්චානි, පිළුන්ගේ නෘත්‍යයන්; පෙක්ඛයුං, බැලූහ; බධිරා, බිහිරිවූ සත්ත්වයෝ; මනොරමා, සිත්කලුවූ; මූගගීතියොපි, ගොළුවන්ගේ ගායනාවන්ද; සුණිංසු, ඇසුවාහුයි.

(111) තාවදෙ, එකෙණෙහි (හෙවත් ඒ බොධිසත්ත්වයන් උපන්නාවූ ක්ෂණයෙහි); අවීචග්ගිපි, අවීචිමහානරකයෙහි වහ්නියද; සීතලත්තං, සිහිල්බවට; උපාගඤ්ඡි, පැමිණියේය; තස්මිං, ඒ ක්ෂණයෙහි; ජලජා, මත්ස්‍යයෝ; මොදිංසු, සතුටුවූවාහු; ජනතාවොච, සත්ත්වයෝද; පහසිංසු, පහන්වූවාහුයි.

(112) ඛුප්පිපාසාභිභූතානං, ක්ෂුධාපිපාසායෙන් මඩනාලද; පෙතානං, ප්‍රෙතයන්ට; භොජනං, භොජනය; ආසි, වීය; අන්ධකාරනිරන්තරෙ, අන්ධකාරයෙන් අතරක් නැත්තාවූ; ලොකන්තරෙපි, ලොකාන්තරිකමහානරකයෙහිද; ආලොකො, ආලොකය; ආසි, වී.

(113) නභෙ, ආකාශයෙහි; තාරාවලී, තාරකාපඞ්ක්තීහුද; චන්දදිවාකරා, චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනද; අතිරෙකතරා, අධිකතරව; විරොචිංසු, බැබලුනාහුය; භූමිගතානි, භූමිගතවූ; රතනානිච, රත්නයෝද; විරොචිංසු, බැබලුනාහුයි.

---

* මහීහි, සබ්බත්ථ.

114 මණීතලාදයො භෙත්වා නික්ඛම්ම උපරූපරි
විචිත්තපඤ්චවණ්ණා'සුං සුඵුල්ලවිපුලම්බුජා.

115 දුන්දුභාදී ච'ලඞ්කාරා අවාදිතඅඝට්ටිතා
අච්චන්තමධුරං නාදං පමුඤ්චිංසු මණීතලෙ.

116 බද්ධා සඞ්ඛලිකාදීහි මුඤ්චිංසු මනුජා තතො
භුවනෙ භවනද්වාරකවාටා විවටා සයං.

117 වෙළුක්ඛෙපාදයො වා'පි පවත්තෙන්තා පමොදිතා
කීළිංසු දෙවසඞ්ඝා තෙ තාවතිංසාලයෙ තදා.

118 "පුරෙ කපිලවත්ථුම්හි ජාතො සුද්ධොදනත්‍රජො
නිසජ්ජ බොධිමණ්ඩෙ'ති අයං බුද්ධො භවිස්සති."

119 ඉද්ධිමන්තො මහාපඤ්ඤො කාලදෙවලතාපසො
සුද්ධොදනනරින්දස්ස ධීමතො සො කුලූපගො.

---

(114) විචිත්ත, විසිතුරුවූ; පඤ්චවණ්ණා, පස්වණක්පෑ ඇති; සුඵුල්ල, මනාව විකසිතවූ; විපුල, මහත්වූ; අම්බුජා, පද්මයෝ; මණීතලාදයො, පෘථිවීතලාදීන්; භෙත්වා, පළාගෙණ; උපරූපරි, මතුමත්තෙහි; නික්ඛම්ම, නික්ම; ආසුං, වූවාහුයි.

(115) දුන්දුභාදීච, දුන්දුභිආදී (තූර්‍ය්‍යනාදයෝද); අලඞ්කාරාච, ආභරණයෝද; අවාදිතඅඝට්ටිතා, අවාදිත අඝට්ටිතව; අච්චන්ත, අතිශයින්; මධුරං නාදං, මියුරු නාදය; මණීතලෙ, පෘථිවීතලයෙහි; පමුඤ්චිංසු, පැවැත්තුවාහුයි.

(116) සඞ්ඛලිකාදීහි, දම්ආදීන්; බද්ධා, බඳනාලද; මනුජා, සත්ත්වයෝ; තතො, ඒ බන්ධනාදීන්; මුඤ්චිංසු, මිදුනාහ; භුවනෙ, ලොකයෙහි; භවනද්වාර, ගෘහද්වාරයෙන්; කවාටා, කවාටයෝ; සයං, තුමූම; විවටා අහෙසුං, විවෘතවූවාහුයි.

(117–118) තදා, එසමයෙහි; වෙළුක්ඛෙපාදයොවාපි, වෙළුක්ඛෙපාදිනුදු; පවත්තෙන්තා, පවත්වමින්; තාවතිංසාලයෙ, තව්තිසාදිව්‍යලොකයෙහි; තෙ දෙවසඞ්ඝා, ඒ දිව්‍යසමූහයෝ; කපිලවත්ථුම්හි පුරෙ, කිඹුල්වත්පුරයෙහි; සුද්ධොනත්‍රජො, ශුද්ධොදනමහරජහුගේ පුත්‍රයෙක්; ජාතො, උපන; අයං, මේ තෙම; බොධිමණ්ඩෙ, බෝමැඩ; නිසජ්ජ, හිඳ; බුද්ධො භවිස්සතීති, බුදුවන්නේයයි; පමොදිතා, සතුටුසිත් ඇතිව; කීළිංසු, කෙළියාහුයි.

(119) ධීමතො, ප්‍රාඥවූ; සුද්ධොදනනරින්දස්ස, ශුද්ධොදනමහරජහට; කුලූපගො, කුලූපගවූ; ඉද්ධිමන්තො, ඍද්ධිමත්වූ; මහාපඤ්ඤො, මහත්වූ ප්‍රඥා ඇති; සො කාලදෙවල තාපසො, ඒ කාලදෙවලනම් ඍෂිතෙම.

120 භොජනස්සාවසානම්හි තාවතිංසාලයං ගතො
ගන්ත්වා දිවාවිහාරාය නිසින්නො භවනෙ තහිං.

121 ඡනවෙසං ගහෙත්වාන කීළන්තෙ තෙ උදික්ඛිය
සන්තොසකාරණං පුච්ඡි තෙසං තෙ'පි ත'මබ්‍රවුං.

122 සුත්වා තං තත්තතො තම්හා පීතියො'දග්ගමානසො
තාවදෙව'පගන්ත්වාන සුද්ධොදනනිවෙසනං.

123 පවිසිත්වා සුපඤ්ඤත්තෙ නිසින්නො ආසනෙ ඉසි
"ජාතො කිර මහාරාජ පුත්තො තෙ නුත්තරො සුධී.

124 දට්ඨු'මිච්ඡාම'හං තං''ති ආහ රාජා අලඞ්කතං
ආණාපෙත්වා කුමාරං තං වන්දාපෙතු'මුපාගමි.

---

(120) භොජනස්සාවසානම්හි, භොජනාවසානයෙහි; තාවතිංසාලයං, තවුතිසා දිව්‍යලොකයට; ගතො, ගියේය; ගන්ත්වා, ගොස්; තහිං, ඒ දිව්‍යලොකයෙහි; භවනෙ, (දෙවශුන්‍යවූ) විමානයෙක්හි; දිවාවිහාරාය, දිවාවිහරණය පිණිස; නිසින්නො, හුන්නේයි.

(121) ඡනවෙසං ගහෙත්වාන, සැනවෙස් ගෙණ; කීළන්තෙ, කෙළනාවූ; තෙ, ඒ දෙවියන්; උදික්ඛිය, බලා; තෙසං, ඒ දෙවියන්ගේ; සන්තොසකාරණං, සතුටුකාරණය; පුච්ඡි, විචාළේය; තෙපි, ඒ දෙවියෝද; තං, ඒ සතුටුකාරණය; අබ්‍රවුං, කීවාහුයි.

(122) තං, ඒ සතුටුකාරණය: තත්තතො, තත්වූපරිද්දෙන්; සුත්වා, අසා; පීතියා, ප්‍රීතීන්; උදග්ගමානසො, ඔදවැඩියාවූ සිත් ඇත්තේ; තම්හා, ඒ දිව්‍යලොකයෙන්; තාවදෙව, එකෙණෙහිම; සුද්ධොදන නිවෙසනං, ශුද්ධොදනරජහුගේ රාජමන්දිරයට; උපගන්ත්වාන, අවුත්.

(123) පවිසිත්වා, (රාජමන්දිරයට) වැද; සුපඤ්ඤත්තෙ, මනාකොට පනවනලද; ආසනෙ, ආසනමස්තකයෙහි; නිසින්නො ඉසි, උන්නාවූ ඍෂිතෙම; මහාරාජ, මහරජ; තෙ, තොපගේ; අනුත්තරො, නිරුත්තරවූ; සුධී, සුන්දරවූ ප්‍රඥා ඇත්ත වූ; පුත්තො, පුත්‍රයෙක්; ජාතොකිර, උපන්ල.

(124) අහං, මම; තං, ඒ කුමාරයා; දට්ඨුං, දක්නට; ඉච්ඡාමි ඉති, කැමැත්තෙමියි; ආහ, කීය; රාජා, රජතෙම; අලඞ්කතං, සරහනලද; තං කුමාරං, ඒ කුමරයා; ආණාපෙත්වා, ගෙන්වා; වන්දාපෙතුං, වන්දවනපිණිස; උපාගමි, ළන්කෙළේයි.

125 කුමාරභූතස්ස'පි තාවදෙව ගුණානුභාවෙන මනොරමානි
පාදාරවින්දා පරිවත්තිය'ග්ගා පතිට්ඨිතා මුද්ධනි තාපසස්ස.

126 තෙනත්තභාවෙන නරුත්තමස්ස
න වන්දිතබ්බො තිභවෙ'පි කොචි
තිලොකනාථස්ස සචෙ හි සීසං
තපස්සිනො පාදතලෙ ඨපෙය්‍යුං.

127 ඵාලෙය්‍යමුද්ධා බලු තාපසස්ස පග්ගය්හ සො අඤ්ජලිමුත්තමස්ස
අට්ඨාසි ධීරස්ස ගුණණ්ණවස්ස නාසෙතු'මත්තාන'මයුත්තකන්ති.

128 දිස්වාන තං අච්ඡරියං නරින්දො දෙවාතිදෙවස්ස සකත්‍රජස්ස
පාදාරවින්දාන'භිවන්දි තුට්ඨො විචිත්තචක්කඞ්කිතකොමලානි.

---

(125) කුමාරභූතස්සපි, කුමාරවූද; තස්ස, ඒ මහාබෝධිසත්ත්වයන්ගේ; ගුණානුභාවෙන, ගුණමහිමයෙන්; තාවදෙව, එකෙණෙහි; මනොරමානි, සිත්කලුවූ; අග්ගා, උතුම්වූ; පාදාරවින්දා, පාදනමැති පද්මයෝ; පරිවත්තිය, පෙරළී; තාපසස්ස, (ඒ කාලදෙවල) තාපසයන්ගේ; මුද්ධනි, උත්තමාඞ්ගයෙහි; පතිට්ඨිතා, පිහිටියාහුයි.

(126) තෙනත්තභාවෙන, ඒ ආත්මභාවයෙන්; නරුත්තමස්ස, නරෝත්තමවූ (ඒ බෝධිසත්ත්වයන් විසින්); තිභවෙපි, භවත්‍රයෙහිම; වන්දිතබ්බො, වඳුනීයවූ; කොචින, කිසි පුද්ගලයෙක් නම් නැත්තේය; හි, එසේමැයි; තිලොකනාථස්ස, ත්‍රෛලොක්‍යස්වාමිවූ (ඒ මහාබෝධිසත්ත්වයන්ගේ); සීසං, හිස; තපස්සිනො, (කාලදෙවලනම්) තපස්වීන්ගේ; පාදතලෙ, පාදතලයෙහි; සචෙ ඨපෙය්‍යුං, ඉදින් තැබුවාහුවිනම්.

(127) බලු, එකාන්තයෙන්; තාපසස්ස, (ඒ කාලදෙවලනම්) තාපසයන්ගේ; මුද්ධා, මස්තකයතෙම; ඵාලෙය්‍ය, පැළීයන්නේය; (එහෙයින්) සො, ඒ තාපසතෙම; අත්තානං, තමා; නාසෙතුං, නැසීම; අයුත්තකන්ති, නුසුදුසුයයි; ධීරස්ස, ප්‍රාඥවූ; ගුණණ්ණවස්ස, ගුණාර්ණවවූ; උත්තමස්ස, උතුම්වූ (ඒ බෝධිසත්ත්වයන්ට); අඤ්ජලිංපග්ගය්හ, දෙහොත් මුදුනෙහි බැඳ; අට්ඨාසි, සිටියේයි.

(128) නරින්දො, නරේන්ද්‍රවූ ( ශුද්ධොදන මහ රජතෙම ); දෙවාතිදෙවස්ස, දෙවාතිදෙවවූ; සකත්‍රජස්ස, ස්වකීයවූ පුත්‍රයාගේ; තං අච්ඡරියං, ඒ ආශ්චර්‍ය්‍යය; දිස්වාන, දැක; තුට්ඨො, සතුටුසිත් ඇත්තේ; විචිත්ත, විසිතුරුවූ; චක්කඞ්කිත, චක්‍රලක්ෂණයෙන් විහිතවූ; කොමලානි, කොමලවූ; පාදාරවින්දානි, පාදනමැති පද්මයන්; අභිවන්දි, වැන්දේයි.

129 යදා'සි රඤ්ඤො පුථුවප්පමඞ්ගලං තදා පුරං දෙවපුරං'ව සජ්ජිතං
විභූසිතා තා ජනතා මනොරමා සමාගතා තස්ස නිකෙතමුත්තමං.

130 විභූසිතඞ්ගා ජනතාහි තාහි සො පුරක්ඛතො භූසනභූසිතත්‍රජං
තමා'දයිත්වා'තුලවප්පමඞ්ගලං සුරින්දලීලාය ගතො නරිස්සරො.

131 නානාවිරාගුජ්ජලචාරුසානි පරික්ඛිතෙකම්හි ච ජම්බුමූලෙ
සයාපයිත්වා බහිමඞ්ගලං තං උදික්ඛිතුං ධාතිගණා ගමිංසු.

132 සුවණ්ණතාරාදිවිරාජමානවිතානජොතුජ්ජලජම්බුමූලෙ
නිසජ්ජ ධීරො සයනෙ මනුඤ්ඤෙ ඣානං සමාපජ්ජි කතාවකාසො.

133 සුවණ්ණබිම්බං විය තං නිසින්නං ඡායං ච තස්සා ඨිතමෙ'ව දිස්වා
තමබ්‍රවී ධාතිජනො'පගන්ත්වා "පුත්තස්ස තෙ අබ්භුතමී'දිසන්ති."

---

(129) යදා, යම් කාලෙක්හි; රඤ්ඤො, (ශුද්ධොදනමහ) රජහුගේ; පුථු, මහත්වූ; වප්පමඞ්ගලං, වප්මඟුලෙක්; ආසි, වීද; තදා, එසමයෙහි; පුරං, (කිඹුල්වත්) පුරය; දෙවපුරං ඉව, දිව්‍යපුරයක් මෙන්; සජ්ජිතං, සරහනලද; විභූසිතා, අලඞ්කෘතවූ; මනොරමා, සිත්කලුවූ; තා ජනතා, ඒ ජනසමූහතොම; තස්ස, ඒ ශුද්ධොදනමහරජහුගේ; උත්තමං නිකෙතං, උතුම්වූ රාජමන්දිරයට; සමාගතා, රැස්වූ.

(130) විභූසිත, සරහනලද; අඞ්ගා, ශරීර ඇති; තාහි ජනතාහි, ඒ ජනසමූහයා විසින්; පුරක්ඛතො, පිරිවරණලද; සො නරිස්සරො, ඒ නරේශ්වරවූ (ශුද්ධොදනමහරජතෙම); භූසන භූසිතං, අලඞ්කාරයෙන් අලඞ්කෘතවූ; තං අත්‍රජං, ඒ පුත්‍රයා; ආදයිත්වා, ගෙණ; අතුලවප්පමඞ්ගලං, අසදෘශවූ වප්මඟුලට; සුරින්දලීලාය, ශක්‍රදෙවෙන්ද්‍රලීලායෙන්; ගතො, ගියේයි.

(131) නානාවිරාග, නොයෙක් පැහැයෙන්; උජ්ජල, බබලන්නාවූ; චාරු, මනොඥවූ; සානි, තිරයෙකින්; පරික්ඛිත, පරික්ෂෙප කරණලද; එකම්හි ජම්බුමූලෙ ච, එක් ජම්බුවෘක්ෂමූලයෙක්හිද; තං, ඒ බොධිසත්ත්වයන්; සයාපයිත්වා, හොවා; බහිමඞ්ගලං, පිටතමඟුල්; උදික්ඛිතුං, බලන පිණිස; ධාතිගණා, ධාත්‍රීසමූහයෝ, (හෙවත් කිරිමවුසමූහයෝ); ගමිංසු, ගියාහුයි.

(132) සුවණ්ණතාරාදි, රන්තරු ආදීන්; විරාජමාන, බබලන්නාවූ; විතානජොති, විතානරශ්මින්; උජ්ජල, දිලියෙන්නාවූ; ජම්බුමූලෙ, ජම්බුවෘක්ෂමූලයෙහි; ධීරො, ප්‍රාඥවූ (ඒ බොධිසත්ත්වතෙම); මනුඤ්ඤෙ, මනොඥවූ; සයනෙ, ශ්‍රියහන්මස්තකයෙහි; නිසජ්ජ, හිඳ; කතාවකාසො, කරණලද අවකාශ ඇත්තේ; ඣානං සමාපජ්ජි, ධ්‍යානයට සමවන්නේයි.

(133) සුවණ්ණබිම්බං විය, ස්වර්ණප්‍රතිමාවක් මෙන්; නිසින්නං, හුන්නාවූ; තං, ඒ බොධිසත්ත්වයන්ද; තස්සා, ඒ ජම්බුවෘක්ෂයාගේ; ඨිතං

134 විසුද්ධචන්දානනභාසුරස්ස සුත්වාන තං පඞ්කජලොචනස්ස
සචන්දනං මෙ දුතිය'න්ති වත්වා පුත්තස්ස පාදෙ සිරසා'භිවන්දි.

135 තදඤ්ඤානිපි ලොකස්මිං ජාතා'නෙකවිධබ්භුතා
දස්සිතා මෙ සමාසෙන ගන්ථවිත්ථාරභීරුනා.

136 යස්මිං විචිත්තමණිමණ්ඩිතමන්දිරානං
නානාවිතානසයනාසනමණ්ඩිතානං
නිස්සෙණි සෙණි පුථුභූමිකභූසිතානං
තිණ්ණං උතූනම'නුරූපම'ලඞ්කතානං.

137 සිඛග්ගසු රංසිනිකරා සුරමන්දිරානං
සිඛග්ගසු රංසිමපභාසකරා'ව නිච්චං
ආදිච්චරංසි විය පඞ්කජකානනානි
ලොකානනම්බුජවනානි විකාසයන්ති.

---

ඵව, (මුදුනෙහි) සිටියාමවූ; ජායංච, ජායාවද; දිස්වා, දැක; තෙ, නුඹවහන්සේගේ; පුත්තස්ස, පුත්‍රයාගේ; අබ්භුතං, ආශ්චර්යසීය; ඊදිසන්ති, මෙබඳුයයි; ධාතිජනො, ධාත්‍රීජනතෙම, තං, ඒ ශුද්ධොදන මහරජහුකරා; උපගන්ත්වා, ගොස්; අබ්‍රවී, කීයේයි.

(134) විසුද්ධ, පිරිසුදුවූ; චන්ද, චන්ද්‍රමණ්ඩලයක්හාසමානවූ; ආනන, මුඛමණ්ඩලයෙන්; භාසුරස්ස, බබලන්නාවූ; පඞ්කජ ලොචනස්ස, පද්ම පත්‍රයක් හා සමානවූ නෙත්‍රයුගලයක් ඇති (ඒ මහාබොධිසත්ත්වයන් ගේ); තං, ඒ ආශ්චර්යසීය; සුත්වාන, අසා; සො, ඒ ශුද්ධොදනමහරජ තෙම; මෙ, මාගේ; දුතියං වන්දනන්ති, දෙවැනි වන්දනාවයයි; වත්වා, කියා; පුත්තස්ස, පුත්‍රයාගේ; පාදෙ, පාදයන්; සිරසා, උත්තමාඞ්ග යෙන්; අභිවන්දි, වැන්දේයි.

(135) ලොකස්මිං, ලොකයෙහි; තදඤ්ඤානිපි, එයින්අන්‍යවූද; අනෙකවිධා, අනෙකප්‍රකාරවූ; අබ්භුතා, ආශ්චර්යයෝ; ජාතා, පහලවූ හ; ගන්ථවිත්ථාරභීරුනා, ග්‍රන්ථවිස්තරයෙහි භීරුකාවූ; මෙ, මා විසින්; සමාසෙන, සංක්ෂෙපයෙන්; දස්සිතා, දක්වනලදහුයි.

(136) යස්මිං, යම්පුරයෙක්හි; විචිත්ත, විසිතුරුවූ; මණි, මාණික්‍ය යෙන්; මණ්ඩිත, සරහනලද ශ්‍රීඇති; මන්දිරානං, ප්‍රාසාදයන් ඇති; නානා, අනෙකප්‍රකාරවූ; විතාන, වියතින්ගා; සයනාසන, සයනාස නයෙන්; මණ්ඩිතානං, අලඞ්කෘතවූ; නිස්සෙණි සෙණි, හිණිපෙති පඞ්ක්තීන්ද, පුථු, මහත්වූ; භූමික, බිම්මහලින්ද; භූසිතානං, අලඞ්කෘතවූ; තිණ්ණං උතූනං, සෘතුන් තුන්දෙනාට; අනුරූපං, සුදුසුකොට; අලඞ්කතානං, සරහනලද්දවූ.

(137) සිඛග්ගසු, ප්‍රාසාදශිඛරවල්හි; රංසිනිකරා, රශ්මිසමූහයෝ;

138 නානා මණිවිචිත්තාහි භිත්තීහි වනිතා සදා
විනා'පි දප්පණච්ඡායං පසාධෙන්ති සකං තනුං.

139 කෙලාසනගසඞ්කාසං විලොචනරසායනං
සුධාලඞ්කතපාකාරවලයං යත්ථ දිස්සතෙ.

140 ඉන්දනීලොරුවලයං නානා රතනභූසිතං
දිස්සතෙ'ව සදා යස්මිං පරිඛානෙකපඞ්කජා.

141 පත්වාන වුද්ධිං විපුලෙ මනුඤ්ඤෙ
භුත්වාන කාමෙ ච තහිං වසන්තො
ගච්ඡං තිලොකෙකවිලොචනො සො
උය්‍යානකීළාය මහාපථම්හි.

---

සුරමන්දිරානං, දිව්‍යප්‍රාසාදයන්ගේ; සිඛෙසු, ශිඛරවල්හි; රංසිං, රශ්මියට; නිච්චං, අනවරතයෙන්; අපහාසකරාඉව, අපහාසකරන් නවුන් වැනියහ; පඞ්කජකානනානි, පද්මවනයන්; ආදිච්චරංසිවිය, සූර්යරශ්මියමෙන්; ලොක, ලොකවාසිසත්ත්වයන්ගේ; ආනන, මුඛ නමැති; අම්බුජවනානි, පද්මවනයන්; විකාසයන්ති, ප්‍රබොධකරන් නාහුයි.

(138) නානා, අනෙකප්‍රකාරවූ; මණි, මාණික්‍යයෙන්; විචිත්තාහි, විසිතුරුවූ; භිත්තිහි, භිත්තීන් කරණකොටගෙණ; වනිතා, අඞ්ගනාවෝ තුමූ; සදා, හැමකල්හි; දප්පණච්ඡායං විනාපි, දර්පණච්ඡායාවක් නැතිවද (හෙවත් කැඩපත්තලයක් නැතිවද); සකං තනුං, තමන්ගේ ශරීරය; පසාධෙන්ති, සරහන්නාහුයි.

(139) යත්ථ, යම්පුරයෙක්හි; කෙලාසනගසඞ්කාසං, කෛලාස පර් තයඡේහෝයි සැසඳෙන්නාවූ; විලොචන, නෙත්‍රයට; රසායනං, රසායනයක් බඳුවූ; සුධාලඞ්කත, සුණු බදමින් සරහනලද; පාකාර වලයං, පවුරුවලල්ල; දිස්සතෙ, දක්නාලැබේද.

(140) යස්මිං, යම්පුරයෙක්හි; නානාරතනභූසිතං, අනෙකප්‍රකාර රත්නයෙන් අලඞ්කෘතවූ; ඉන්දනීල, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ; උරු, මහත්වූ; වලයංඉව, වලල්ලක් වැනිවූ; අනෙක පඞ්කජා, නොයෙක් පද්මයන් ඇති; පරිඛා, අගලතොම; සදා, හැමකල්හි; දිස්සතෙ, දක් නා ලැබේද.

(141) තහිං, ඒ කිඹුල්වත්පුරයෙහි; වුද්ධිං පත්වාන, වැඩිවිය පැමිණ; විපුලෙ, මහත්වූ; මනුඤ්ඤෙ, මනොඥවූ; කාමෙ, පඤ්චකාමයන්; භුත්වාන, අනුභවකොට; වසන්තො, වසන්නාවූ; තිලොකෙකවිලොචනො, ත්‍රෛලොක්‍යයට අසහාය නෙත්‍රයක්වැනිවූ; සො, ඒ බොධිසත්ත්වතෙම; උය්‍යාන කීළාය, උයන්කෙළි පිණිස; මහාපථම්හි, මහත්වූ රාජපථයෙහි; ගච්ඡං, යන්නේ.

142 කමෙන ජිණ්ණං බ්‍යාධිතං මතං ච *
දිස්වාන රූපං තිභවෙ විරත්තො
මනොරමං පබ්බජිතං ච රූපං
කත්වා රතිං තම්හි චතුත්ථවාරෙ.

143 සුඵුල්ලනානාතරුසණ්ඩමණ්ඩිතං සිඛණ්ඩිසණ්ඩාදිදිජූපකූජිතං
සුදස්සනීයං විය නන්දනං වනං මනොරමුය්‍යානම'ගා මහායසො.

144 සුරඞ්ගනා සුන්දරසුන්දරීනං මනොරමෙ වාදිතනච්චගීතෙ
සුරින්දලීලාය තහිං නරින්දො රමිත්වා කාමං දිපදුත්ත'මින්දො.

145 ආභුජිත්වාන පල්ලඞ්කං නිසින්නො රුචිරාසනෙ
කාරාපෙතුම'චින්තෙසි දෙහභූසන'මත්තනො.

146 තස්ස චිත්තං විදිත්වාන විස්සකම්මස්සි'දං'බ්‍රවී
අලඞ්කරොහි සිද්ධත්ථ'මිති දෙවානමිස්සරො.

---

(142) කමෙන, ක්‍රමයෙන්; ජිණ්ණං, ජරාවට පැමිණියාවූද; බ්‍යාධිතං, ව්‍යාධියෙන් පීඩිතවූද; මතංච, මළාවූද; රූපං, රූපය; දිස්වාන, දැක; තිභවෙ, භවත්‍රයෙහි; විරත්තො, නොඇලුනාවූ (සිත් ඇත්තේ); චතුත්ථවාරෙ, සතරවෙනි වාරයෙහි; මනොරමං, සිත්කලුවූ; පබ්බජිතං රූපංච, ප්‍රව්‍රජිතරූපයක්ද; දිස්වාන, දැක; තම්හි, ඒ ප්‍රව්‍රජිතරූපයෙහි; රතිං කත්වා, ඇලුම්කොට.

(143) සුඵුල්ල, මනාව විකසිතවූ; නානා, අනෙකප්‍රකාරවූ; තරුසණ්ඩ, වෘක්ෂසමූහයෙන්; මණ්ඩිතං, සැරහුනාවූ; සිඛණ්ඩිසණ්ඩාදි, මයූරසමූහාදිවූ; දිජ, පක්ෂීන් විසින්; උපකූජිතං, රැව්පිළිරැව්දෙන ලද්දාවූ; නන්දනං වනං විය, නන්දනොද්‍යානයමෙන්; සුදස්සනීයං, අතිශයින් දර්ශනීයවූ; මනොරමං, සිත්කලුවූ; උය්‍යානං, උද්‍යානයට; මහායසො, මහත්වූයසපිරිවරඇත්තාවූ(ඒබොධිසත්ත්වතෙම); අගා, ගියේයි.

(144) සුරඞ්ගනා, දිව්‍යාඞ්ගනාවන් හා සමානවූ; සුන්දර, දර්ශනීයවූ; සුන්දරීනං, ස්ත්‍රීන් විසින්; වාදිත, වයනලද; නච්චගීතෙ, නෘත්‍යගීතයන් ඇති; මනොරමෙ, සිත්කලුවූ; තහිං, ඒ උද්‍යානයෙහි; දිපදුත්තමින්දො, දිපදොත්තමවූ; නරින්දො, නරෙන්ද්‍රවූ (මහාබොධිසත්ත්වතෙම); සුරින්දලීලාය, ශක්‍රදෙවෙන්ද්‍රලීලායෙන්; කාමං, කැමැතිපරිද්දෙන්; රමිත්වා, රමණයකොට.

(145) රුචිර, සිත්කලුවූ; ආසනෙ, ආසනමස්තකයෙහි; පල්ලඞ්කං ආභුජිත්වාන, පළක්බැඳ; නිසින්නො, උන්නාවූ; (ඒ බොධිසත්ත්වතෙම); අත්තනො, තමාගේ; දෙහභූසනං, ශරීරාලඞ්කාරය; කාරාපෙතුං, කරවන්නට; අචින්තෙසි, සිතී.

(146) දෙවානමිස්සරො, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; තස්ස, ඒ බොධිසත්ත්වයන්ගේ; චිත්තං, සිත; විදිත්වාන, දැන; විස්සකම්මස්ස, විශ්වකර්මදි

---

* බ්‍යාධිමතං ච තං ච, සබ්බත්ථ.

147 තෙනා'ණත්තො'පගන්ත්වාන විස්සකම්මො යසස්සිනො
දසදුස්සසහස්සෙහි සීසං වෙඨෙසි සොභනං.

148 තනුං මනුඤ්ඤම්පි අකාසි සොභනං
අනඤ්ඤසාධාරණලක්ඛණුජ්ජලං
විචිත්තනානුත්තමභූසනෙහි සො
සුගන්ධිගන්ධුප්පලචන්දනාදිනා.

149 විභූසිතො තෙන විභූසිතඞ්ගිනා
තහිං නිසින්නො විමලෙ සිලාතලෙ
සුරඞ්ගනාසන්නිභසුන්දරීහි සො
පුරක්ඛතො දෙවපතීව සොභති.

150 සුද්ධොදනනරින්දෙන පෙසිතං සාසනුත්තමං
"පුත්තො තෙ පුත්ත ජාතො"ති සුත්වාන දිපදුත්තමො.

---

ව්‍යපුත්‍රයාහට; සිද්ධත්ථං, සිද්ධාර්ථකුමාරයන්; අලඞ්කරොහි ඉති, සරහසියන; ඉදං, මේ වචනය; බ්‍රවි, කී.

(147) තෙන, ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින්; ආණත්තො, නියොගකරණලද්දාවූ; විස්සකම්මො, විශ්වකර්මදිව්‍යපුත්‍රතෙම; උපගන්ත්වාන, සමීපයට එලඹ; යසස්සිනො, යසපිරිවර ඇත්තාවූ (ඒ බොධිසත්ත්වයන්ගේ); සීසං, හිස; දසදුස්සසහස්සෙහි, දසදහසක් දිව්‍යවස්ත්‍රයෙන්; සොභනං, සුන්දරකොට; වෙඨෙසි, වෙළී.

(148) සො, ඒ විශ්වකර්මදිව්‍යපුත්‍රතෙම; අනඤ්ඤසාධාරණ, අන්‍යසාධාරණ නොවන්නාවූ; ලක්ඛණ, ලක්ෂණයෙන්; උජ්ජලං, දිලියෙන්නාවූ; තනුම්පි, ශරීරයද; විචිත්ත, විසිතුරුවූ; නානා, අනෙකප්‍රකාරවූ; උත්තම, උතුම්වූ; භූසනෙහි, අලඞ්කාරයෙන්ද; සුගන්ධිගන්ධ, මනාවූ සුගන්ධයෙන්ද; උප්පල, මහනෙල්මල් ආදියෙන්ද; චන්දනාදිනා, සඳුන්ආදියෙන්ද; මනුඤ්ඤං, මනොඥකොට; සොභනං අකාසි, සැරහී.

(149) විභූසිත, සරහනලද; අඞ්ගිනා, ශරීරඇති; තෙන, ඒ විශ්වකර්මදිව්‍යපුත්‍රයා විසින්; විභූසිතො, සරහනලද; තහිං, ඒ උද්‍යානයෙහි; විමලෙ, නිර්මලවූ; සිලාතලෙ, මඟුල්තලවට මත්තෙහි; නිසින්නො, හුන්නාවූ; සො, ඒ බොධිසත්ත්වතෙම; සුරඞ්ගනාසන්නිභ, දිව්‍යාඞ්ගනාවන් හාසමානවූ; සුන්දරීහි, ස්ත්‍රීන් විසින්; පුරක්ඛතො, පිරිවරණලද්දේ; දෙවපතීව, ශක්‍රදෙවෙන්ද්‍රයාමෙන්; සොභති, බබලන්නේයි.

(150) දිපදුත්තමො, ද්විපදොත්තමවූ; (සො, ඒ බොධිසත්ත්වතෙම); පුත්ත, පුත්‍රයානෙනි; තෙ, තොපගේ; පුත්තො, පුත්‍රයෙක්; ජාතො

151 "මම'ජ්ජ බන්ධනං ජාතං" ඉති වත්වාන තාවදෙ
සමිද්ධං සබ්බකාමෙහි අගමා සුන්දරං පුරං.

152 සීතා උපරිපාසාදෙ කිසාගොතමී තං තදා
රාජෙන්තං සතරංසිං'ව රාජං දිස්වා කථෙසි'දං.

153 "යෙසං සූනු අයං ධීරො යා ච ජායා ඉමස්ස තු
තෙ සබ්බෙ නිබ්බුතා නූන සදා'නූනගුණස්ස වෙ"

154 ඉතී'දිසං ගිරං සුත්වා මනුඤ්ඤං තාය භාසිතං
සඤ්ජාතපීතියා පීතො ගච්ඡමානො සකාලයං.

155 සීතලං විමලං හාරිං හාරං තං රතිවඩ්ඪනං
පෙසෙත්වා සන්තිකං තස්සා ඔමුඤ්චිත්වාන කණ්ඨතො.

---

ඉති, උපනැයි; සුද්ධොදනනරින්දෙන, ශුද්ධොදනමහරජහු විසින්; පෙසිතං, යවනලද; උත්තමං සාසනං, උතුම්වූ අස්න; සුත්වාන, අසා.

(151) මම, මට; අජ්ජ, අද; බන්ධනං ජාතං ඉති, බන්ධනයක් උපනැයි; වත්වාන, කියා; තාවදෙ, එකෙණෙහි; සබ්බකාමෙහි, සියලු වස්තුකාමක්ලෙශකාමයෙන්; සමිද්ධං, සමෘද්ධවූ; සුන්දරං, දකිනියවූ; පුරං, (ඒ කිඹුල්විත්)පුරයට; අගමා, ගියේයි.

(152–153) තදා, එකල්හි; උපරිපාසාදෙ, මතුමහල්තෙලෙහි; සීතා, සිටියාවූ; කිසාගොතමී, කෘශාගෞතමී නම් බිසවුතොම; සතරංසිංව, සූර්ය්‍යයාමෙන්; රාජෙන්තං, බබලන්නාවූ; තං රාජං, ඒ රජහු; දිස්වා, දැක; නූන, එකාන්තයෙන්; අයං ධීරො, ප්‍රාඥවූ මේ බොධිසත්ත්වතෙම); යෙසං, යම් දෙමවුපියකෙනෙකුන්ට; සූනු, පුත්‍ර වීද; සදා, හැමකල්හි; අනූනගුණස්ස, සම්පූර්ණවූ ගුණ ඇති; ඉමස්ස තු, මේ බොධිසත්ත්වයන්ට වනාහි; යා ච, යමක්හු; ජායා, භාර්ය්‍යා වූද; වෙ, එකාන්තයෙන්; තෙ සබ්බෙ, ඔහු හැමදෙන; නිබ්බුතා ඉති,, නිවියාහුයයි යන; ඉදං, මේ වචනය; කථෙසි, කීවු.

(154) ඉති, මෙසේ, තාය, ඒ කෘශාගෞතමීනම් බිසව විසින්; භාසිතං, කියනලද; මනුඤ්ඤං, මනොඥවූ; ඊදිසං ගිරං, මෙබඳුවචනය; සුත්වා, අසා; සඤ්ජාත, හටගත්තාවූ; පීතියා, ප්‍රීතීන්; පීතො, පිරුනාවූ (සිත්ඇත්තේ); සකාලයං, ස්වකීයවූ රාජමන්දිරයට; ගච්ඡමානො, යන්නේ.

(155) සීතලං, සිහිල්වූ; විමලං, නිර්මලවූ; රතිවඩ්ඪනං, ඇලුම්කරන්නාවූ; හාරිං, මනොඥවූ; තං හාරං, ඒ මුක්තාහාරය; කණ්ඨතො ග්‍රීවයෙන්; ඔමුඤ්චිත්වාන, ගලවා; තස්සා සන්තිකං, ඒ කෘශාගෞතමීනම් බිසවුන් සමීපයට; පෙසෙත්වා, යවා.

156 පාසාදම'භිරූහිත්වා වෙජයන්තං'ව සුන්දරං
නිපජ්ජ දෙවරාජා'ව සයනෙ සො මහාරහෙ.

157 සුන්දරී තං පුරක්ඛත්වා සුරසුන්දරිසන්නිභා
පයොජයිංසු නච්චානි ගීතානි විවිධානි'පි.

158 පබ්බජ්ජාභිරතො ධීරො පඤ්චකාමෙ නිරාලයො
තාදිසෙ නච්චගීතෙ'පි න රමිත්වා මනොරමෙ

159 නිපන්නො විසමිත්වාන ඊසකං සයනෙ තහිං
පල්ලඞ්කමා'භුජිත්වාන මහාවීරො මහීපති

160 නිසින්නො'ව'නෙකප්පකාරං විකාරං
පදිස්වාන නිද්දූපගතානං වධූනං
ගමිස්සාමි'දානී'ති උබ්බිග්ගචිත්තො
භවෙ ද්වාරමූලං'පගන්ත්වාන රම්මං.

---

(156) වෙජයන්තංව, වෛජයන්තප්‍රාසාදයමෙන්; සුන්දරං, සොඳුරුවූ; පාසාදං, ප්‍රාසාදයට; අභිරූහිත්වා, නැගී; සො, ඒ මහාබොධිසත්ත්වතෙම; මහාරහෙ, අනර්ඝවූ; සයනෙ, ශ්‍රීයහන්මස්තකයෙහි; දෙවරාජාව, ශක්‍රදෙවෙන්ද්‍රයාමෙන්; නිපජ්ජි, හොත්තේයි. *

(157) සුරසුන්දරිසන්නිභා, දිව්‍යාඞ්ගනාවන්හා සමානවූ; සුන්දරී, ස්ත්‍රීහු; තං, ඒ බොධිසත්ත්වයන්; පුරක්ඛත්වා, පිරිවරා; විවිධානි, අනෙකප්‍රකාරවූ; නච්චානිපි, නෘත්‍යයන්ද; ගීතානි, ගායනාවන්ද; පයොජයිංසු, මෙහෙයූවාහුයි.

(158) පබ්බජ්ජාභිරතො, පැවිදිවීමෙහි ඇලුම්ඇත්තේ; පඤ්චකාමෙ, පඤ්චකාමයෙහි; නිරාලයො, ආලයක්නැත්තාවූ; ධීරො, ප්‍රාඥවූ (ඒ බොධිසත්ත්වතෙම); මනොරමෙ, සිත්කලුවූ; තාදිසෙ, එබඳුවූ; නච්චගීතෙපි, නෘත්‍යගීතයෙහිදු; න රමිත්වා, ඇලුම්නොකොට.

(159) මහාවීරො, මහත්වූ වීර්‍ය්‍යඇති; මහීපති, පෘථිවීශ්වරවූ; (ඒ මහාබොධිසත්ත්වතෙම); නිපන්නො, හොත්තේ; ඊසකං, මදක්; විසමිත්වාන, සැතපී; තහිං සයනෙ, ඒ ශ්‍රීයහන්මස්තකයෙහි; පල්ලඞ්කං ආභුජිත්වාන, පලක් බැඳ.

(160) නිසින්නොඑව, හුන්නේම; නිද්දූපගතානං, නිද්‍රාවට පැමිණියාවූ; වධූනං, ස්ත්‍රීන්ගේ; අනෙකප්පකාරං, අනෙකප්‍රකාරවූ; විකාරං, විකාරය; පදිස්වාන, දැක; භවෙ, සංසාරයෙහි; උබ්බිග්ගචිත්තො, කලකිරුණාවූ සිත් ඇත්තේ; ඉදානි, දැන්; ගමිස්සාමීති, (මහබිනික්මන්) නික්මෙමියි; රම්මං, සිත්කලුවූ; ද්වාරමූලං, දෙරකඩ සමීපයට; උපගන්ත්වාන, ගොස්.

---

* නිසීදි, හුන්නේයි, පොත්

161 ඨපෙත්වාන සීසං සුභුම්මාරකස්මිං
සුණිස්සාමි ධීරස්ස සද්දන්ති තස්මිං
නිපන්නං සුදන්තං පසාදාවහන්තං
සහායං අමච්චං මහාපුඤ්ඤවන්තං.

162 අවඤ්ඤාතසච්චං ඡන්නං ආමන්තෙත්වා කථෙසී'දං
"ආනෙහි ඉති කප්පෙත්වා කණ්ඨකං නාම සින්ධවං."

163 සො ඡන්නො පතිගණ්හිත්වා තං ගිරං තෙන භාසිතං
තතො ගන්ත්වාන කප්පෙත්වා සීඝමා'නෙසි සින්ධවං.

164 අභිනික්ඛමනං තස්ස ඤත්වා වරතුරඞ්ගමො
-තේන සජ්ජියමානො සො හෙසාරවමු'දීරයි.

165 පත්ථරිත්වාන ගජ්ජන්තං සද්දං තං සකලං පුරං
සබ්බෙ සුරගණා තස්මිං සොතුං නා'දංසු කස්සචි.

---

(161–162) ධීරස්ස, ස්වාමිදරුවන්වහන්සේගේ; සද්දං, ශබ්දය; සුණිස්සාමිති, අසමියි; සුභ, සුන්දරවූ; උම්මාරකස්මිං, එලිපත මත්තෙහි; සීසං ඨපෙත්වාන, ඉස තබා; තස්මිං, ඒ එලිපත මත්තෙහි; නිපන්නං, හොත්තාවූ; සුදන්තං, මනාව හික්මුනාවූ; පසාදාවහන්තං, ප්‍රසාදය එලවන්නාවූ; සහායං, යහලුවූ; මහාපුඤ්ඤවන්තං, මහපිනැතිවූ; අවඤ්ඤාතසච්චං, නොනිඳු හොත්තාවූ; තං ඡන්නං (නාම) අමච්චං, ඒ ඡන්න (නම්) අමාත්‍යයා; ආමන්තෙත්වා, කැඳවා; කණ්ඨකං නාම සින්ධවං, කණ්ඨකනම් අශ්වයා; කප්පෙත්වා, සදා; ආනෙහි ඉති, ගෙණ එවයි; ඉදං, මේ වචනය; කථෙසි, කී.

(163) සො ඡන්නො, ඒ ඡන්නනම් අමාත්‍යතෙම; තෙන, ඒ මහාබොධිසත්ත්වයන් විසින්; භාසිතං, කියනලද; තං ගිරං, ඒ වචනය; පතිගණ්හිත්වා, පිළිගෙණ; තතො, ඉක්බිත්තෙන්; ගන්ත්වාන; ගොස්; කප්පෙත්වා, සදා; සින්ධවං, සෛන්ධවයා; සීඝං, වහා; ආනෙසි, ගෙණායේයි.

(164) තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ; අභිනික්ඛමනං, (මහබිනික්මන්) නික්මීම; ඤත්වා, දැන; සො වරතුරඞ්ගමො, ඒ උතුම්වූ අශ්වරාජතෙම; තෙන, ඔහු විසින්; සජ්ජියමානො, සදනු ලබන්නේ; හෙසාරවං, හේෂාරවධ්වනිය; උදීරයි, පැවැත්තුයේයි.

(165) සකලං පුරං, සියලු (කිඹුල්වත්) පුරය; පත්ථරිත්වාන, පැතිරගෙණ; ගජ්ජන්තං, යන්නාවූ; තං සද්දං, ඒ ශබ්දය; තස්මිං, ඒ පුරයෙහි, (අධිගෘහීතවූ); සබ්බෙ සුරගණා, සියලු දිව්‍යසමූහයෝ; කස්සචි, කිසිවක්හු විසින්; සොතුං, අසන්නට; නාදංසු, නුදුන්නාහුයි.

166 අථ සො සජ්ජනානන්දෙ උත්තමං පුත්තම'ත්තනො
පස්සිත්වා පඨමං ගන්ත්වා පච්ඡා බුද්ධො භවාමි'හං.

167 චින්තයිත්වාන එව'මපි ගන්ත්වා ජායානිවෙසනං
ඨපෙත්වා පාදදු'ම්මාරෙ ගීවං අන්තො පවෙසිය.

168 කුසුමෙහි සමාකිණ්ණෙ දෙවිඤ්ඤසයනූපමෙ
නිපන්නං මාතුයා සද්ධිං සයනෙ සකම'ත්‍රජං.

169 විලොකෙත්වාන චින්තෙසි ඉති ලොකෙකනායකො
සචා'හං දෙවියා බාහුම'පනෙත්වා මම'ත්‍රජං.

170 ගණ්හිස්සාම'න්තරාය'මපි කාරෙය්‍ය ගමනස්ස මෙ
පබුජ්ඣිත්වා මහන්තෙන පෙමෙනෙ'සා යසොධරා.

---

(166) අථ, ඉක්බිත්තෙන්; සජ්ජනානන්දෙ, සත්පුරුෂයන් සතුටු කරවන්නාවූ; සො, ඒ බොධිසත්ත්වතෙම; අත්තනො, තමාගේ; උත්තමං පුත්තං, උතුම්වූ පුත්‍රයා; පඨමං පස්සිත්වා, පළමුකොට දැක; පච්ඡා ගන්ත්වා, පසුව ගොස්; අහං, මම; බුද්ධො භවාමි, බුදුවෙමි.

(167) එවමපි චින්තයිත්වාන, මෙසේද සිතා; ජායානිවෙසනං, බිම්බා දෙවීන්ගේ මන්දිරයට; ගන්ත්වා, ගොස්; උම්මාරෙ, එළිපත මත්තෙහි; පාදං ඨපෙත්වා, පයතබා; ගීවං, කර; අන්තො පවෙසිය, ඇතුළට වදවා.

(168) (සො, ඒ මහාබොධිසත්ත්වතෙම); දෙවිඤ්ඤසයනූපමෙ, දිව යහනක්හා සමානවූ; කුසුමෙහි, (යෙලයාලක්දූසමන්) මලින්; සමාකිණ්ණෙ, ගැවසීගත්තාවූ; සයනෙ, ශ්‍රීයහන්මස්තකයෙහි; මාතුයා සද්ධිං, මෑනියන්හා සමග; නිපන්නං, හොත්තාවූ; සකමත්‍රජං, සවකීය පුත්‍රයා.

(169) විලොකෙත්වාන, බලා; ලොකෙකනායකො, ලොකයාහට එකස්වාමිවූ (ඒ මහාබොධිසත්ත්වතෙම); ඉති චින්තෙසි, මෙසේ සිතී; (සො) අහං, (හේ) මම; සචෙ, ඉදින්; දෙවියා, (යශොධරා) දෙවීන්ගේ; බාහුං, හස්තය; අපනෙත්වා, පහකොට; මමත්‍රජං, මාගේ පුත්‍රයා.

(170) ගණ්හිස්සාමි, ගන්නෙම්වීම්නම්; එසා යසොධරා, මේ යශොධරාදෙවීතොම; පබුජ්ඣිත්වා, පිබිද; මහන්තෙන පෙමෙන, මහත්වූ ප්‍රෙමයෙන්; මෙ, මාගේ; ගමනස්ස, (මහබිනික්මන්) නික්මීමට; අන්තරායමපි කාරෙය්‍ය, බාධාදකරන්නීය.

171 බුද්ධො හුත්වා පුනා'ගම්ම පස්සිස්සාමී'ති අත්‍රජං
නරාධිපො තදා තම්හා පාසාදතලතො'තරි.

172 පෙසලානනකරඞ්ඝිපඞ්කජා හාසඵෙනභමුවීචිභාසුරා
නෙත්තනීලකමලා යසොධරා කොමුදී'ව නයනාලිපත්ථිතා.

173 සමත්ථො අස්ස කො තස්සා ජහිතුං දෙහසම්පදං
විඥමානො විනා ධීරං ඨිතං පාරමිමුද්ධනි.

174 "අස්සො සාමි මයානීතො කාලං ජාන රථෙසභ"
ඉති අබ්‍රවි ඡන්නො සො භූපාලස්ස යසස්සිනො.

175 මහීපති තදා සුත්වා ඡන්නෙනො'දීරිතං ගිරං
පාසාදා ඔතරිත්වාන ගන්ත්වා කන්ථකසන්තිකං.

---

(171) බුද්ධො හුත්වා, බුදුව; පුන, නැවත; ආගම්ම, අවුත්; අත්‍රජං, පුත්‍රයා; පස්සිස්සාමිති, දක්මියි; නරාධිපො, නරේශ්වරවූ; (මහාබොධිසත්ත්වතෙම); තදා, එවේලෙහි; තම්හා පාසාදතලතො, ඒ ප්‍රාසාද තලයෙන්; ඔතරි, බටුයේයි.

(172) පෙසලා, දර්ශනීයවූ; ආනනකරඞ්ඝිපඞ්කජා, මුඛහස්තපාද නමැති පද්මයන් ඇති; හාස, සිනානමැති; ඵෙන, පෙනපිඬුහා; භමු, බැමලියනමැති; වීචි, තරඞ්ගයෙන්; භාසුරා, බබලන්නාවූ; නෙත්ත, නෙත්‍රනමැති; නීලකමලා, නීලපද්මයන්ඇති; යසොධරා, යශො ධරාදෙවිතොම; නයන, නෙත්‍රනමැති; අලි, භෘඞ්ගයන් විසින්; පත්ථිතා, ප්‍රාර්ථිනීයවූ; කොමුදීඉව, විලක්වැන්නීයි.

(173) පාරමිමුද්ධනි ඨිතං, පාරමිතාමස්තකයෙහි පිහිටියාවූ; (තං) ධීරං විනා, (ඒ) ප්‍රාඥවූ (මහාබොධිසත්ත්වයන්) හැර; තස්සා, ඒ යශොධරාදෙවීන්ගේ; දෙහසම්පදං, ශරීරසමෘද්ධිය; විඥමානො, විඳි මින්; (සිට) ජහිතුං, හරින්නට; කො, කවරනම්සත්ත්වයෙක්; සම ත්ථො අස්ස, සමර්ථ වේද.

(174) රථෙසභ, රථොත්තමවූ; සාමි, ස්වාමිදරුවන්වහන්ස; මයා, මා විසින්; අස්සො, අශ්වතෙම; ආනීතො, ගෙණඑනලද; කාලං ජාන ඉති, මහාබිනික්මන්නික්මීමට කල්දතමැනවැයි කියා; සො ඡන්නො, ඒ ඡන්නනම් අමාත්‍යතෙම; යසස්සිනො, යසපිරිවර ඇත් තාවූ; භූපාලස්ස, මහාබොධිසත්ත්වයන්ට; අබ්‍රවි, කී.

(175) මහීපති, පෘථිවීශ්වරවූ; (ඒ මහාබොධිසත්ත්වතෙම); තදා, එසමයෙහි; ඡන්නෙන, ඡන්නනම්අමාත්‍යයා විසින්; උදීරිතං, කියන ලද; (තං) ගිරං, (ඒ) වචනය; සුත්වා, අසා; පාසාදා, ප්‍රාසාදයෙන්; ඔතරිත්වාන, බැස; කන්ථකසන්තිකං, කන්ථකනම් අශ්වයා සමීපයට; ගන්ත්වා, ගොස්.

176 තස්සි'දං වචනං භාසි සබ්බසත්තහිතෙ රතො
“කණ්ඨක'ජ්ජෙ'කරත්තිං මං තාරෙහි” “සතරාමරං.

177 ලොකමු'ත්තාරයිස්සාමි බුද්ධො හුත්වා අනුත්තරො
භවසාගරතො ඝොරජරාදිමකරාකරා.”

178 ඉදං වත්වා තමා'රුය්හ සින්ධවං සඞ්ඛසන්නිභං
ගාහාපෙත්වාන ඡන්නෙන සුදළ්හං තස්ස වාලධිං.

179 පත්වාන සො මහාද්වාරසමීපං සමචින්තයි
භවෙය්‍ය විවටං ද්වාරං යෙන කෙනචි නො සචෙ.

180 වාලධිං ගහිතෙනෙව සද්ධිං ඡන්නෙන කණ්ඨකං
නිප්පීළයිත්වා සත්ථීහි ඉමමච්චුග්ගතං සුභං
උල්ලඞ්ඝිත්වාන පාකාරං ගච්ඡාමී'ති මහබ්බලො.

---

(176–177) සබ්බසත්තහිතෙ රතො, සියලු සත්ත්වයන්ට හිතවැඩ කිරීමෙහි ඇලුනාවූ (ඒ මහාබොධිසත්ත්වතෙම); කණ්ඨක, කණ්ඨක නම්අශ්වය; අජ්ජ එකරත්තිං, අද එකරාත්‍රියෙහි; මං, මා; තාරෙහි, එතරකරවයි කියා; ඉදං වචනං, මේ වචනය; තස්ස, ඔහට; භාසි, කී—ඝොර, දරුණුවූ; ජරාදි, ජරා ව්‍යාධි ආදිවූ; මකරාකරා, චණ්ඩ සත්ත්වයන්ට උත්පත්තිස්ථානවූ; භවසාගරතො, භවනමැති සාගරයෙන්; සතරාමරං, දෙවිමිනිසුන් සහිතවූ; * ලොකං, ලොකවාසී සත්ත්වයා; අනුත්තරො, නිරුත්තරවූ; බුද්ධො හුත්වා, බුදුව; උත්තාරයිස්සාමි, එතර කෙරෙමි.

(178) ඉදං වත්වා, මෙසේ කියා; සඞ්ඛසන්නිභං, (ධොත) සඞ්ඛයක් හා සමානවූ; සින්ධවං, සෛන්ධවයාට; ආරුය්හ, නැගී; තස්ස, ඔහුගේ; වාලධිං, වාලධිය; ඡන්නෙන, ඡන්නනම් අමාත්‍යයාලවා; සුදළ්හං, ඉතා තරකොට; ගාහාපෙත්වාන, ගන්වා.

(179) සො, ඒ මහාබොධිසත්ත්වතෙම; මහාද්වාරසමීපං, මහවාසල් දොරසමීපයට; පත්වාන, පැමිණ; සමචින්තයි, මෙසේ සිතී; යෙන කෙනචි, යම්කිසිවක්හු විසින්; ද්වාරං, දොර; සචෙ නො විවටං භවෙය්‍ය, ඉදින් නොහරණ ලද්දේ වීනම්.

(180) වාලධිං ගහිතෙනෙව, වාලධිය ගත්තාවූම; ඡන්නෙන සද්ධිං එව, ඡන්නනම් අමාත්‍යයා හා සමගම; කණ්ඨකං, කණ්ඨකනම් අශ්වයා; සත්ථීහි, ඌරුයෙන්; නිප්පීළයිත්වා, පෙළා; අච්චුග්ගතං, ඉතා උස්වූ; සුභං, සුන්දරවූ; ඉමං පාකාරං, මේ ප්‍රාකාරය; උල්ලඞ්ඝිත්වාන, පැන; ගච්ඡාමීති, යෙමිසි; මහබ්බලො, මහත්වූ (බලඇති බොධිසත්ත්වතෙමේද).

---

* සතරාමරං, දෙවිමිනිසුන් සහිතවූ; මං, මා; තාරෙහි, එතරකර වයි කියා—පොත්.

181 තථා ථාමබලූපෙතො ඡන්නො'පි තුරගුත්තමො
විසුං විසුං විචින්තෙසුං පාකාරං සමතික්කමං.

182 තස්ස චිත්තං විදිත්වාන මොදිතා ගමනෙ සුභෙ
විවරිංසු තදා ද්වාරං ද්වාරෙ'ධිග්ගහිතා සුරා.

183 තං සිද්ධත්ථම'සිද්ධත්ථං කරිස්සාමී'ති චින්තිය
ආගන්ත්වා තස්සි'දං භාසි අන්තලික්ඛෙ ඨිතන්තකො.

184 "මා නික්ඛම මහාවීර ඉතො තෙ සත්තමෙ දිනෙ
දිබ්බං තු චක්කරතනං අද්ධා පාතුභවිස්සති."

185 ඉච්චෙවං වුච්චමානො සො අන්තකෙන මහායසො
"කො'සි ත්වම්'ති"තං භාසි මාරො ච'ත්තානමා'දිසි.

---

(181) තථා, එසේම; ථාමබලූපෙතො, ථාමශක්තියෙන් යුක්තවූ; ඡන්නොපි, ඡන්නනම් අමාත්‍යද; තුරගුත්තමො, තුරගොත්තමවූ (කන්ථකනම් අශ්වයාද); පාකාරං සමතික්කමං, පවුරපිනීම; විසුං විසුං, වෙනවෙනම; විචින්තෙසුං, සිතූහ.

(182) තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ; චිත්තං, සිත; විදිත්වාන, දැන; සුභෙ ගමනෙ, සුන්දරවූ ගමනයෙහි; මොදිතා, සතුටුවූ සිත් ඇති; ද්වාරෙධිග්ගහිතා, මහවාසල්දොර අධිගෘහිතවූ; සුරා, දෙවියෝ; තදා, එසමයෙහි; ද්වාරං, දොර; විවරිංසු, අළුවාහුයි.

(183) තං, ඒ මහාබොධිසත්ත්වයන්; සිද්ධත්ථං, නිෂ්පන්නවූ අර්ථඇතියාහු; අසිද්ධත්ථං කරිස්සාමීති, අනිෂ්පන්නාර්ථවූවා කොරෙමියි; චින්තිය, සිතා; ආගන්ත්වා, අවුත්; අන්තලික්ඛෙ, ආකාශයෙහි; ඨිතො අන්තකො, සිටියාවූ වශවර්තිමාරතෙම; තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ට; ඉදං, මේ වචනය; අභාසි, කී.

(184) මහාවීර, මහත්වූ වීර්‍ය්‍යඇති (බොධිසත්ත්වයෙනි); මානික්ඛම, (මහබිනික්මන්) නොනික්මෙව; තෙ, තොපට; ඉතො, මෙයින්; සත්තමෙ දිනෙ, සත්වැනි දිනයෙහි; දිබ්බං තු චක්කරතනං, දිව්‍යවූ චක්‍රරත්නය වනාහි; අද්ධා, එකාන්තයෙන්; පාතු භවිස්සති, පහළවන්නේයි.

(185) ඉච්චෙවං, මෙසේ (යථොක්තක්‍රමයෙන්;) අන්තකෙන, වශවර්තිමාරයා විසින්; වුච්චමානො, කියනුලබන්නාවූ; සො මහායසො, ඒ මහත්වූ යසපිරිවර ඇති (මහා බොධිසත්ත්වතෙම); ත්වං, තෝ; කො අසි ඉති, කවරෙක්වෙහිදැයි; තං, ඔහුට; අභාසි, කීය; මාරොච, වශවර්තිමාරයාද; අත්තානං, තමාවූපරිදි; ආදිසි, කීයේයි.

186 "මාර ජානාම'හං මය්හං දිබ්බචක්කස්ස සම්භවං
ගච්ඡ ත්වං'ධ මා තිට්ඨ න'ම්හි රජ්ජේනම'ත්ථිකො

187 සබ්බං දසසහස්සිම්පි ලොකධාතුම'හං පන
උන්නාදෙත්වා භවිස්සාමි බුද්ධො ලොකෙකනායකො."

188 එවං වුත්තෙන මහාසත්තෙන අත්තනො ගිරම්'ත්තරිං
ගාහාපෙතුම'සක්කොන්තො තත්ථෙ'ව'න්තරධායි සො.

189 පාපිමස්ස ඉදං වත්වා චක්කවත්තිසිරිම්පි ච
පහාය ඛෙලපිණ්ඩං'ව පච්චූසසමයෙ වසිං.

190 ගච්ඡන්තම'භිපූජේතුං සමාගන්ත්වාන තාවදෙ
රතනුක්කාසහස්සානි ධාරයන්තා මරූ තහිං.

191 පච්ඡතො පුරතො තස්ස උභොපස්සෙසු ගච්ඡරෙ
තථෙ'ව අභිපූජේන්තා සුපණ්ණා ච මහොරගා.

---

(186) මාර, වශවර්ති මාරය; මය්හං, මට; දිබ්බචක්කස්ස සම්භවං, දිව්‍යවූ චක්‍රරත්නයාගේ පහළවීම; අහං, මම; ජානාමි, දනිමි; ත්වං, තෝ; ඉධ, මෙතැන්හි; මා තිට්ඨ, නොසිටු; ගච්ඡ, යා; රජ්ජේන, රාජ්‍යයෙන්; න අත්ථිකො අම්හි, ප්‍රයොජනයක් නැත්තෙමි.

(187) අහං පන, මම වනාහි; සබ්බං දසසහස්සිම්පි ලොකධාතුං, සියලුම දසදහසක් සක්වළ; උන්නාදෙත්වා, එකතින් නාද කරවා; ලොකෙකනායකො, ලොකයාහට එකස්වාමිවූ; බුද්ධො භවිස්සාමි, බුදුවෙමි.

(188) මහාසත්තෙන, මහාබොධිසත්වයන්; එවං, වුත්තෙන, මෙසේ කීකල්හි; අත්තනො ගිරං, තමාගේවචනය; උත්තරිං, මත්තෙහි; ගාහාපෙතුං, ගන්වන්නට; අසක්කොන්තො, අසමර්ථවූ; සො, ඒ වශවර්තිමාරතෙම; තත්ථෙව, එතැන්හිම; අන්තරධායි, අතුරුදන්වූයේයි.

(189) පාපිමස්ස, වශවර්තිමාරයාහට; ඉදං වත්වා, මේ වචනය කියා; පච්චූසසමයෙ, අලුයම්වේලෙහි (දම්නදල); ඛෙලපිණ්ඩං ඉව, කෙලපිඩක්මෙන්; චක්කවත්තිසිරිම්පි ච, චක්‍රවර්තිරාජශ්‍රියද; පහාය, හැර; වසිං, ඉඳුරන්වසහකළාවූ.

(190) ගච්ඡන්තං, යන්නාවූ (බොධිසත්වයන්); අභිපූජේතුං, පුදනු පිණිස; මරූ, දෙවියෝ; තාවදෙ, එකෙණෙහිම; සමාගන්ත්වාන, රැස්ව; තහිං, ඒ ස්ථානයෙහි; රතනුක්කාසහස්සානි, දහස්ගණන් රන්විලක්කු; ධාරයන්තා, දරමින්.

(191) තස්ස, ඒ මහාබොධිසත්වයන්ම; පච්ඡතො, පස්සෙහිද; පුරතො, අභිමුඛයෙහිද; උභො පස්සෙසු, දෑලවරයෙහිද; ගච්ඡරෙ,

192 සුවිපුලසුරසෙනා චාරුලීලාභිරාමා
කුසුමසලිලධාරා වස්සයන්තා නභම්හා
ඉහහි දසසහස්සීචක්කවාළා ගතා තා
සුඛුමතනුතමෙත්තොදග්ගුදග්ගා චරන්ති.

193 යස්මිං සුගන්ධවරපුප්ඵසුධූපචුණ්ණෙ
හෙමද්ධජප්පභුතිභාසුරචාරුමග්ගෙ
ගච්ඡං මහාජවවරඞ්ගතුරඞ්ගරාජා
ගන්තුං න සක්කි ජවතො කුසුමාදිලග්ගො.

194 ඉත්ථං තම්හි පථෙ රම්මෙ වත්තමානෙ මහාමහෙ
ගච්ඡන්තො රත්තිසෙසෙන තිංසයොජනමඤ්ජසෙ.

195 පත්වා'නොමානදීතීරං පිට්ඨිතො තුරගස්ස සො
ඔතරිත්වාන විමලෙ සීතලෙ සිකතාතලෙ.

---

යන්නාහ; සුපණ්ණා ච, ගරුඩරාජයෝද; මහොරගා ච, මහත්වූ දිව්‍යනාගරාජයෝද; අභිපූජෙන්තා, පුදමින්; තථෙව, එසේම; ගච්ඡරෙ, යන්නාහුයි.

(192) දසසහස්සීචක්කවාළා, දසදහසක්සක්වළින්; ඉහහි, මේ සක්වළටවනාහි; ආගතා, ආවාවූ; නභම්හා, ආකාශයෙන්; කුසුමසලිලධාරා, පුෂ්පසලිලධාරාවන්; වස්සයන්තා, වස්වමින්; සුඛුමතනුතමා, අතිශයින් සූක්ෂමවූ ශරීරඇති; චාරු, මනොඥවූ; ලීලාභිරාමා, ලීලාවෙන් සිත්කලුවූ; තා එතා සුවිපුලසුරසෙනා, ඒ මේ මහත්වූ දිව්‍ය සමූහයෝ; උදග්ගුදග්ගා, අතිශයින් ඔදවැඩියාවූ සිත්ඇතිව; චරන්ති, හැසිරෙන්නාහුයි.

(193) යස්මිං, යම්බඳුවූ; සුගන්ධ, සුවඳඇත්තාවූ; වර, උතුම්වූ; පුප්ඵ, පුෂ්පයෙන්ද; සුධූප, මනාවූ සුවඳදුම්න්ද; චුණ්ණෙ, සුවඳ සුන්නෙන්ද; හෙමද්ධජප්පභුති, රන්ධ්වජආදියෙන්ද; භාසුර, බබලන්නාවූ; චාරු, මනොඥවූ; මග්ගෙ, මාර්ගයෙහි; ගච්ඡං, යන්නාවූ; මහාජව, මහත්වූ ජවයෙන්ද; වර, උතුම්වූ; අඞ්ග, ශරීරයෙන්ද යුක්තාවූ; තුරඞ්ගරාජා, අශ්වරාජතෙම; කුසුමාදිලග්ගො, පුෂ්පාදියෙහි ලග්නවූයේ; ජවතො, ජවයෙන්; ගන්තුං, යන්නට; න සක්කි, අසමර්ථවී.

(194) ඉත්ථං, මෙසේ; (යථොක්තප්‍රකාරයෙන්); රම්මෙ, සිත්කලුවූ; තම්හි (මහා) පථෙ, ඒ (මහත්වූ) මාර්ගයෙහි; මහාමහෙ, මහත්වූ පූජා; වත්තමානෙ, පවත්නාකල්හි; රත්තිසෙසෙන, තුබූරාත්‍රිශෙෂයෙන්; තිංසයොජනමඤ්ජසෙ, තිස්යොදුන් මාර්ගයෙහි; ගච්ඡන්තො, යන්නේ.

(195) අනොමානදීතීරං, අනොමානම්ගංතෙරට; පත්වා, පැමිණ;

196 විස්සජ්ජිත්වා ඉදං වත්වා "ගච්ඡාහී'ති සකං පුරං
ආභරණානි ආදාය ඡන්නෙ'මං තුරගම්පි ච."

197 ඨිතො තස්මිං මහාවීරො අච්චන්ත නිසිතා'සිනා
සුගන්ධවාසිතං මොළිං ඡෙත්වා'නුක්ඛිපි අම්බරෙ.

198 චාරුහෙමසමුග්ගෙන කෙසධාතුං නභුග්ගතං
පූජනත්ථං සහස්සක්ඛො සිරසා සම්පටිච්ඡිය.

199 විලොචනානන්දකරින්දනීලමයෙහි චූළාමණි චෙතියං සො
පතිට්ඨපෙසා'මලතාවතිංසෙ උබ්බෙධතො යොජනමත්තමග්ගං.

200 උත්තමට්ඨපරික්ඛාරෙ ධාරෙත්වා බ්‍රහ්මුනාභතං
අම්බරෙ'ව පවිජ්ඣිත්ථ වරං දුස්සයුගම්පි ච.

---

සො, ඒ මහාබොධිසත්ත්වතෙම; තුරඞ්ගස්ස, අශ්වරාජයාගේ; පිට්ඨිතො, පිටින්; ඔතරිත්වාන, බැස; විමලෙ, නිර්මලවූ; සීතලෙ, සිහිල්වූ; සිකතාතලෙ, වාලුකාතලයෙහි.

(196) විස්සජ්ජිත්වා, මදක් සැතපී; ඡන්න, ඡන්නනම් අමාත්‍යය; ඉමං තුරගම්පි ච, මේ අශ්වරාජයාද; (ඉමානි) ආභරණානි, (මේ) ආභරණයන්ද; ආදාය, ගෙණ; සකං පුරං, ස්වකීයවූ (කිඹුල්වත්) පුරයට; ගච්ඡාහීති, යවයි යන; ඉදං වත්වා, මේ වචනය කියා.

(197) තස්මිං, ඒ වාලුකාතලයෙහි; ඨිතො, සිටියාවූ; මහාවීරො, මහත්වූ වීර්‍ය්‍යඇති (ඒ මහාබොධිසත්ත්වතෙම); අච්චන්ත, අතිශයින්; නිසිත, තියුණුවූ; අසිනා, ඛඩ්ගයෙන්; සුගන්ධවාසිතං, සුවඳ කවන ලද; මොළිං, කෙස්වැටිය; ඡෙත්වාන, කපා; අම්බරෙ, ආකාශයෙහි; උක්ඛිපි, දැමුයේය.

(198) චාරු, මනොඥවූ; හෙමසුමුග්ගෙන, රන්කරඬුවෙකින්; නභුග්ගතං, ආකාශයට නැංගාවූ; කෙසධාතුං, කෙස්වැටිය; පූජනත්ථං, පුදනුපිණිස; සහස්සක්ඛො, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; සිරසා, උත්තමාඞ්ගයෙන්; සම්පටිච්ඡිය, පිළිගෙණ.

(199) සො, ඒ ශක්‍රදෙවෙන්ද්‍රතෙම; අමල, නිර්මලවූ; තාවතිංසෙ, තව්තිසාභවනයෙහි; විලොචන, නෙත්‍රයට; ආනන්දකර, සන්තොසකරන්නාවූ; ඉන්දනීලමයෙහි, ඉන්ද්‍රනීලමාණික්‍යමයින්; උබ්බෙධතො, උසින්; යොජනමත්තං, යොදුනක්පමණ ඇති; අග්ගං, උතුම්වූ; චූළාමණිචෙතියං, චූඩාමාණික්‍යචෛත්‍යයක්; පතිට්ඨපෙසි, පිහිටුවූයේය.

(200) බ්‍රහ්මුනා, ඝටීකාරනම්මහාබ්‍රහ්මයාවිසින්; ආභතං, එළවන ලද; උත්තම, උතුම්වූ; අට්ඨපරික්ඛාරෙ, අෂ්ටපරිෂ්කාරයන්; ධාරෙත්වා, දරා; වරං, උතුම්වූ; දුස්සයුගම්පි ච, හන්සළුසහලද; අම්බරෙ එව, ආකාශයෙහිම; පවිජ්ඣිත්ථ, දැමී; (හෙවත් විහිදවී).

201 තමා'දය මහාබ්‍රහ්මා බ්‍රහ්මලොකෙ මනොරමං
ද්වාදසයොජනුබ්බෙධං දුස්සථූපං අකාරයි.

202 නාමෙනා'නුපියං නාම ගන්ත්වා අම්බවනං තහිං
සත්තාහං විතිනාමෙත්වා පබ්බජ්ජාසුඛතො තතො.

203 ගන්ත්වානෙ'කදිනෙනෙ'ව තිංසයොජනමඤ්ජසං
පත්වා රාජගහං ධීරො පිණ්ඩාය චරි සුබ්බතො.

204 ඉන්දනීලසිලායා'පි කතා පාකාරගොපුරා
හෙමාචලා'ව දිස්සන්ති තස්සා'භාහි තහිං තදා.

205 කො'යං සක්කො නු බො බ්‍රහ්මා මාරො නාගො'ති ආදිනා
භියො කොතුහලප්පත්තො පදිස්වා තං මහාජනො.

206 පවිසිත්වා ගහෙත්වාන හත්ථං යාපනමත්තකං
යුගමත්තං'ව පෙක්ඛන්තො ගච්ඡන්තො රාජවීථියං.

---

(201) තං, ඒ සළුසහල; ආදය, ගෙණ; මහාබ්‍රහ්මා, (ඝටීකාරනම්) මහාබ්‍රහ්මතෙම; බ්‍රහ්මලොකෙ, බ්‍රහ්මලොකයෙහි; මනොරමං, සිත් කලුවූ; ද්වාදසයොජනුබ්බෙධං, දොළොස්යොදනක් පමණ උසඇති; දුස්සථූපං, පිළිදාගැබක්; අකාරයි, කරවී.

(202) නාමෙන, නමින්; අනුපියං නාම, අනුපියනම්වූ; අම්බවනං ගන්ත්වා, අඹඋයනට ගොස්; තහිං, ඒ අඹඋයනෙහි; සත්තාහං, සති යක්මුලුල්ලෙහි; පබ්බජ්ජාසුඛතො, ප්‍රව්‍රජ්‍යාසැපයෙන්; විතිනාමෙත්වා, දවස්යවා; තතො, ඉක්බිත්තෙන්.

(203) එකදිනෙනෙව, එකදවසින්ම; තිංසයොජනමඤ්ජසං, තිස් යොදුන්මාර්ගයෙහි; ගන්ත්වාන, ගොස්; රාජගහං පත්වා, රජගහ නුවරට පැමිණ; සුබ්බතො, මනාවූ ව්‍රතඇති; ධීරො, ප්‍රාඥවූ (බොධිසත්ත්වතෙම); පිණ්ඩාය චරි, පිඬුපිණිස හැසුරුණේයි.

(204) තහිං, ඒ පුරයෙහි; ඉන්දනීලසිලායාපි, ඉන්ද්‍රනීලමාණික්‍ය යෙනුදු; කතා, කරණලද; පාකාරගොපුරා, ප්‍රාකාරහා ද්වාරට්ටාල යෝ; තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ; ආභාහි, (ශරීරා) ලොක යෙන්; තදා, එසමයෙහි; හෙමාචලා ඉව, ස්වර්ණපර්වතයක්පරිද්දෙන්; දිස්සන්ති, දක්නාලැබෙත්.

(205) මහාජනො, මහජනතෙම; තං, ඒ බොධිසත්ත්වයන්; පදිස්වා, දැක; අයං, මේතෙම; කො, කවරෙක්ද; සක්කො නු බො, ශක්‍රයෙක් ද්‍යෝහෝ; බ්‍රහ්මා, බ්‍රහ්මයෙක් ද්‍යෝහෝ; මාරො, මාරයෙක්ද්‍යෝහෝ; නාගොති, නාගයෙක්ද්‍යෝහෝයි යන; ආදිනා, මේ ආදියෙන්; භියො, බොහෝසේ; කොතුහලප්පත්තො, කොතුහලයට පැමිණියේයි.

(206) පවිසිත්වා, (රජගහනුවරට) වැද; යාපනමත්තකං, යැපෙන

207 මථිතං මෙරුමන්ථෙන සමුද්දං'ව මහාජනං
තම්හා සො අංගුලිං කත්වා ගන්ත්වා පණ්ඩවපබ්බතං.

208 තතො තස්සෙ'ව ඡායාය භූමිභාගෙ මනොරමෙ
නිසින්නො මිස්සකං භත්තං පරිභුඤ්ජිතුමා'රභි.

209 පච්චවෙක්ඛණමන්තෙන අනන්තසප්පං නිවාරිය
දෙහවම්මිකතො ධීරො නික්ඛමන්තං මහබ්බලො.

210 භුත්වාන බිම්බිසාරෙන නරින්දෙන නරාසභො
නිමන්තිතො'පි රජ්ජෙන උපගන්ත්වාන'නෙකධා.

211 පටික්ඛිපිය තං රජ්ජං අථ තෙනා'භියාචිතො
ධම්මං දෙසෙහි මය්හන්ති බුද්ධො හුත්වා අනුත්තරො.

---

පමණ; භත්තං, ආහාරය; ගහෙත්වාන, පිළිගෙණ (හෙවත් සිඟාගෙණ); රාජවීථියං, රාජවීථියෙහි; යුගමත්තංව, වියදණ්ඩපමණක්ම; පෙක්ඛන්තො, බලමින්; ගච්ඡන්තො, යන්නාවූ.

(207) සො, ඒ මහාබොධිසත්ත්වතෙම; මෙරුමන්ථෙන, මහාමෙරු නමැතිමතින්; මථිතං, අලලනලද්දාවූ; සමුද්දං ඉව, සමුද්‍රයමෙන්; මහාජනං, මහජනයා; ආංකුලිං කත්වා, අළලා; තම්හා, ඒ රජගහනුවරින්; පණ්ඩවපබ්බතං, පාණ්ඩවපර්වතප්‍රාන්තයට; ගන්ත්වා, ගොස්.

(208) තතො, ඉක්බිත්තෙන්; තස්සෙව, ඒ පර්වත(මස්තක)යාගේම; ඡායාය, ඡායාවෙහි; මනොරමෙ, සිත්කලුවූ; භූමිභාගෙ, භූමිප්‍රදෙශයෙක්හි; නිසින්නො, හුන්නේ; මිස්සකං භත්තං, මිශ්‍රකාහාරය; (හෙවත්) ඇඹිලිලිආහාරය; පරිභුඤ්ජිතුං, වළඳකරන්නට; ආරභි, පටන්ගත්තේයි.

(209) මහබ්බලො, මහත්වූ බලඇති; ධීරො, ප්‍රාඥවූ (ඒ මහාබොධිසත්ත්වතෙම); දෙහවම්මිකතො, ශරීරනමැති තුඹසින්; නික්ඛමන්තං, නික්මුනාවූ; අනන්තසප්පං, අතෘෂ්ණානමැති සර්පරාජයා; පච්චවෙක්ඛණමන්තෙන, ප්‍රත්‍යවෙක්‍ෂානමැති මන්ත්‍රබලයෙන්; නිවාරිය, වළකා.

(210) භුත්වාන, වළඳා; නරාසභො, නරොත්තමවූ (ඒ බොධිසත්ත්ව තෙම); බිම්බිසාරෙන නරින්දෙන, බිම්සරරජහු විසින්; උපගන්ත්වාන, සමීපයට එළඹ; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; රජ්ජෙන, රාජ්‍යයෙන්; නිමන්තිතොපි, පවරණලද්දේද.

(211) තං රජ්ජං, ඒ රාජ්‍යය; පටික්ඛිපිය, ප්‍රතික්‍ෂෙපකොට; අථ, ඉක්බිත්තෙන්; අනුත්තරො, නිරුත්තරවූ; බුද්ධො හුත්වා, බුදුව; මය්හං, මට; ධම්මං දෙසෙහි ඉති, ධර්මදෙශනාකළමැනවැයි කියා; තෙන, ඒ බිම්සරරජහු විසින්; අභියාචිතො, විශෙෂයෙන් යාච්ඤාකරණලද්දේ.

212 දත්වා පටිඤ්ඤං මනුජාධිපස්ස ධීරො'පගන්ත්වාන පධානභූමිං
අනඤ්ඤසාධාරණදුක්කරානි කත්වා තතො කිඤ්චි අපස්සමානො.

213 ඔළාරිකන්නපානානි භුඤ්ජිත්වා දෙහසම්පදං
පත්වා'ජපාලනිග්‍රොධමූලං පත්තො සුරො විය.

214 පුරත්ථා'භිමුඛො හුත්වා නිසින්නො'සි ජුතින්ධරො
දෙහවණ්ණෙහි නිග්‍රොධො හෙමවණ්ණො'සි තස්ස සො.

215 සමිද්ධපත්ථනා එකා සුජාතා නාම සුන්දරී
හෙමපාතිං සපායාසං සීසෙනා'දාය ඔනතා.

216 තස්මිං අධිගහීතස්ස රුක්ඛදෙවස්ස තාවදෙ
බලිං දම්මී'ති ගන්ත්වාන දිස්වා තං දිපදුත්තමං.

217 දෙවො'ති සඤ්ඤාය උදග්ගචිත්තා පායාසපාතිං පවරස්ස දත්වා
"ආසිංසනා ඉජ්ඣි යථා හි මය්හං තුය්හම්පි සා සාමි සමිජ්ඣතූ'ති."

---

(212) ධීරො, ප්‍රාඥවූ (බොධිසත්ත්වතෙම); මනුජාධිපස්ස, මනුජෙශ්වරවූ (ඒ බිම්සරරජහට); පටිඤ්ඤං දත්වා, ප්‍රතිඥාදී; පධානභූමිං, ප්‍රධානභූමියට; උපගන්ත්වාන, එළඹ; අනඤ්ඤසාධාරණ, අනන්‍යසාධාරණනොවන්නාවූ; දුක්කරානි, දුෂ්කරක්‍රියාවන්; කත්වා, කොට; තතො, ඒ දුෂ්කරක්‍රියායෙන්; කිඤ්චි, කිසිවක්; අපස්සමානො, නොදක්නේ.

(213) ඔළාරික, ඖදරිකවූ; අන්නපානානි, ආහාරපානවර්ගයන්; භුඤ්ජිත්වා, වළඳා; දෙහසම්පදං, ශරීරසමෘද්ධියට; පත්වා, පැමිණ; අජපාලනිග්‍රොධමූලං, අජපාලනම් න්‍යග්‍රොධවෘක්ෂසමීපයට; සුරොවිය, දිව්‍යරාජයක්හුමෙන්; පත්තො, පැමිණියේසි.

(214) ජුතින්ධරො, ඒ බොධිසත්ත්වතෙම; පුරත්ථාභිමුඛො හුත්වා, නැගෙනහිරට අභිමුඛව; නිසින්නො ආසි, හුන්නේවිය; තස්ස, ඒ බොධිසත්ත්වයන්ගේ; දෙහවණ්ණෙහි, ශරීරවර්ණයෙන්; සො නිග්‍රොධො, ඒ න්‍යග්‍රොධවෘක්ෂයතෙම; හෙමවණ්ණො ආසි, ස්වර්ණවර්ණවී.

(215) සමිද්ධපත්ථනා, සමෘද්ධවූ ප්‍රාර්ථනාඇති; සුජාතා නාම, සුජාතා නම්වූ; එකා සුන්දරී, එක්ස්ත්‍රියක්තොම; සපායාසං, පායාසසහිතවූ; හෙමපාතිං, රන්තලියක්; සීසෙන, හිසින්; ආදාය, ගෙණ; ඔනතා, නැමී.

(216) තාවදෙ, එකෙණෙහි; තස්මිං, ඒ වෘක්ෂයෙහි; අධිගහීතස්ස, අධිගෘහීතවූ; රුක්ඛදෙවස්ස, රුක්දෙවියාහට; බලිං දම්මීති, බිලි දෙමිසි; ගන්ත්වාන, ගොස්; තං දිපදුත්තමං, ඒ ද්විපදෝත්තමවූ (බොධිසත්ත්වයන්); දිස්වා, දැක.

(217) දෙවොතිසඤ්ඤාය, දිව්‍යපුත්‍රයා යන සංඥාවෙන්; උදග්ගචි

218 ඉච්චේ'වං වචනං වත්වා ගතා තම්හා වරඞ්ගනා
අථ පායාසපාතිං තං ගහෙත්වා මුනිපුඞ්ගවො.

219 ගන්ත්වා නෙරඤ්ජරාතීරං භුත්වා තං වරභොජනං
පටිසොතං පවිස්සජ්ජි තස්සා පාතිං මනොරමං.

220 ජනතාලිපාලිමනනෙත්තවිලුම්පමානං
සම්ඵුල්ලසාලවනරාජිවිරාජමානං
දෙවින්දනන්දනවනං'ව'භිනන්දනීය
මු'ය්‍යානමු'ත්තමතරං පවරො'පගන්ත්වා.

221 කත්වා දිවාවිහාරං සො සායණ්හසමයෙ තහිං
ගච්ඡං කෙසරලීලාය බොධිපාදපසන්තිකං.

---

තනා, ඔදවැඩියාවූ සිත්ඇත්තී; පායාසපාතිං, කිරිබත්තලිය; පවර සස, උතුම්වූ (බොධිසත්ත්වයන්ට); දත්වා, දී; සාමි, දිව්‍යපුත්‍රයානන් වහන්ස; මය්හං ආසිංසනා, මාගේ චිත්තප්‍රාර්ථනාව; යථා ඉජ්ඣි, යම් සේ සමෘද්ධවීද; තුය්හම්පි, නුබවහන්සේගේ ද; සා ආසිංසනා, ඒ ප්‍රාර්ථනාව; තථා සමිජ්ඣතූති, එසේම සමෘද්ධවේවයි කියා.

(218) ඉච්චෙවං, මෙසේ (යථොක්තප්‍රකාරයෙන්); වචනං වත්වා, වචනය කියා; වරඞ්ගනා, උත්තමස්ත්‍රීතොම; තම්හා, ඒ ස්ථානයෙන්; ගතා, ගියාය; අථ, ඉක්බිත්තෙන්; මුනිපුඞ්ගවො, තපස්විශ්‍රෙෂ්ඨවූ (මහාබොධිසත්ත්වතෙම); තං පායාසපාතිං, ඒ කිරිබත්තලිය; ගහෙත්වා, ගෙණ.

(219) නෙරඤ්ජරාතීරං ගන්ත්වා, නෙරඤ්ජරානම් ගංතෙරට ගොස්; තං වරභොජනං, ඒ උතුම්වූ භොජනය; භුත්වා, වළඳා; මනොරමං, සිත්කලුවූ; තං පාතිං, ඒ රන්තලිය; තස්සා, ඒ නෙරඤ්ජරානම්ගඞ්ගා වගේ; පටිසොතං, උඩුගඟට; පවිස්සජ්ජි, හළේයි.

(220) පවරො, උතුම්වූ (මහාබොධිසත්ත්වතෙම); ජනතාලිපාලි, සත්ත්වනමැති භෘඞ්ගපඞ්ක්තීන්ගේ; මන, චිත්තයද; නෙත්ත, නෙත්‍රයද; විලුම්පමානං, පැහැරගන්නාවූ; සම්ඵුල්ල, සුපුෂ්පිතවූ; සාලවන රාජි, සාලවනරෙඛාවෙන්; විරාජමානං, බබලන්නාවූ; දෙවින්ද, ශක්‍ර දෙවෙන්ද්‍රයාගේ; නන්දනවනං ඉව, නන්දනොද්‍යානයමෙන්; අභිනන්දනීයං, විශෙෂයෙන් සන්තොෂකටයුතුවූ; උත්තමතරං, අතිශයින් උතුම්වූ; උය්‍යානං, උද්‍යානයට; උපගන්ත්වා, එළඹ.

(221) සො, ඒ මහාබොධිසත්ත්වතෙම; තහිං, ඒ සාලවනයෙහි; දිවාවිහාරං කත්වා, දිවාවිහාරකොට; සායණ්හසමයෙ, සවස්වේලෙහි බොධිපාදපසන්තිකං, බොධිවෘක්ෂසමීපයට; කෙසරලීලාය, කෙසර සිංහලීලායෙන්; ගච්ඡං, යන්නේ.

222 බ්‍රහ්මාසුරාසුරමහොරගපක්ඛිරාජ
සංසජ්ජිතොරුවට්ටුමෙ දිපදුත්තමිඤ්ඤ
පායාසි සොත්ථියද්විජො තිණහාරකො තං
දිස්වාන තස්ස අදදා තිණමුට්ඨියො සො.

223 ඉන්දීවරාරවින්දාදිකුසුමාන'ම්බරා තහිං
පතන්ති වුට්ඨිධාරා'ව ගච්ඡන්තෙ දිපදුත්තමෙ.

224 චාරුචන්දනචුණ්ණාදි'ධූපගන්ධෙහි නෙකධා
අනොකාසො'සි ආකාසො ගච්ඡන්තෙ දිපදුත්තමෙ.

225 රතනුජ්ජලඡත්තෙහි චාරුහෙමද්ධජෙහි ච
අනොකාසො'සි ආකාසො ගච්ඡන්තෙ දිපදුත්තමෙ.

---

(222) දිපදුත්තමිඤ්ඤ, ව්පදෛත්තමවූ; සො, ඒ මහාබොධිසත්ත්ව තෙම; බ්‍රහ්ම, බ්‍රහ්මයන් විසින්ද; අසුර, අසුරයන් විසින්ද; සුර, දෙවියන්විසින්ද; මහොරග, මහත්වූ දිව්‍යනාගමානවකයන්විසින්ද; පක්ඛිරාජ, ගරුඩරාජයන් විසින්ද; සංසජ්ජිත, විශෙෂයෙන් සර හනලද; උරු, මහත්වූ; වට්ටුමෙ, මාර්ගයෙහි; පායාසි, නික්මුනේය; තිණහාරකො, තණගෙණඑන්නාවූ; සොත්ථියද්විජො, සොත්ථියනම් බ්‍රාහ්මණයෙක්; තං, ඒ මහාබොධිසත්ත්වයන්; දිස්වා, දැක; තස්ස, ඒ මහා බොධිසත්ත්වයන්ට; තිණමුට්ඨියො, තණ(අට)මිටක්; අදදා, දීනී.

(223) දිපදුත්තමෙ, ව්පදෛත්තමවූ; (ඒ බොධිසත්ත්වයන්); ගච්ඡන්තෙ, යන්නටපටන්ගත්කල්හි; තහිං, ඒ මාර්ගයෙහි; ඉන්දීවර, නිලුපුල්මල්හා; අරවින්දාදි, පියුම්ආදීවූ; කුසුමානි, පුෂ්පයෝ; අම්බරා, ආකාශයෙන්; වුට්ඨිධාරා ඉව, වර්‍ෂාධාරාවන්මෙන්; පතන්ති, හෙන්නාහුයි.

(224) දිපදුත්තමෙ, ව්පදෛත්තමවූ (ඒ මහා බොධිසත්ත්වයන්); ගච්ඡන්තෙ, යන්නටපටන්ගත් කල්හි; චාරු, මනොඥවූ; චන්දනචුණ්ණාදි, සඳුන්සුණුආදීවූ; ධූපගන්ධෙහි, සුවඳදුමින්; ආකාසො, ආකාශයතෙම; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; අනොකාසො ආසි, අනවසරවී.

(225) දිපදුත්තමෙ, ව්පදෛත්තමවූ (ඒ මහාබොධිසත්ත්වයන්); ගච්ඡන්තෙ, යන්නටපටන්ගත්කල්හි; රතන, රත්නයෙන්; උජ්ජල, දිලියෙන්නාවූ; ඡත්තෙහි, ඡත්‍රයෙන්ද; චාරු, මනොඥවූ; හෙමද්ධජෙහිච, රන්ධ්වජයෙන්ද; ආකාසො, ආකාශයතෙම; අනොකාසො ආසි, අනවසරවී.

226 වෙළුකෙබපසහසෙසහි කීළනෙතහි මරූහි'පි
අනොකාසො'සි ආකාසො ගච්ඡනෙත දිපදුතතමෙ.

227 සුරදුඳුභිවජ්ජානි කරොනෙතහි මරූහි'පි
අනොකාසො'සි ආකාසො ගච්ඡනෙත දිපදුතතමෙ.

228 සුරඞගනාහි සඞගීතිං ගායනතීහි'පි'නෙකධා
අනොකාසො'සි ආකාසො ගච්ඡනෙත දිපදුතතමෙ.

229 මනොරමා කිණණරකිණණරඞගනා
මනොරමඞගා උරගොරගඞගනා
මනොරමෙ තමහි ච නචචගීතියො
මනොරමා'නෙකවිධා පවතතයුං.

230 තදා මහොසෙ'ව මහාමහෙහි
පවතතමානෙ ඉති සො මහායසො
තිණෙණ ගහෙතවා තිභවෙකනායකො
උපාගතො බොධිදුමිඳසනතිකං.

---

(226) දිපදුත්තමෙ, ද්විපදෝත්තමවූ; (ඒ මහාබෝධිසත්ත්වයන්) ගච්ඡනෙත, යන්නටපටන්ගත්කල්හි; වේළුකෙබපසහසෙසහි දහස් ගණන්පිළිහිසනටවා; කීළනෙතහි, කෙළනාවූ; මරූහිපි, දෙවියන් විසිනුදු; ආකාසො, ආකාශයතෙම; අනොකාසො ආසි, අනවසරවී.

(227) දිපදුත්තමෙ, ද්විපදෝත්තමවූ; (ඒ මහාබෝධිසත්ත්වයන්); ගච්ඡනෙත, යන්නටපටන්ගත්කල්හි; සුරදුඳුභිවජ්ජානි, දිව්‍යභෙරිනාදයන්; කරොනෙතහි, කරන්නාවූ; මරූහිපි, දෙවියන්විසිනුදු; ආකාසො, ආකාශය; අනොකාසො ආසි, අනවසරවී.

(228) දිපදුත්තමෙ, ද්විපදෝත්තමවූ; (ඒ මහාබෝධිසත්ත්වයන්); ගච්ඡනෙත, යන්නටපටන්ගත්කල්හි; සඞගීතිං, මනාවූගායනාවන්; ගායනතීහි, ගායනාකරන්නාවූ; සුරඞගනාහිපි, දිව්‍යාඞගනාවන් විසිනුදු; ආකාසො, ආකාශයතෙම; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; අනොකාසො ආසි, අනවසරවී.

(229) මනොරමා, සිත්කලුවූ; කිණණරකිණණරඞගනා, කිම්පුරුෂකිණණරාඞගනාවෝද; මනොරමා, සිත්කලුවූ; අඞගා, අවයවයන් ඇති; උරගොරගඞගනා, නාගමානවකයන්හා නාගමානවිකාවෝද; මනොරමා, සිත්කලුවූ; නචචගීතියො, නෘත්‍යගීතීහුද; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; පවතතයුං, පැවැත්වූවාහුයි.

(230) තිභවෙකනායකො, භවත්‍රයට එකනායකවූ; මහායසො, මහත්වූ යසපිරිවරඇති; (සො ජිනො, ඒ මහාබෝධිසත්ත්වතෙම);

231 විද්දුමාසිතසෙලග්ගරජතාවලසන්නිභං
කත්වා පදක්ඛිණං බොධිපාදපං දිපදුත්තමො.

232 පුරත්ථිමදිසාභාගෙ අචලෙ රණධංසකෙ
මහීතලෙ ඨිතො ධීරො චාලෙසි තිණමුට්ඨියො.

233 චුද්දසහත්ථමත්තො සො පල්ලඞ්කො ආසි තාවදෙ
අථ තං අබ්භුතං දිස්වා මහාපඤ්ඤො විචින්තයි.

234 "මංසලොහිතමට්ඨී ච නහාරූ ච තචො ච මෙ
කාමං සුස්සතු නෙවා'හං ජහාමි විරියං"ඉති.

235 ආභුජිත්වා මහාවීරො පල්ලඞ්කම'පරාජිතං
පාචීනාභිමුඛො තස්මිං නිසීදි දිපදුත්තමො.

---

ඉති, මෙසේ; තදා, එසමයෙහි; මහොඝෙ ඉව, මහවතුරක්මෙන්; මහාමහෙ, මහත්වූපූජා; පවත්තමානෙ, පවත්වනකල්හි; තිණෙ ගහෙත්වා, තණ(අට)මිටක් ගෙණ; බොධිදුමින්දසන්තිකං, බොධිද්‍රුමමූලයටම; උපාගතො, එළඹුනේයි.

(231) දිපදුත්තමො, ද්විපදෝත්තමවූ; (ඒ බොධිසත්ත්වතෙම); විද්දුම, ප්‍රවාලාඞ්කුරහා සමානවූද; අසිතසෙල, ඉන්ද්‍රනීලමාණික්‍ය හා සමානවූද; අග්ග, අග්‍රඇති; රජතාවලසන්නිභං, රජතපර්වතයක් හා සමානවූ; බොධිපාදපං, බොධිවෘක්ෂය; පදක්ඛිණං කත්වා, පැදකුණුකොට.

(232) පුරත්ථිමදිසාභාගෙ, පූර්වදික්භාගයෙහි; අචලෙ, නිශ්චලවූ; රණධංසකෙ, ශත්‍රුවිනාසයකරන්නාවූ; මහීතලෙ, පෘථිවීතලයෙහි; ඨිතො, සිටියාවූ; ධීරො, ප්‍රාඥවූ; (ඒ බොධිසත්ත්වතෙම); තිණමුට්ඨියො, තණ(අට)මිට; චාලෙසි, සැලී.

(233) තාවදෙ, එකෙණෙහි; චුද්දසහත්ථමත්තො, තුදුස්රියන් පමණ උසඇති; පල්ලඞ්කො, පර්‍ය්‍යඞ්කයතෙම; ආසි, වී; අථ, ඉක්බිත්තෙන්; තං අබ්භුතං දිස්වා, ඒ ආශ්චර්‍ය්‍යය දැක; මහාපඤ්ඤො, මහත්වූ ප්‍රඥාඇති; සො, ඒ මහාබොධිසත්ත්වතෙම; විචින්තයි, (මෙසේ) සිතී.

(234) මෙ, මාගේ; මංස, ශරීරමාංශයද; ලොහිතං, රුධිරයද; අට්ඨීච, ඇටද; නහාරූච, නහරද; තචොච, සමද; කාමං, ඒකාන්තයෙන්; සුස්සතු, වියලියේවයි; අහං, මම; විරියං, චතුරඞ්ගසමන්නාගතවීර්‍ය්‍යාධිෂ්ඨානයන්; නෙව ජහාමි ඉති, නොහරිමියි.

(235) මහාවීරො, මහත්වූවීර්‍ය්‍ය ඇති; දිපදුත්තමො, ද්විපදෝත්තම වූ (ඒ බොධිසත්ත්වතෙම); අපරාජිතං පල්ලඞ්කං, අපරාජිතපර්‍ය්‍යඞ්කය, ආභුජිත්වා, බැඳ; පාචීනාභිමුඛො, පූර්වදිගට අභිමුඛව; තස්මිං, ඒ වජ්‍රාසනමස්තකයෙහි; නිසීදි, හුන්නේයි.

236 දෙවදෙවස්ස දෙවින්දො සඞ්ඛමා'දය තාවදෙ
වීසුත්තරසතුබ්බෙධං ධමයන්තො තහිං ඨිතො.

237 දුතියං පුණ්ණචන්දං'ව සෙතච්ඡත්තං තියොජනං
ධාරයන්තො ඨිතො සම්මා මහාබ්‍රහ්මා සහම්පති.

238 චාරුචාමරමා'දාය සුයාමො'පි සුරාධිපො
වීජයන්තො ඨිතො තත්ථ මන්දං මන්දං තිගාවුතං.

239 බෙලුවං වීණමා'දාය සුරොපඤ්චසිඛව්හයො
නානාවිධලයොපෙතං වාදයන්තො තථා ඨිතො.

240 ථුතිගීතානි ගායන්තො නාටකීහි පුරක්ඛතො
තථෙ'ව'ට්ඨාසි සො නාගරාජා කාලව්හයො'පි ච.

241 ගහෙත්වා හෙමමඤ්ජූසා සුරපුප්ඵෙහි පූරිතා
පූජයන්තා'ව අට්ඨංසු බත්තිංසා'පි කුමාරිකා.

---

(236) තාවදෙ, එකෙණෙහි; දෙවින්දො, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; දෙවදෙවස්ස, දෙවාතිදෙවවූ (ඒ බොධිසත්ත්වයන්ට); වීසුත්තරසතුබ්බෙධං, එක්සියවිසිරියන් පමණ දිග ඇති; සඞ්ඛමාදය, දක්ෂිණාවෘත්ත ශ්වෙතසඞ්ඛය ගෙණ; ධමයන්තො, පිඹිමින්; තහිං, ඒ ස්ථානයෙහි; ඨිතො, සිටියේයි.

(237) සහම්පති මහාබ්‍රහ්මා, සහම්පතීමහාබ්‍රහ්මතෙම; දුතියං, දෙවැනිවූ; පුණ්ණචන්දං ඉව, පූර්ණචන්ද්‍රයාවැනිවූ; තියොජනං, තුන් යොදුනක් පමණ දිගපුළුල ඇති; සෙතච්ඡත්තං, ධවලච්ඡත්‍රය; සම්මා, මනාකොට; ධාරයන්තො, දරමින්; ඨිතො, සිටියේයි.

(238) සුයාමොපි සුරාධිපො, සුයාමනම්දිව්‍යපුත්‍රද; තිගාවුතං, තුන් ගවුවක් පමණ දිග ඇති; චාරු, මනොඥවූ; චාමරමාදය, වල්විදුනාව ගෙණ; මන්දං මන්දං, මදින් මදින්; වීජයන්තො, සලමින්; තත්ථ, ඒ ස්ථානයෙහි; ඨිතො, සිටියේයි.

(239) පඤ්චසිඛව්හයො සුරො, පඤ්චශිඛනම්දිව්‍යපුත්‍රතෙම; නානාවිධලයොපෙතං, අනෙකප්‍රකාරලයින් යුක්තවූ; බෙලුවං වීණමාදය, බෙලුවනම්පාණ්ඩුවීණාවගෙණ; වාදයන්තො, ගායනාකෙරෙමින්; තථා ඨිතො, එපරිද්දෙන්ම සිටියේයි.

(240) සො කාලව්හයො නාගරාජාපි ච, ඒ කාලනම්නාගරාජයාද; නාටකීහි, නාටකස්ත්‍රීන් විසින්; පුරක්ඛතො, පිරිවරණලදුව; ථුති ගීතානි, ස්තුතිගායනාවන්; ගායන්තො, ගායනාකෙරෙමින්; තථෙව, එසේම; අට්ඨාසි, සිටියේයි.

(241) සුරපුප්ඵෙහි, දිව්‍යකුසුමයෙන්; පූරිතා, පුරණලද; හෙමමඤ්ජූසා, ස්වර්ණමඤ්ජූසාවන් (හෙවත් රන්කරඬු); ගහෙත්වා, ගෙණ;

242 සඉන්දදෙවසඞ්ඝෙහි තෙහි ඉත්ථං මහාමහෙ
වත්තමානෙ තදා මාරො පාපිමා ඉති චින්තයි.

243 “අතික්කමිතුකාමො’යං කුමාරො විසයං මම
සිද්ධත්ථො අථ සිද්ධත්ථං කරිස්සාමී”ති තාවදෙ.

244 මාපෙත්වා හිංසනතරොරුසහස්සබාහුං
සඞ්ගය්හ තෙහි ජලිතා විවිධායුධානි
ආරුය්හ වාරු දිරදං ගිරිමෙඛලාක්ඛ්‍යං
චණ්ඩං දියඩ්ඪසතයොජනමායතං තං.

245 නානානනාය’නලවණ්ණසිරොරුහාය
රත්තොරුවට්ටබහිනිග්ගතලොචනාය
දට්ඨොට්ඨහිංසනමුඛාය’රගබ්භුජාය
සෙනාය සො පරිවුතො විවිධායුධාය.

---

බත්තිංසාපි කුමාරිකා, දෙතිස්දිව්‍යාඞ්ගනාවෝද; පූජයන්තාව, පුදමින් ම; අට්ඨංසු, සිටියාහුයි.

(242) තදා, එකල්හි; සඉන්ද, ශක්‍රදෙවෙන්ද්‍රයන් සහිතවූ; තෙහි දෙවසඞ්ඝෙහි, ඒ දිව්‍යසමූහයා විසින්; ඉත්ථං, මෙසේ; (යථොක්ත ප්‍රකාරයෙන්); මහාමහෙ, මහත්වූ පූජා; වත්තමානෙ, පවත්වමින් සිටිකල්හි; පාපිමා, පාපිවූ; මාරො, වශවර්ත්තිමාරතෙම; ඉති චින්තයි, මෙසේ සිතීය.

(243) අථ, ඉක්බිත්තෙන්; අයං සිද්ධත්ථො කුමාරො, මේ සිද්ධාර්ථ කුමාරතෙම; මම, මාගේ; විසයං, විෂය; අතික්කමිතුකාමො, ඉක්ම වනුකැමැත්තේය; (එහෙයින්) තං, ඔහු; අසිද්ධත්ථං කරිස්සාමීති, අනිෂ්පන්නාර්ථකරන්නෙමියි; තාවදෙ, එකෙණෙහි.

(244) හිංසනතර, අතිශයින්භයඞ්කරවූ; උරු, මහත්වූ; සහස්සබාහුං, දහසක් අත්; මාපෙත්වා, මවා; තෙහි, ඒ දහසක් අතින්; ජලිතා, දිලියෙන්නාවූ; විවිධායුධානි, අනෙකප්‍රකාරවූ ආයුධයන්; සඞ්ගය්හ, ගෙණ; චණ්ඩං, දරුණුවූ; දියඩ්ඪසතයොජනමායතං, යොළසියයක් යොදුන් උසඇති; වාරු, මනොඥවූ; තං ගිරිමෙඛලාඛ්‍යං, ඒ ගිරිමෙඛලානම්හස්තිරාජයාහට; ආරුය්හ, නැගී.

(245) නානා, අනෙකප්‍රකාරවූ; ආනනාය, මුහුණු ඇති; අනලවණ්ණ, වහ්නිවර්ණවූ; සිරොරුහාය, කෙස්හා දැළිරැවුලු ඇති; රත්ත, රත්වූ; උරු, මහත්වූ; වට්ට, වටවූ; බහිනිග්ගත, පිටතට නික්මුනාවූ; ලොචනාය, ඇස් ඇති; දට්ඨ, ඩහනලද; ඔට්ඨ, ඔෂ්ඨයෙන්; (හෙවත් පිටිතොල් ඩැමෙන්); හිංසන, භයඞ්කරවූ; මුඛාය, මුහුණු ඇති; උරගබ්භුජාය, සර්පාහාරයෙන් වලඳනාලද බාහු ඇති; විවිධායුධාය, අනෙකප්‍රකාර ආයුධගත් ඇත්ඇති; සෙනාය, සෙනාව විසින්; පරිවුතො, පිරිවරණලද්දවූ; සො, ඒ වශවර්ත්තිමාරතෙම.

246 තතෝ'පගම්ම අතිභීමරවං රවන්තො
සිද්ධත්ථමේ'ථ ඉති ගණ්හථ බන්ධථේ'මං
ආණාපයං සුරගණං සහදස්සනෙන
චණ්ඩානිලුග්ගතපිචුං'ව පලාපයිත්ථ.

247 ගම්භීරමෙඝරවසන්නිභචණ්ඩනාදං
වාතංච මාපිය තතො සුභගස්ස තස්ස
කණ්ණම්පි චීවරවරස්ස මනොරමස්ස
නො ආසි සෙව චලිතුං පහු අන්තකෝ'පි.

248 සංවට්ටවුට්ඨිජවසන්නිභභීමඝොර
වස්සං පවස්සිය තතො'දකබින්දුකම්පි
නාසක්ඛි තෙතුම'තුලස්ස සමීපකම්පි
දිස්වා තම'බ්භුතම'ථො'පි සුදුම්මුඛො සො.

---

(246) තත්ථ, ඒ බොධිද්‍රුමසමීපයට; උපගම්ම, එළඹ; අතිභීම, අති ශයින් භයඞ්කරවූ; රවං රවන්තො, නාදපවත්වන්නේ; එථ, (කොල මෙසේ) එව; ඉමං සිද්ධත්ථං, මේ සිද්ධාර්ථකුමාරයා; ගණ්හථ, ගණුව; බන්ධථ, බඳුව; (හනථ ඉති, මරවයි කියා); ආණාපයං, නියොග කෙරෙමින්; සහදස්සනෙන, (තමාගේ) දර්ශනය හා සමග; සුරගණං, දිව්‍යසමූහයා; චණ්ඩානිල, චණ්ඩමාරුතයෙන්; උග්ගත, නැංගාවූ; පිචුං ඉව, පුලුන්රලක් පරිද්දෙන්; පලාපයිත්ථ, පැලවී.

(247–248) ගම්භීර, ගැඹුරුවූ; මෙඝරවසන්නිභ, මෙඝධ්වනියක් හා සමානවූ; චණ්ඩනාදං, දරුණුවූ නාදඇති; වාතංච, මාරුතයකුදු; මාපිය, මවා; තතො, ඒ මාරුතයෙන්; සුභගස්ස, සුභලක්ෂණ ඇත්තාවූ; තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ; මනොරමස්ස, සිත්කලුවූ; චීවරවරස්ස, උතුම්චීවරයාගේ; කණ්ණම්පි, කොණකුදු; චලිතුං, සොලවන්නට; අන්තකො, වශවර්තිමාරතෙම; නො පහු ආසියෙව, නොමසමර්ථවී; අථ, ඉක්බිත්තෙන්; සංවට්ටවුට්ඨිජවසන්නිභ, කල්පාන්තවර්ෂාවෙගයක් හා සමානවූ; භීම, භයඞ්කරවූ; ඝොර, දරුණුවූ; වස්සං, වර්ෂාවක්; පවස්සිය, වස්වා; තතො, ඒ වර්ෂාවෙන්; උදකබින්දුකම්පි, ජලබින්දුවක් පමණකුදු; අතුලස්ස, අසදෘශවූ (ඒ මහාබොධිසත්ත්වයන්ගේ); සමීපකම්පි, සමීපයටද; තෙතුං, පමුණුවන්නට; නාසක්ඛි, අසමර්ථවිය; තං අබ්භුතං, ඒ ආශ්චර්යය; දිස්වා, දැක; අථොපි, නැවතද; සුදුම්මුඛො, විශෙෂයෙන් දුර්මුඛවූ; සො, ඒ වශවර්ති මාරතෙම.

249 අච්චන්තභීමනලඅච්චිසමුජ්ජලොරු
පාසාණභස්මකලලායුධවස්සධාරා
අඞ්ගාරපජ්ජලිතවාලුකවස්සධාරා
වස්සාපයිත්ථ සකලානි ඉමානි තානි.

250 මාරානුභාවබලතො නභතො'පගන්ත්වා
පත්වාන පුඤ්ඤසිඛරුග්ගතසන්තිකං තු
මාලාගුලප්පභූතිභාවගතානි'ථාපි
ලොකන්තරෙ'ව තිමිරං තිමිරං සුඝොරං.

251 මාපෙත්වා මොහතිමිරම්පි හතස්ස තස්ස
දෙහප්පභාහි සතරංසිසතොදිතං'ව
ජාතං මනොරමතරං අතිදස්සනීය
මා'ලොකපුඤ්ජ ම'වලොකිය පාපධම්මො.

---

(249) අච්චන්ත, අතිශයින්; භීම, භයඞ්කරවූ; අනලඅච්චි, වහ්නිශිඛාවෙන්; සමුජ්ජල, දිලියෙන්නාවූ; උරු, මහත්වූ; පාසාණ, පාෂාණවර්ෂාධාරාවක්ද; භස්ම, භෂ්මවර්ෂාධාරාවක්ද; කලල, කලල්වර්ෂාධාරාවක්ද; ආයුධවස්සධාරා, ආයුධවර්ෂාධාරාවක්ද; අඞ්ගාරපජ්ජලිත, දිලියෙන්නාවූ කිහිරඟුරුවර්ෂාධාරාවක්ද; වාලුකවස්සධාරා, වාලුකාවර්ෂාධාරාවක්දැයි යන; තානි ඉමානි සකලානි, ඒ මේ සියලු වර්ෂාධාරාවන්; වස්සාපයිත්ථ, වැස්වී.

(250) මාර, වශවර්ත්තිමාරයාගේ; ආනුභාවබලතො, ආනුභාවමහිමයෙන්; නභතො, ආකාශයෙන්; උපගන්ත්වා, සමීපයට අවුත්; පුඤ්ඤසිඛරුග්ගත සන්තිකංතු, කුශලයෙහි මස්තකප්‍රාප්තවූ ඒ මහාබොධිසත්ත්වයන් සමීපයට වනාහි; පත්වාන, පැමිණ; මාලාගුලප්පභූතිභාවගතානි, මල්වැටආදි බවට පැමිණියහ; අථාපි, නැවතද; ලොකන්තරෙ, ලොකාන්තරිකමහානරකයෙහිද; තිමිරං ඉව, අන්ධකාරයක්වැනිවූ; සුඝොරං, අතිශයින් දරුණු; තිමිරං, අන්ධකාරයක්.

(251) මාපෙත්වා, මවා; මොහතිමිරංපි, මොහනමැති අන්ධකාරයද; හතස්ස, නසනලද; තස්ස, ඒ මහාබොධිසත්ත්වයන්ගේ; දෙහප්පභාහි, ශරීරාලොකයෙන්; සතරංසිසතොදිතංව, සියගණන් හිරුනැංගාක්මෙන්; ජාතං, පහළවූ; මනොරමතරං, අතිශයින් සිත්කලුවූ; අතිදස්සනීයං, අතිශයින් දර්ශනීයවූ; (තං) ආලොකපුඤ්ජං, (ඒ) ආලොකසමූහය; අවලොකිය, බලා; පාපධම්මො, පව්ටුවූ සවභාව ඇති (ඒ වශවර්ත්තිමාරතෙම).

252 කොපොපරත්තවදනො භූකුටිපප්වාරා
අච්චන්තභිංසනවිරූපකවෙසධාරී
අච්චන්තතිණ්හතරධාරමසඞ්ගමෙ'ව
චක්කායුධං වරතරං අපි මෙරුරාජං.

253 සඞ්ඛණ්ඩයන්තමි'ව දූලකලීරඛණ්ඩං
විස්සජ්ජි තෙන'පි න කිඤ්චි ගුණාකරස්ස
කාතුං පහුත්තමු'පගඤ්ඡි තතො තමෙත්‍ය
ගන්ත්වා නභා කුසුමඡත්තතමා'ග සීසං.

254 විස්සජ්ජිතා'පි සෙනාය සෙලකූටාතලාකුලා
පගන්ත්වා නභසා මාලාගුලත්තං සමුපාගතා.

255 තම්පි දිස්වා සසොකො සො ගන්ත්වා ධීරස්ස සන්තිකං
පාපුණාති මමෙවා'යං පල්ලඞ්කො අපරාජිතො.

---

(252) කොප, කොපයෙන්; උපරත්ත, අතිශයින්රත්වූ; වදනො, මුහුණුඇත්තේ; භූකුටිපප්වාරා, භ්‍රෑසඤ්චාරණයෙන්; (හෙවත් බැම් බිඳහෙලීමෙන්); අච්චන්ත, අතිශයින්; භිංසන, භයඞ්කරවූ; විරූපක වෙසධාරී, විරූපවූ වෙස්දරණසුලුවූයේ; අච්චන්ත, අතිශයින්; තිණ්හ තරධාරං, ඉතා තියුණුවූ මුවහත් ඇති; අසඞ්ගමෙව, අසඞ්ඛලිතවූම; (නොහොත් පැකිලීමක් නැත්තාවූම); වරතරං, ඉතා උතුම්වූ; මෙරුරා ජං අපි, මෙරුපර්වතරාජයාද.

(253) දූලකලීරඛණ්ඩං ඉව, මහත්වූ කිලිල්කඩක්මෙන්; සඞ්ඛණ්ඩ යන්තං, කඩකරන්නාවූ; චක්කායුධං, චක්‍රායුධය; විස්සජ්ජි, දැමීය; තෙනපි, ඒ චක්‍රායුධයෙනුදු; ගුණාකරස්ස, ගුණයට උත්පත්තිස්ථා නවූ (ඒ බොධිසත්ත්වයන්ට); කිඤ්චිකාතුං, කිසිවක්කරන්නට; පහු ත්තං, පොහොසත්බවට; නඋපගඤ්ඡි, නොපැමිණියේය; තතො, ඉක්බින්තෙන්; තං එතං, ඒ මේ චක්‍රායුධය; නභා, ආකාශයෙන්; ගන්ත්වා, ගොස්; සීසං, මස්තකයට; කුසුමඡත්තතං, පුෂ්පඡත්‍රබවට ආග, පැමිණියේයි.

(254) සෙනාය, සෙනාව විසින්; විස්සජ්ජිතාපි, හරණලද්දාවූද; තලාකුලා, වහනීන්ගැවසීගත්තාවූ; සෙලකූටා, පර්වතකූටයෝ; නභසා, ආකාශයෙන්; උපගන්ත්වා, සමීපයටගොස්; මාලාගුලත්තං, මල්වැටබවට; සමුපාගතා, පැමිණියාහුයි.

(255) තම්පි දිස්වා, හෙද දැක; සසොකො, සොකසහිතවූ; සො, ඒ වශවර්තිමාරතෙම; ධීරස්ස සන්තිකං, ධෛර්‍ය්‍යගුණයෙන් යුක්තවූ (ඒ මහාබොධිසත්ත්වයන්) සමීපයට; ගන්ත්වා, ගොස්; අයං අපරාජි තො පල්ලඞ්කො, මේ අපරාජිතපර්‍ය්‍යඞ්කය; මමෙව පාපුණාති, මටම පැමිණෙන්නේයි.

256 ඉතො උට්ඨෙහ පල්ලඞ්කා ඉති'භාසිත්ථ ධීමතො
කතකල්‍යාණකම්මස්ස පල්ලඞ්කත්ථාය මාර තෙ.

257 කො සක්ඛී'ති පවුත්තො සො ඉමෙ සබ්බෙ'ති සක්ඛිනො
සෙනාය'භිමුඛං හත්ථං පසාරෙත්වාන පාපිමා.

258 ඝොරනාදෙන'හං සක්ඛි අහං සක්ඛී'ති තාය'පි
සක්ඛිභාවං වදාපෙත්වා තස්සෙ'වං සමුදීරයි.

259 කො තෙ සිද්ධත්ථ සක්ඛී'ති අථ තෙනා'තුලෙන'පි
මමෙ'ත්ථ සක්ඛිනො මාර නසන්තී'ති සචෙතනා.

260 රත්තමෙඝොපනික්ඛන්තහෙමවිජ්ජුවභාසුරං
නීහරිත්වා සුරත්තමහා චීවරා දක්ඛිණං කරං.

261 භූමියා'භිමුඛං කත්වා කස්මා පාරමීභූමියං
උන්නාදෙත්වා ති'දානෙ'වං නිස්සද්දාසී'ති භූමියා.

---

(256) ඉතො පල්ලඞ්කා, මේ පර්‍යඞ්කයෙන්; උට්ඨෙහ ඉති, නැගී සිටුවයිකියා; ධීමතො, ප්‍රාඥවූ; කතකල්‍යාණකම්මස්ස, කරණලද කුසල්ඇති (මහාබොධිසත්ත්වයන්ට); අභාසිත්ථ, කීය; පල්ලඞ්කත්ථාය, පර්‍යඞ්කය පිණිස; මාර, වශවර්ත්තිමාරය; තෙ, තට.

(257) කො සක්ඛීති, කවරෙක් සාක්ෂිදැයි; පවුත්තො, කියනලද්දවූ; සො පාපිමා, ඒ පාපිවූ වශවර්ත්තිමාරතෙම; ඉමෙ සබ්බෙ, මොහු හැමදෙන; සක්ඛිනො ඉති, සාක්ෂියයි; සෙනාය, සෙනාවට; අභිමුඛං, අභිමුඛව; හත්ථං පසාරෙත්වාන, අත දිගුකොට.

(258) ඝොරනාදෙන, දරුණුවූනාදයෙන්; අහං සක්ඛි අහං සක්ඛීති, මම සාක්ෂිය මම සාක්ෂියයි කියා; තායපි, ඒ මාරසෙනාවලවාද; සක්ඛිභාවං, සාක්ෂිභාවය; වදාපෙත්වා, කියවා; තස්ස, ඒ බොධිසත්ත්වයන්ට; එවං සමුදීරයි, මෙසේ කී.

(259) සිද්ධත්ථ, සිද්ධාර්ථකුමාරයෙනි; තෙ, තොපට; කො සක්ඛීති, කවරෙක් සාක්ෂිදැයි (කීකල්හි); අථ, ඉක්බිත්තෙන්; අතුලෙන, අසදෘශවූ; තෙනාපි, ඒ මහාබොධිසත්ත්වයන් විසිනුදු; මාර, වශවර්ත්තිමාරය; මම, මට; එත්ථ, මෙතැන්හි; සචෙතනා, චෙතනාසහිතවූ; සක්ඛිනො, සාක්ෂීනු; නසන්තීති, නැතැයි.

(260) රත්තමෙඝ, රත්වූමෙඝපටලයකින්; උපනික්ඛන්ත, නික්මුනාවූ; හෙමවිජ්ජු ඉව, රන්විදුලියක්මෙන්; භාසුරං, බබලන්නාවූ; දක්ඛිණං කරං, දක්ෂිණ ශ්‍රීහස්තය; සුරත්තමහා, අතිශයින්රත්වූ; චීවරා, සිවුරෙන්; නීහරිත්වා, පිටත්කොට.

(261) භූමියා, බිමට; අභිමුඛං කත්වා, අභිමුඛකොට; පාරමීභූමියං, පාරමිතාභූමියෙහි; උන්නාදෙත්වාන, නාදකොට; ඉදානි, දැන්; කස්මා කවරකාරණයකින්; එවංනිස්සද්දාසීති, මෙසේ නිශ්ශබ්දවූයෙහිදැයි (කීකල්හි); භූමියා, භූමිය විසින්.

262 මුඛවාපිතෙ රවෙ නෙකසතෙ මෙඝරවෙ යථා
බුද්ධනාගබලා නාගං ජාණූහි සුප්පතිට්ඨිතං.

263 දිස්වාන්'දනි ගණ්හාති'දනි ගණ්හාති චින්තිය
සම්භින්නදාඨසප්පො'ව හතදප්පො සුදුම්මුඛො.

264 පහාය'යුධවත්ථානි'ලඞ්කාරානි අනෙකධා
චක්කවාළාචලා යාව සසෙනාය පලායි සො.

265 තං මාරසෙනං සභයං සසොකං පලායමානං ඉති දෙවසඞ්ඝා
දිස්වාන මාරස්ස පරාජයො'යං ජයො'ති සිද්ධත්ථකුමාරකස්ස.

266 සම්මොදමානා අභිපූජයන්තා ධීරං සුගන්ධප්පභුතීහි තස්මිං
පුනා'ගතා නෙකථුතීහි සම්මා උග්ඝොසමානා ජිනවෙසධාරි.

---

(262) මෙඝරවෙ යථා, මෙඝධ්වනියක්මෙන්; නෙකසතෙ, නොයෙක් සියගණන්; රවෙ, නාදය; මුඛවාපිතෙ, පැවැත්වූකල්හි; බුද්ධනාගබලා, සර්වඥනමැතිහස්තිරාජයාගේ බලයෙන්; නාගං, (ඒ ගිරිමෙඛලනම්) හස්තිරාජයා; ජාණූහි, දෙදනින්; සුප්පතිට්ඨිතං, මොනවට පිහිටියහු.

(263) දිස්වාන, දැක; ඉදානි ගණ්හාති ඉදානි ගණ්හාතීති, දැන්ගණී දැන් ගණීයයි කියා; චින්තිය, සිතා; සම්භින්නදාඨසප්පො ඉව, බිඳුන් දළ ඇති සර්පරාජයක්හුමෙන්; හතදප්පො, නටුවාවූදර්ප ඇති; සුදුම්මුඛො, විශෙෂයෙන් දුර්මුඛ වූ(ඒ වශවර්ත්තිමාරතෙම).

(264) ආයුධවත්ථානි, ආයුධයන් හා වස්ත්‍රයන්ද; අලඞ්කාරානි, ආභරණයන්ද; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; පහාය, හැර; යාව චක්කවාළාචලා, චක්‍රවාටපර්වතයදක්වා; සසෙනාය, සෙනාවසහිතව; සො, ඒ වශවර්ත්තිමාරතෙම; පලායි, පලාගියේයි.

(265) දෙවසඞ්ඝා, දිව්‍යසමූහයෝ; සභයං, භයසහිතවූ; සසොකං, සොකසහිතවූ; ඉති, මෙසේ; පලායමානං, යන්නාවූ; තං මාරසෙනං, ඒ මාරසෙනාව; දිස්වාන, දැක; අයං පරාජයො, මේ පරාජයතෙම; මාරස්ස, වශවර්ත්තිමාරයාහට (වන්නේය); සිද්ධත්ථකුමාරකස්ස, සිද්ධාර්ථකුමාරයන්ට; ජයො ඉති, ජයවන්නේයයි.

(266) සම්මොදමානා, සතුටුවෙමින්; ධීරං, ප්‍රාඥවූ (ඒ මහාබොධිසත්වයන්); සුගන්ධප්පභුතීහි, සුවඳමල් සුවඳසුණු ආදීන්; අභිපූජයන්තා, විශෙෂයෙන්පුදමින්; නෙකථුතීහි, අනෙකප්‍රකාරවූස්තුතීන්; උග්ඝොසමානා, ඝොෂණයකොරෙමින්; සම්මා, මනාකොට; ජිනවෙසධාරි, සැනවෙස්ගත්තාහු; තස්මිං, ඒ ස්ථානයට; පුනාගතා, නැවත ආවාහුයි.

267 එවං මාරබලං ධීරො විද්ධංසෙත්වා මහබ්බලො
ආදිච්චෙව ධරමානෙ'ව නිසින්නො අචලාසනෙ.

268 යාමස්මිං පඨමෙ පුබ්බනිවාසං ඤාණමුත්තමො
විසොධෙත්වාන යාමස්මිං මජ්ඣිමෙ දිබ්බලොචනං.

269 සො පටිච්චසමුප්පාදෙ අථ පච්ඡිමයාමකෙ
ඔතාරෙත්වාන ඤාණංසං සම්මසන්තො අනෙකධා.

270 ලොකධාතුසතං සම්මා උන්නාදෙත්වා'රුණොදයෙ
බුද්ධො හුත්වාන සම්බුද්ධො සම්බුද්ධම්බුජලොචනො.

271 "අනෙකජාතිසංසාරං සන්ධාවිස්සන්ති" ආදිනා
උදානෙ'දං උදානෙසි පීතිවෙගෙන සාදිසො.

272 සල්ලක්ඛෙත්වා ගුණෙ තස්ස පල්ලඞ්කස්ස අනෙකධා
න තාව උට්ඨහිස්සාමි ඉතො පල්ලඞ්කතො ඉති.

---

(267) ධීරො, ප්‍රාඥවූ; මහබ්බලො, මහත්වූ කායබල ඇති; (ඒ මහාබොධිසත්ත්වතෙම); එවං, මෙසේ; මාරබලං, මාරසෙනාව; විද්ධංසෙත්වා, විධ්වංශනයකොට; ආදිච්චෙ, සූර්‍ය්‍යයා; ධරමානෙව, අස්තයට යන්නට පූර්‍වභාගයෙහිම; අචලාසනෙ, නිශ්චලාසනයෙහි; නිසින්නො, හුන්නේ.

(268) උත්තමො, උතුම්වූ (ඒ බොධිසත්ත්වතෙම); පඨමෙ යාමස්මිං, ප්‍රථමයාමයෙහි; පුබ්බනිවාසං ඤාණං, පූර්‍වෙනිවාසානුස්මෘතිඥානය; විසොධෙත්වාන, ශුද්ධකොට; මජ්ඣිමෙ යාමස්මිං, මධ්‍යමයාමයෙහි; දිබ්බලොචනං, දිව්‍යචක්ෂුරභිඥානය; විසොධෙත්වාන, ශුද්ධකොට.

(269) අථ, ඉක්බිත්තෙන්; සො, ඒ මහාබොධිසත්ත්වතෙම; පච්ඡිමයාමකෙ, පශ්චිමයාමයෙහි, පටිච්චසමුප්පාදෙ, (ද්වාදශාඞ්ග) ප්‍රතීත්‍යසමුත්පාදයෙහි; ඤාණංසං, ඥානකොට්ඨාසය; ඔතාරෙත්වාන, බහා; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; සම්මසන්තො, සම්මර්ශණයකරන්නේ.

(270–271) අරුණොදයෙ, අරුණුනැගෙනවේලෙහි; ලොකධාතුසතං, සියගණන්සක්වළ; සම්මා, මනාකොට; උන්නාදෙත්වා, එක නින්නාදකරවා; සම්බුද්ධ, විශෙෂයෙන් ප්‍රබුද්ධවූ; අම්බුජලොචනො, නිලොත්පලපත්‍රයන් හා සමානවූ නෙත්‍ර ඇති (ඒබොධිසත්ත්වතෙම); බුද්ධො හුත්වාන, ලොවුතුරාසම්‍යක්සම්බොධිඥානය සමධිගමයකොට; අසාදිසො, අසදෘශවූ මහිම ඇති; සම්බුද්ධො, (ඒ) සර්‍වඥතෙම; අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං ඉති, "අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං" යන; ආදිනා, (මේ) ආදීන්; ඉදං උදානං, මේ ප්‍රීතිවාක්‍යය; පීතිවෙගෙන, ප්‍රීතිවේගයෙන්; උදානෙසි, පැවැත්වූයේයි.

(272) තස්ස පල්ලඞ්කස්ස, ඒ පය්‍ර්‍යඞ්කයාගේ; අනෙකධා අනෙක

273 සමාපත්තී සමාපජ්ජි අනෙකසතකොටියො
සත්ථා තත්ථෙ'ව සත්තාහං නිසින්නො අචලාසනෙ.

274 අජ්ජා'පි නූන ධීරස්ස සිද්ධත්ථස්ස යසස්සිනො
අත්ථි කත්තබ්බකිච්චං හි තස්මා ආසනමාලයං.

275 නජහාසී'ති එකච්චදෙවතානා'සි සංසයං
ඤත්වා තාසං විතක්කං තං සමෙතුං සන්තමානසො.

276 උට්ඨාය හෙමහංසො'ව හෙමවණ්ණො පභඞ්කරො
අබ්භුග්ගන්ත්වා නභං නාථො අකාසි පාටිහාරියං.

277 විතක්කමෙ'වං ඉමිනා මරූනං සම්මූ'පසම්මා'නිමිසෙහි බොධිං
සම්පූජයන්තො නයනම්බුජෙහි සත්තාහම'ට්ඨාසි ජයාසනං ච.

---

ප්‍රකාරයෙන්; ගුණෙ, ගුණයන්; සල්ලක්ඛෙත්වා, සලකා; තාව, තව; ඉතො පල්ලඞ්කතො, මේ පර්‍යඞ්කයෙන්; න උට්ඨහිස්සාමි ඉති, නොනැගෙමියි.

(273) තත්ථෙව අචලාසනෙ, ඒ නිශ්චලාසනයෙහිම; සත්තාහං, සතියක් මුලුල්ලෙහි; නිසින්නො, හුන්නාවූ; සත්ථා, ශාස්තෘවූ සර්වඥතෙම; අනෙකසතකොටියො, නොයෙක් කෙළසියගණන්; සමාපත්තී, සමාපත්තීන්ට; සමාපජ්ජි, සමවන්නේයි.

(974) නූන, එකාන්තයෙන්; යසස්සිනො, යසපිරිවර ඇත්තාවූ; ධීරස්ස, ප්‍රාඥවූ; සිද්ධත්ථස්ස, සිද්ධාර්ථකුමාරයන්ට; අජ්ජාපි, අද දක්වාත්; කත්තබ්බකිච්චං, කටයුතුකෘත්‍යයෙක්; හි (යස්මා), යම්හෙයකින්; අත්ථි, ඇද්ද; තස්මා, එහෙයින්; ආසන, ආසනයෙහි; ආලයං, ආලය.

(275) නජහාසීති, නොහළේයයි; එකච්චදෙවතානං, සමහරදෙවතාකෙනෙකුන්ට; සංසයං, සංසය; ආසි, විය; තාසං, ඔවුන්ගේ; තං විතක්කං, ඒවිතර්කය; ඤත්වා, දැන; සමෙතුං, සන්හිඳුවනුපිණිස; සන්තමානසො, සන්හුන්නාවූ සිත් ඇති.

(276) නාථො, ලොකස්වාමිවූ; හෙමවණ්ණො, ස්වර්ණවර්ණවූ; පභඞ්කරො, සොභාකරවූ (ඒ සර්වඥතෙම); උට්ඨාය, හුනස්නෙන්නැගී; හෙමහංසො ඉව, ස්වර්ණහංසරාජයක්නුපරිද්දෙන්; නභං, ආකාශයට; අබ්භුග්ගන්ත්වා, පැන නැගී; පාටිහාරියං, ප්‍රාතිහාර්‍යය; අකාසි, කෙළේයි.

(277) ඉමිනා, මේ ප්‍රාතිහාර්‍යයෙන්; මරූනං, දෙවියන්ගේ; විතක්කං, විතර්කය; එවං, මෙසේ; සම්මූපසම්ම, විශෙෂයෙන් සන්හිඳුවා; අනිමිසෙහි, අනිමිසවූ; නයනම්බුජෙහි, නෙත්‍රොත්පලයෙන්, බොධිංච, (ඒ) ශ්‍රීමහාබොධියද; ජයාසනං ච, වජ්‍රාසනයද; සම්පූජයන්තො, විශෙෂයෙන් පුදමින්; සත්තාහං, සතියක්මුලුල්ලෙහි; අට්ඨාසි, සිටියේයි.

278 සුභාසුරස්මිං රතනෙහි තස්මිං සචඞ්කමන්තො වරචඞ්කමස්මිං
මනොරමස්මිං රතනාලයෙ'පි විසුද්ධධම්මං විචිනං විසුද්ධො.

279 මූලෙජපාලතරුරාජවරස්ස තස්ස
මාරඞ්ගනානම'මලානනපඞ්කජානි
සම්මා මිලාපිය තතො මුචලින්දමූලෙ
භොගින්දචිත්තකුමුදානි පබොධයන්තො.

280 මූලෙ'පි රාජායතනස්ස තස්ස තස්මිං සමාපත්තිසුඛම්පි වින්දං
සංවීතිනාමෙසි මනුඤ්ඤවණ්ණො එකූනපඤ්ඤාසදිනානි ධීමා.

281 අනොතත්තොදකං දන්තකට්ඨනාගලතාමයං
හරීටකාගදං භුත්වා දෙවින්දෙනාභතුත්තමං.

282 වාණිජෙහි සමානීතං සමන්ථමධුපිණ්ඩිකං
මහාරාජූපනීතම්හි පත්තම්හි පතිගණ්හිය.

---

(278) විසුද්ධො, පිරිසුදුවූ (චිත්තසන්තාන ඇති); සො, ඒ සර්වඥතෙම; රතනෙහි, රත්නයෙන්; සුභාසුරස්මිං, විශෙෂයෙන් බබලන්නාවූ; තස්මිං වරචඞ්කමස්මිං, ඒ උතුම්වූ සක්මනෙහි; චඞ්කමන්තො, සක්මන්කෙරෙමින්; මනොරමස්මිං, සිත්කලුවූ; රතනාලයෙපි, රුවන්ගෙහිදු; විසුද්ධධම්මං, පිරිසුදුවූ ධර්මය; විචිනං, පරීක්ෂාකෙරෙමින්.

(279) තස්ස අජපාලතරුරාජවරස්ස, ඒ උතුම්වූ අජපාලනම් වෘක්ෂරාජයාගේ; මූලෙ, සමීපයෙහි; මාරඞ්ගනානං, මාරස්ත්‍රීන්ගේ; අමල, නිර්මලවූ; ආනනපඞ්කජානි, මුඛනමැති පද්මයන්; සම්මා, මනාකොට; මිලාපිය, මලානිකකොට; තතො, ඉක්බිත්තෙන්; මුචලින්දමූලෙ, මුචලින්දනම් වෘක්ෂමූලසමීපයෙහිද; භොගින්ද, (මුචලින්ද නම්) නාගරාජයාගේ; චිත්තකුමුදානි, චිත්තනමැති කෛරවයන්; පබොධයන්තො, ප්‍රබොධකෙරෙමින්.

(280) තස්ස රාජායතනස්ස, ඒ රාජායතනයාගේ; තස්මිං මූලෙපි, ඒ මූලයෙහිදු; සමාපත්තිසුඛම්පි, සමාපත්තිසැපයද; වින්දං, විඳිමින්; මනුඤ්ඤවණ්ණො, මනොඥවූ ශරීරවර්ණ ඇති; ධීමා, ප්‍රාඥවූ (ඒ සර්වඥතෙම); එකූනපඤ්ඤාසදිනානි, එකුන්පණස්දවසක්; සංවීතිනාමෙසි, විශෙෂයෙන් දවස් යවූයේයි.

(281) දෙවින්දෙන, ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින්; ආභතං, එලවනලද; උත්තමං, උතුම්වූ; අනොතත්තොදකං, අනවතප්තජලයද; නාගලතාමයං, නාළිගමයවූ; දන්තකට්ඨංච, දැහැටිදඬුද; හරීටකාගදං ච, බෙහෙත් අරළුද; භුත්වා, වළඳා.

(282) වාණිජෙහි, වෙළෙඳුන්විසින්; සමානීතං, එලවනලද; සමන්ථමධුපිණ්ඩිකං, අත්ගලාහා මීයෙන් අනතලද විලඳ අත්වටද; මහා

283 භොජනස්සාවසානම්හි ජපාලතරුමූලකං
ගන්ත්වාධිගතධම්මස්ස ගම්භීරත්තමනුස්සරි.

284 මහීසඞ්ඛාරකො වාරික්ඛන්ධසන්නිභකො අයං
ගම්භීරොධිගතො ධම්මො මයා සන්තො'ති ආදිනා.

285 ධම්මගම්භීරතං ධම්මරාජස්ස සරතො සතො
ආසෙවං තක්කණං ධම්මං ඉමං මෙ පටිවිජ්ඣිතුං.

286 වායමන්තෙන සම්පත්තයාචකානං මනොරමං
කන්තෙත්වා උත්තමඞ්ගං ච මොළිභූසනභූසිතං.

287 සුවණ්ණජිතානි අක්ඛීනි උප්පාටෙත්වාන ලොහිතං
ගළතො නීහරිත්වාන භරියං ලාවණ්ණභාසුරං.

288 අත්‍රජං ච දදන්තෙන කුලවංසප්පදීපකං
දූතං නාම න දින්නං ච නත්ථි සීලං අරක්ඛිතං.

---

රාජූපනීතම්හි, සතරවරම්මහරජදරුවන් විසින් එලවනලද; පත්ත
ම්හි, පාත්‍රයෙහි; පතිගණ්හිය, පිළිගෙණ.

(283) භොජනස්ස, භොජනයාගේ; අවසානම්හි, කෙළවර; අජ
පාලතරුමූලකං, අජපාලනම් වෘක්ෂමූල සමීපයට; ගන්ත්වා, ගොස්;
අධිගතධම්මස්ස, පැමිණෙනලද ධර්මයාගේ; ගම්භීරත්තං, ගැඹුරු
බව; අනුස්සරි, සිහිකොළේය.

(284) මයා, මා විසින්; අධිගතො, පැමිණෙනලද්දාවූ; අයං
ධම්මො, මේ ධර්මයතෙම; මහීසඞ්ඛාරකො, පෘථිවිසඞ්ඛාරණයකරන්
නාවූ; වාරික්ඛන්ධසන්නිභකො, ජලස්කන්ධයක් හාසමානය; ගම්භීරො,
ගැඹුරුය; සන්තොති, සාන්තයයි යන; ආදිනා, මේ ආදීන්.

(285) ධම්මගම්භීරතං, ධර්මයාගේ ගම්භීරත්වය; සරතො, සිහික
රන්නාවූ; ධම්මරාජස්ස සතො, ධර්මරාජන්වූ; (ඒ සර්වඥයන්වහන්
සේට); මෙ, මා විසින්; ඉමං ධම්මං, මේ ධර්මය; පටිවිජ්ඣිතුං, ප්‍රති
වෙධකරණුපිණිස; ආසෙවං, ආසෙවනයටද; තක්කණං, තර්කණයටද.

(286) වායමන්තෙන, උත්සාහකරන්නාවූ (මා විසින්); සම්පත්ත
යාචකානං, පැමිණියාවූ යාචකයන්ට; මනොරමං, සිත්කලුවූ; මො
ළිභූසනභූසිතං, කිරීටාලඞ්කාරයෙන් සැරහුනාවූ; උත්තමඞ්ගං ච,
උත්තමාංගයද; කන්තෙත්වා, කපා.

(287) සුවණ්ණජිතානි, මනාකොට අජනයකරණලද; අක්ඛීනි, ඇස්
ද; උප්පාටෙත්වාන, උපුටා; ගළතො, ග්‍රීවයෙන්; ලොහිතං, රුධිර
යද; නීහරිත්වාන, පෙළා; ලාවණ්ණභාසුරං, රූපසෞන්දර්‍ය්‍යයෙන්
බබලන්නාවූ; භරියං ච, භාර්‍ය්‍යාවන්ද.

(288) කුලවංසප්පදීපකං, කුලවංශයට ප්‍රදීපයක්හා සමානවූ; අත්‍ර

289 තථාහි සඞ්ඛපාලාදිඅත්තභාවෙසු ජීවිතං
මයා පරිච්චජන්තෙන සීලභෙදභයෙන ච.

290 ඛන්තිවාදාදිකෙ නෙකඅත්තභාවෙ අපූරිතා
ඡෙජ්ජාදිං පාපුනන්තෙන පාරමී නත්ථි කාචි මෙ.

291 තස්ස මෙ විධමන්තස්ස මාරසෙනං වසුන්ධරා
න කම්පිත්ථ අයං පුබ්බෙනිවාසං සරතො'පි ච.

292 විසොධෙන්තස්ස මෙ යාමෙ මජ්ඣිමෙ දිබ්බලොචනං
න කම්පිත්ථ පකම්පිත්ථ පච්ඡිමෙ පන යාමකෙ.

293 පච්චයාකාරඤාණං මෙ තාවදෙ පටිවිජ්ඣතො
සාධුකාරං දදන්තී'ව මුඤ්චමානා මහාරවං.

---

ජඤ්ච, දරුවන්ද; දදන්තෙන, දෙන්නාවූ (මා විසින්); න දින්නං, නොදෙනලද; දානඤ්ච නාම නත්ථි, දානයකුදු නම්නැත; අරක්ඛිතං, නොරක්නාලද්දවූ; සීලඤ්ච නාම නත්ථි, ශීලයකුදු නම් නැති.

(289) තථාහි, එසේමැයි; සඞ්ඛපාලාදිඅත්තභාවෙසු, සඞ්ඛපාලාදිවූ ආත්මභාවයන්හි; සීලභෙදභයෙන, ශීලභෙදභයින්; ජීවිතං පරිච්චජන්තෙන, ජීවිතපරිත්‍යාගකරන්නාවූ; මයා ච, මා විසින්ද.

(290) ඛන්තිවාදාදිකෙ, ක්ෂාන්තිවාදාදීවූ; නෙකඅත්තභාවෙ, නොයෙක් ආත්මභාවයෙහි; ඡෙජ්ජාදිං, ඡේද්‍යභෙද්‍යාදියට; පාපුනන්තෙන, පැමිණෙන්නාවූ; මෙ, මා විසින්; අපූරිතා, නුපුරණලද; කාචි පාරමී නාම නත්ථි, කිසිම පාරමිතාවෙක් නම්නැති.

(291) මාරසෙනං, මාරසෙනාව; විධමන්තස්ස, දුරුකරන්නාවූ; තස්ස මෙ, ඒ මට; අයං වසුන්ධරා, මේ පෘථිවීතොම; න කම්පිත්ථ, කම්පානොකළීය; පුබ්බෙ නිවාසං සරතොපි ච, පූර්වෙනිවාසානුස්මෘතිඥානයසිහිකරන්නාවූ (මට) ද; න කම්පිත්ථ, කම්පානොකළීය.

(292-293) මජ්ඣිමෙ යාමෙ, මධ්‍යමයාමයෙහි; දිබ්බලොචනං, දිව්‍යචක්ෂුරභිඥානය; විසොධෙන්තස්ස, ශුද්ධකරන්නාවූ (මට); න කම්පිත්ථ, කම්පානොකළීය; පච්ඡිමෙ පන යාමකෙ, පශ්චිමයාමයෙහි වනාහි; පච්චයාකාරඤාණං, ප්‍රතීත්‍යසමුත්පාදඥානය; පටිවිජ්ඣතො, ප්‍රතිවෙධකරන්නාවූ; මෙ, මට; තාවදෙ, එකෙණෙහි; සාධුකාරං දදන්තී ඉව, සාධුකාරදෙන්නියකමෙන්; මහාරවං මුඤ්චමානා, මහත්වූ නාදපවත්වමින්; පකම්පිත්ථ, විශෙෂයෙන් කම්පාකෙළේයි.

294 සම්පුණ්ණලාපූ විය කඤ්ජිකාහි
තක්කෙහි පුණ්ණං විය චාටිකා'ච
සම්මක්ඛිතො'ච'ඤ්ජනකෙහි හත්ථො
වසාහි සම්පිත පිලොතිකා'ව.

295 කිලෙසපුඤ්ජභරිතො කිලිට්ඨො
රාගෙන රත්තො අපි දොසදුට්ඨො
මොහෙන මූළ්හො'ති මහබ්බලෙන
ලොකො අවිජ්ජානිකරාකරො'යං.

296 කින්නාම ධම්මං පටිවිජ්ඣතෙ'තං
අත්ථො හි කො තස්සි'ති දෙසනාය
එවං නිරුස්සාහම'ගඤ්ඡි නාථො
පජාය ධම්මාමතපානදානෙ.

297 නිච්ඡාරෙත්වා මහානාදං තතො බ්‍රහ්මා සහම්පතී
නස්සති වත භො ලොකො ඉති ලොකො විනස්සති.

---

(294–295) අයං ලොකො, මේ ලෝකවාසී සත්ත්වතෙම; කඤ්ජිකාහි, කාඩියෙන්; සම්පුණ්ණ, පිරුණාවූ; ලාපූවිය, ලබ්බක් වැන්නීය; තක්කෙහි, මෝරෙන්; පුණ්ණ, පිරුණාවූ; චාටිකාවිය, සැළක්වැන්නීය; අඤ්ජනකෙහි, අඳුනෙන්; සම්මක්ඛිතො, වැකුනාවූ; හත්ථො ඉව, අතක් වැන්නේය; වසාහි, මස්තෙලින්; සම්පිත, පොවනලද; පිලොතිකා ඉව, රෙද්දක් වැන්නීය; කිලෙසපුඤ්ජ, කෙලෙස් රාසියෙන්; භරිතො, භරිතය; කිලිට්ඨො, කිලිටුය; රාගෙන රත්තො, රාගයෙන් රක්තය; අපි, නැවත; දොසදුට්ඨො, ද්වෙෂයෙන් දූෂිටය; මහබ්බලෙන, මහත්වූ බලයෙන්; අති මොහෙන, අධිකවූ මොහයෙන්; මූළ්හො, මූඪය; අවිජ්ජානිකර, අවිද්‍යාසමූහයට; ආකරො, උත්පත්ති ස්ථානය.

(296) එතං ධම්මං, මේ ධර්මය; කින්නාම පටිවිජ්ඣති, කුමකැයි ප්‍රතිවෙධකෙරේද? හි, එසේමැයි; තස්සා දෙසනාය, ඒ දෙශනාවෙන්; කො අත්ථො ඉති, ප්‍රයොජනකවරේදැයි; එවං, මෙසේ; නාථො, ලොකස්වාමිවූ සර්වඥතෙම; පජාය, සත්ත්වාඛ්‍යප්‍රජාවට; ධම්මාමතපානදානෙ, ධර්මනමැති අමෘතපානය දීමෙහි; නිරුස්සාහං, උත්සාහ රහිතබවට; අගඤ්ඡි, පැමිණියේයි.

(297) තතො, ඉක්බිත්තෙන්; සහම්පතී බ්‍රහ්මා, සහම්පති මහාබ්‍රහ්මතෙම; භො, පින්වත්නි; වත, ඒකාන්තයෙන්; ලොකො, ලොකයතෙම; නස්සති, නස්නේය; භො, පින්වත්නි; වත, එකාන්තයෙන්; ලොකො, ලොකයතෙම; විනස්සති ඉති, විශෙෂයෙන් නස්නේයයි; මහානාදං, මහත්වූ ඝොෂාව; නිච්ඡාරෙත්වා, පවත්වා.

298 බ්‍රහ්මසඞ්ඝං සමාදාය දෙවසඞ්ඝං ච තාවදෙ
ලොකධාතුසතෙ සත්ථු සමීපං සමුපාගතො.

299 ගන්ත්වා මහීතලෙ ජාණුං නිහච්ච සිරසඤ්ජලිං
පග්ගය්හ "භගවා ධම්මං දෙසෙතු" ඉති ආදිනා.

300 යාචිතො තෙන සම්බුද්ධාරවින්දවදනො ජිනො
ලොකධාතුසතං බුද්ධචක්ඛුනා'ලොකයං තදා.

301 තස්මිං අප්පරජක්ඛාදිමච්චා දිස්වා'ති එත්තකා
විභජිත්වා'ථ තෙ සත්තෙ භබ්බාභබ්බවසෙන සො.

302 අභබ්බෙ පරිවජ්ජෙත්වා භබ්බෙ'වා'දාය බුද්ධියා
උපනෙතු ජනො'දානි සද්ධාභාජනම'ත්තනො.

---

(298) තාවදෙ, එකෙණෙහි; ලොකධාතුසතෙ, සියගණන් සක්වළෙහි; බ්‍රහ්මසඞ්ඝං, බ්‍රහ්මසමූහයාද; දෙවසඞ්ඝං ච, දෙවසමූහයාද; සමාදාය, ගෙණ; සත්ථු සමීපං, සර්‍වඥයන්ගේ සමීපයට; සමුපාගතො, එළඹියේයි.

(299) ගන්ත්වා, ගොස්; මහීතලෙ, පෘථිවිතලයෙහි; ජාණුං නිහච්ච, දන ඇන; සිරසි, මස්තකයෙහි; අඤ්ජලිංපග්ගය්හ, ඇඳිලිබැඳ; භගවා, භාග්‍යවතුන්වහන්ස; ධම්මං දෙසෙතු ඉති, ධර්‍මදෙශනාකළ මැනවැයි යන; ආදිනා, මේ ආදීන්.

(300) තෙන, ඒ සහම්පතිමහාබ්‍රහ්මයා විසින්; යාචිතො, යාච්ඤා කරණලද්දාවූ; සම්බුද්ධ, සුපුෂ්පිතවූ; අරවින්දවදනො, පද්ම යක් හා සමානවූ මුඛඇති; ජිනො, සර්‍වඥතෙම; ලොකධාතුසතං, සියගණන් සක්වළ; බුද්ධචක්ඛුනා, සර්‍වඥචක්ෂුසින්; තදා, එසමයෙහි; ආලොකයං, බලනසේක්.

(301) තස්මිං, ඒ සියගණන්සක්වළෙහි; අප්පරජක්ඛාදි, අල්පරජස්කාදිවූ; මච්චා, සත්ත්වයෝ; එත්තකා ඉති, මෙපමණකැයි; දිස්වා, දැක; අථ, ඉක්බිත්තෙන්; සො, ඒසර්‍වඥතෙම; තෙ සත්තෙ, ඒසත්ත්වයන්; භබ්බාභබ්බවසෙන, භව්‍යාභව්‍යවශයෙන්; විභජිත්වා, විභාගකොට.

(302) අභබ්බෙ, අභව්‍යයන්; පරිවජ්ජෙත්වා, දුරුකොට; බුද්ධියා, ප්‍රඥාවෙන්; භබ්බෙව, භව්‍යයන්ම; ආදාය, ගෙණ; ඉදානි, දැන්; ජනො, ජනතෙම; අත්තනො, තමාගේ; සද්ධාභාජනං, ශ්‍රද්ධානමැති භාජනය; උපනෙතු, එළවාවා.

303 පූරෙස්සාමී'ති තං තස්ස සද්ධම්මාමතදානතො
විස්සජ්ජි බ්‍රහ්මසඞ්ඝස්ස වචනාමතරංසියො.

304 තතොජපාලොදයපබ්බතොදිතො
මහප්පභො බුද්ධදිවාකරො නභෙ
මණිප්පභාසන්නිභභාසුරප්පභො
පමොචයං භාසුරබුද්ධරංසියො.

305 පමොදයන්තො උපකාදයො තදා
කමෙන අට්ඨාරසයොජනඤ්ජසං
අතික්කමිත්වාන සුඵුල්ලපාදපෙ
විජම්භමානාලිගණාභිකූජිතං.

306 නිරන්තරං නෙකදිජූපකූජිතං සුඵුල්ලපඞ්කෙරුහගන්ධවාසිතං
ගතො යසස්සී මිගදායමුත්තමං තහිං තපස්සී අථ පඤ්චවග්ගියා.

---

(303) තස්ස, ඒ මහාජනයාගේ; තං, ඒ සැදෑනමැති භාජනය; සද්ධම්මාමතදානතො, සද්ධර්මනමැති අමෘතදානයෙන්; පූරෙස්සාමි ඉති, පුරමියි; බ්‍රහ්මසඞ්ඝස්ස, බ්‍රහ්මසමූහයාට; වචනාමතරංසියො, වචනනමැති අමෘතරශ්මීන්; විස්සජ්ජි, හළේයි.

(304) තතො, ඉක්බිත්තෙන්; අජපාලොදයපබ්බතොදිතො, අජපාලවෘක්ෂනමැති උදයගිරිපර්වතයෙන් පහළවූ; මහප්පභො, මහත්වූ ප්‍රභා ඇති; බුද්ධදිවාකරො, සර්වඥනමැති සූර්යතෙම; නභෙ, ආකාශයෙහි; මණිප්පභාසන්නිභ, සූර්යරශ්මියක්හා සමානවූ; භාසුර, බබලන්නාවූ; පභො, ආලොකඇත්තේ; භාසුර, බබලන්නාවූ; බුද්ධරංසියො, සර්වඥරශ්මීන්; පමොචයං, විහිදුවමින්.

(305) තදා, එසමයෙහි; උපකාදයො, උපකනම්ආජීවකාදීන්; පමොදයන්තො, සතුටුකෙරෙමින්; කමෙන, පිළිවෙළින්; අට්ඨාරසයොජනඤ්ජසං, අටළොස්යොදුන් මාර්ගය; සුඵුල්ලපාදපෙ, සුපුෂ්පිතවූ වෘක්ෂයන්; අතික්කමිත්වාන, ඉක්මවා; විජම්භමාන, විජෘම්භමානවූ; අලිගණ, භෘඞ්ගසමූහයාවිසින්; අභිකූජිතං, විශෙෂයෙන් නාදපවත්වනලද.

(306) නිරන්තරං, අනවරතයෙන්; නෙකදිජූපකූජිතං, නොයෙක් පක්ෂීන් විසින් රැවුපිළිරැවු දෙනලද්දාවූ; සුඵුල්ල, මනාවපිපියාවූ; පඞ්කෙරුහගන්ධ, පද්මසුගන්ධයෙන්; වාසිතං, සුවඳ කවනලද්දාවූ; උත්තමං මිගදායං, උතුම්වූ මිගදාවනයට; යසස්සී, යසපිරිවර ඇත්තාවූ (ඒ සර්වඥතෙම); ගතො, වැඩියේය; අථ, ඉක්බිත්තෙන්; තහිං, ඒ මිගදාවනයෙහි; පඤ්චවග්ගියා තපස්සී, පස්වගමහණුනු.

307 දෙවාතිදෙවං තිභවෙකනාථං
ලොකන්තදස්සිං සුගතං සුගත්තං
දිස්වාන ධීරං මුනිසීහරාජං
කුමන්තණං තෙ ඉති මන්තයිංසු.

308 "භුඤ්ජාන ඔළාරිකඅන්නපානං
සුවණ්ණවණ්ණො පරිපුණ්ණකායො
එතා'වුසො'යං සමණො ඉමස්ස
කරොම නා'මෙහ අභිවාදනාදිං.

309 අයං විසාලන්වයතො පසූතො
සම්භාවනීයො භුවි කෙතුභූතො
පටිග්ගහෙතුං 'රහතා'සනං තු
තස්මා'සනං'යෙවි'ති පඤ්ඤපෙම".

310 ඤත්වා'ථ භගවා තෙසං විතක්කං තික්ඛබුද්ධියා
මෙත්තානිලකදම්බෙහි මානකෙතුං පධංසයි.

---

(307) දෙවාතිදෙවං, දෙවාතිදෙවවූ; තිභවෙකනාථං, භවත්‍රයට එකස්වාමිවූ; ලොකන්තදස්සිං, ලොකයාගේ කෙළවර දක්නාවූ; සුගත්තං, මනාවූගාත්‍ර ඇත්තාවූ; ධීරං, ප්‍රාඥවූ; මුනිසීහරාජං, සර්වඥශ්‍රෙෂ්ඨවූ; (තං) සුගතං, (ඒ) සර්වඥයන්වහන්සේ; දිස්වාන, දැක; තෙ, ඒ පස්වගමහණනු; කුමන්තණං, කුත්සිතවූ මන්ත්‍රණයක්; ඉති, මෙසේ; මන්තයිංසු, මන්ත්‍රණය කළාහුයි; (කෙසේවූ මන්ත්‍රණයෙක්දයත්).

(308) ආවුසො, ආවැත්නි; ඉමස්ස, මේ ශ්‍රමණයහට; අමෙහ, අපි; අභිවාදනාදිං, නමස්කාරාදියක්; නකරොම, නොකරම්හ; අයං සමණො, මේශ්‍රමණතෙම; ඔළාරික, ඖදරිකවූ; අන්නපානං, ආහාරපානවර්ගය; භුඤ්ජාන; වළඳා; සුවණ්ණවණ්ණො, රන්වන්වූ; පරිපුණ්ණකායො, සම්පූර්ණවූශරීර ඇතිව; එති, එන්නේය.

(309) අයං, මේ ශ්‍රමණතෙම; විසාල, මහත්වූ; අන්වයතො, වංශයෙන්; පසූතො, ප්‍රසූතවිය; සම්භාවනීයො, සම්භාවනාකටයුත්තේය; භුවි, පෘථිවිමණ්ඩලයෙහි; කෙතුභූතො, ධවජයක් හා සමානය; තස්මා, එහෙයින්; ආසනංතු, ආසනමාත්‍රයක්වනාහි; පටිග්ගහෙතුං, පිළිගන්නට; අරහති, සුදුසුවන්නේය; ආසනංයෙව, ආසනමාත්‍රයක්ම; පඤ්ඤපෙම ඉති, පණවම්හයි; (කුමන්තණං, කුත්සිතවූ මන්ත්‍රණයක්; තෙ, ඒ පස්වගමහණනු; ඉති, මෙසේ; මන්තයිංසු, මන්ත්‍රණය කළාහුයි).

(310) භගවා, භාග්‍යවත්වූ බුදුරජතෙම; තෙසං, ඒ පස්වනමහණුන්ගේ; (තං) විතක්කං, (ඒ) විතර්කය; තික්ඛබුද්ධියා, තීක්ෂණවූ ප්‍රඥාවෙන්; ඤත්වා, දැන; අථ, ඉක්බිත්තෙන්; මෙත්තානිලකදම්බෙහි,

311 සම්පත්තා නහි සණ්ඨාතුං සකාය කතිකාය තෙ
අකංසු ලොකනාථස්ස වන්දනාදීනි ධීමතො.

312 බුද්ධභාවං අජානන්තා මුනයො මුනිරාජිනො
ආවුසෝ වාදතො තස්ස කෙවලං සමුදීරයුං.

313 අථ ලොකවිදූ ලොකනාථො තෙසමු "දීරථ
ආවුසොවාදතො නෙව සඤ්ඤුනො" සමුදීරයි.

314 "භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො'ති තථාගතො"
බුද්ධභාවං පකාසෙත්වා අත්තනො තෙසමු'ත්තමො.

315 නිසින්නො තෙහි පඤ්ඤත්තෙ දස්සනෙය්‍යුත්තමාසනෙ
බ්‍රහ්මනාදෙන තෙ ථෙරෙ සීලභූසනභූසිතෙ.

---

මෛත්‍රීනාමැති මාරුතසමූහයෙන්; මානකෙතුං, මානධ්වජය; පධංසයි, නැසුයේයි.

(311) තෙ, ඒ පස්වගමහණහු; සකාය කතිකාය, ස්වකීයවූ කතිකාවෙහි; සණ්ඨාතුං, සිටින්නට; නහිසම්පත්තා, අසමත්වූවාහු; ධීමතො, ප්‍රඥාවත්වූ; ලොකනාථස්ස, සර්වඥයාහට; වන්දනාදීනි, නමස්කාරාදීන්; අකංසු, කළාහුයි.

(312) බුද්ධභාවං, සර්වඥබව; අජානන්තා, නොදන්නාවූ; මුනයො, තපස්වීහු; මුනිරාජිනො, සර්වඥරාජන්වූ; තස්ස, ඒ භාග්‍යවත්හට; ආවුසොවාදතො, ආවුසොවාදයෙන්; කෙවලං, හුදෙක්; සමුදීරයුං, ව්‍යවහාරකළාහුයි.

(313) අථ, ඉක්බිත්තෙන්; ලොකවිදූ, ලොකත්‍රය දන්නාවූ; ලොකනාථො, ලොකස්වාමිවූ (සර්වඥතෙම); තෙසං, ඔවුන්ට; ආවුසොවාදතො, ආවුසොවාදයෙන්; සඤ්ඤුනො, සර්වඥයාහට; නෙව උදීරථ, ව්‍යවහාර නොකරව්යි; සමුදීරයි, කී.

(314) භික්ඛවෙ, මහණෙනි; තථාගතො, සර්වඥතෙම; අරහං, නිකෙලශීය; සම්මාසම්බුද්ධො ඉති, සම්‍යක්සම්බුද්ධයයි; තෙසං, ඔවුන්ට; අත්තනො, තමන්වහන්සේගේ; බුද්ධභාවං පකාසෙත්වා, සර්වඥබව ප්‍රකාශකොට; උත්තමො, උතුම්වූ (ඒ සර්වඥතෙම).

(315) තෙහි, ඒ පස්වගමහණුන් විසින්; පඤ්ඤත්තෙ, පණවනලද; දස්සනෙය්‍ය, දශනීයවූ; උත්තමෙ, උතුම්වූ; ආසනෙ, ආසනමස්තකයෙහි; නිසින්නො, හුන්නේ; සීලභූසනභූසිතෙ, ශීලාලඞ්කාරයෙන් සැරහුනාවූ; තෙ ථෙරෙ, ඒ ස්ථවිරවරයන්; බ්‍රහ්මනාදෙන, බ්‍රහ්ම ස්වරයෙන්.

316 ආමන්තෙත්වාන බ්‍රහ්මානං නෙකකොටිපුරක්ඛතො
ධම්මචක්කං පවත්තෙන්තො දෙසනාරංසිනා තදා.

317 මොහන්ධකාරරාසිම්පි හන්ත්වා ලොකෙ මනොරමං
ධම්මාලොකං පදස්සෙත්වා වෙනෙය්‍යම්බුජබුද්ධියා.

318 මිගකානනසඞ්ඛාතෙ රණභූමිතලෙ ඉති
රාජා මහානුභාවො'ව ධම්මරාජා විසාරදො.

319 දෙසනාසිං සමාදය ධීභුජෙන මනොරමං
වෙනෙය්‍යජනබන්ධූනං මහානත්ථකරං සදා.

320 කිලෙසාරී පදාලෙත්වා සද්ධම්මජයදුන්දුභිං
පහරිත්වාන සද්ධම්මජයකෙතුං සුදුජ්ජයං.

321 උස්සාපෙත්වාන සද්ධම්මජයත්ථූණුත්තමං සුභං
පතිට්ඨාපිය ලොකෙකරාජා හුත්වා සිවඞ්කරො.

---

(316) ආමන්තෙත්වාන, ආමන්ත්‍රණයකොට; බ්‍රහ්මානං, බ්‍රහ්මයන් සම්බන්ධිවූ; නෙකකොටිපුරක්ඛතො, නොයෙක්කෙළසියගණින් විසින් පිරිවරණලදුව; තදා, එසමයෙහි; ධම්මචක්කං පවත්තෙන්තො, ධර්මචක්‍රයපවත්වමින්; දෙසනාරංසිනා, දෙශනානමැති රශ්මියෙන්.

(317) ලොකෙ, ලොකයෙහි; මොහන්ධකාරරාසිම්පි, මොහනමැති අන්ධකාරරාසියද; හන්ත්වා, නසා; මනොරමං, සිත්කලුවූ; වෙනෙය්‍ය, විනෙයජනනමැති; අම්බුජබුද්ධියා, පද්මයන්හුගේ ප්‍රබොධය පිණිස; ධම්මාලොකං, ධර්මනමැති ආලොකය; පදස්සෙත්වා, දක්වා.

(318) ඉති, මෙසේ; මිගකානනසඞ්ඛාතෙ, මිගදාවනයයි කියනලද; රණභූමිතලෙ, යුද්ධභූමිතලයෙහි; මහානුභාවො, මහත්වූ ආනුභාව ඇති; රාජා ඉව, රජක්හු මෙන්; විසාරදො, මහත්වූ (බුහුටිවූ); ධම්මරාජා, ධර්මරාජන්තෙම.

(319) ධීභුජෙන, ප්‍රඥානමැති හස්තයෙන්; මනොරමං, සිත්කලුවූ; දෙසනාසිං, දෙශනානමැති ඛඩ්ගය; සමාදය, ගෙණ; සදා, හැමකල්හි; වෙනෙය්‍යජනබන්ධූනං, විනෙයජනනමැති බන්ධූන්ට; මහානත්ථකරං, මහත්වූ අනභිවෘද්ධිකරවූ.

(320) කිලෙසාරී, කෙලෙස්නමැති සතුරන්; පදාලෙත්වා, ප්‍රදලනයකොට; සද්ධම්මජයදුන්දුභිං, සද්ධර්මනමැති ජයභෙරිය; පහරිත්වාන, පැහැර; සුදුජ්ජයං, ජයනතනොහැක්කාවූ; සද්ධම්මජයකෙතුං, සද්ධර්මනමැති ජයධ්වජය.

(321) උස්සාපෙත්වාන, ඔසවා; උත්තමං, උතුම්වූ; සුභං, සුන්දරවූ; සද්ධම්මජයත්ථූණං, සද්ධර්මනමැති ජයස්තම්භය; පතිට්ඨාපිය, පිහිටුවා;

322 පමොචෙත්වාන ජනතං බ්‍රහාසංසාරබන්ධනා
නිබ්බාණනගරං නෙතුකාමො ලොකහිතෙ රතො.

323 සුවණ්ණාචලකූටං'ව ජඞ්ගමං චාරුදස්සනං
පත්වා'රුවෙලගාමිං තං අඤ්ජසං'ව සුරඤ්ජසං.

324 භද්දවග්ගියභූපාලකුමාරෙ තිංසමත්තකෙ
මග්ගත්තයාමතරසං පායෙත්වා රසමු'ත්තමං.

325 පබ්බජ්ජමු'ත්තමං දත්වා ලොකස්ස'ත්ථාය භික්ඛවො
උය්‍යොජෙත්වාන සම්බුද්ධො චාරිකං චරථා'ති තෙ.

326 ගන්ත්වා'රුවෙලං ජටිලානම'න්තො-
ජටා ච ඡෙත්වාන ජටා බහිද්ධා
පාපෙත්ව අග්ගඤ්ජසමු'ත්තමො තෙ
පුරක්ඛතො ඉන්දු'ව තාරකාහි.

---

ලොකෙකරාජා හුත්වා, ලොකෙකරාජන්ව; සිවඞ්කරො, ශාන්තිකරවූ; (ඒ සර්වඥතෙම).

(322) ජනතං, ජනසමූහයා; බ්‍රහා, මහත්වූ; සංසාරබන්ධනා, සංසාර නමැති මලින්; පමොචෙත්වාන, ගළවා; නිබ්බාණනගරං, නිර්වාණ නමැති පුරයට; නෙතුකාමො, පමුණුවනුකැමැත්තාවූ; ලොකහිතෙ රතො, ලෝවැඩකිරීමෙහි ඇලුනාවූ; (ඒ සර්වඥතෙම).

(323) ජඞ්ගමං, සඤ්චාරණයකරන්නාවූ; චාරුදස්සනං, මනාවූ දැකුම් ඇති; සුවණ්ණාචලකූටංව, සවර්ණපර්වතකූටයක්මෙන්; සුරඤ්ජසංව, දිව්‍යමාර්ගයක් හා සමානවූ; උරුවෙලගාමිං, උරුවෙලානම් දනව්වට යන්නාවූ; තං අඤ්ජසං, ඒ මාර්ගයට; පත්වා, පැමිණ.

(324) තිංසමත්තකෙ, තිසක් පමණ ඇති; භද්දවග්ගියභූපාලකුමාරෙ, භද්‍රවර්ගීනම්වූ රාජකුමාරවරුන්; උත්තමං රසං, උතුම්වූ රසවූ; මග්ගත්තයාමතරසං, සොවාන්ආදිවූ මාර්ගත්‍රය නමැති අමෘතරසය; පායෙත්වා, පානයකරවා.

(325) උත්තමං, උතුම්වූ; පබ්බජ්ජං දත්වා, ප්‍රව්‍රජ්‍යාව දී; ලොකස්සත්ථාය, ලෝවැඩපිණිස; භික්ඛවො, මහණෙනි; චාරිකං චරථ ඉති, සැරිසරා ඇවිදුවසි; තෙ, ඔවුන්; උය්‍යොජෙත්වාන, ගමන්කරවා; අථ, ඉක්බිත්තෙන්; සම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධතෙම.

(326) උරුවෙලං ගන්ත්වා, ඌරුවෙලානම්දනව්වට ගොස්; ජටිලානං, ජටාධාරීන්ගේ; අන්තොජටා ච, ඇතුළත කෙලෙස්නමැති ජටාවන්ද; බහිද්ධා ජටා ච, පිටත බැඳි ජටාවන්ද; ඡෙත්වාන, කපා; තෙ, ඒ ජටිලයන්; අග්ගඤ්ජසං, උතුම්වූ ඒ මාර්ගයට; පාපෙත්වා, පමුණුවා; උත්තමො, උතුම්වූ (ඒ සර්වඥතෙම); තාරකාහි, තාරකාවන් විසින්; පුරක්ඛතො, පිරිවරණලද; ඉන්දු ඉව, චන්ද්‍රයාමෙන්.

327 පුරක්ඛතො තෙහි අනාසවෙහි
ඡබ්බණ්ණරංසාභරණුත්තමෙහි
දිසඞ්ගනායො අතිසොභයන්තා
පක්ඛීනමක්ඛීනි'පි පීණයන්තා.

328 දින්නං පටිඤ්ඤං සමනුස්සරන්තො
තං බිම්බිසාරස්ස මහායසස්ස
මොචෙතුකාමො වරරාජවංසං
ධජූපමානස්ස ගුණාලයස්ස.

329 සිඛණ්ඩිමණ්ඩලාරද්ධනච්චං ලට්ඨිවනව්හයං
උය්‍යානම'ගමා නෙකතරුසණ්ඩාභිමණ්ඩිතං.

330 බිම්බිසාරනරින්දො සො'ගතභාවං මහෙසිනො
සුණිත්වා පීතිපාමොජ්ජභූසනෙන විභූසිතො.

331 තමු'ය්‍යානු'පගන්ත්වාන මහාමච්චපුරක්ඛතො
සත්ථුපාදරවින්දෙහි සොභයන්තො සිරොරුහෙ.

---

(327) අනාසවෙහි, නිරාශ්‍රවවූ; තෙහි, ඒ ජටිලභික්ෂූන් විසින්; පුරක්ඛතො, පිරිවරණලදසේක්; ඡබ්බණ්ණරංසාභරණුත්තමෙහි, සවණක්බුදුරැස්නමැති උතුම්වූ ආභරණයෙන්; දිසඞ්ගනායො, දික්නමැති කාන්තාවන්; අතිසොභයන්තා, විශෙෂයෙන් බබුලුවමින්; පක්ඛීනං, පක්ෂීන්ගේ; අක්ඛීනිපි, අක්ෂීනුදු; පීණයන්තා, පිණවමින්.

(328) මහායසස්ස, මහත්වූ යස පිරිවර ඇති; වරරාජවංසං, උතුම්වූ රාජවංශයට; ධජූපමානස්ස, ධවජයකටබඳුවූ උපමා ඇති; ගුණාලයස්ස, ගුණයට වාසස්ථානවූ; බිම්බිසාරස්ස, බිම්සරමහරජහට; දින්නං, දෙනලද; පටිඤ්ඤං, ප්‍රතිඥාව; සමනුස්සරන්තො, සිහිකෙරෙමින්; තං, ඒ ප්‍රතිඥාව; මොචෙතුකාමො, මුදනු කැමැතිව.

(329) සිඛණ්ඩිමණ්ඩල, මයූර සමූහයා විසින්; ආරද්ධ, පටන්ගන්නාලද; නච්චං, නෘත්‍ය ඇති; නෙක, අනෙකප්‍රකාරවූ; තරුසණ්ඩ, වෘක්ෂසමූහයෙන්; අභිමණ්ඩිතං, විශෙෂයෙන් සැරහුනාවූ; ලට්ඨිවනව්හයං, ලට්ඨිවනය යන නම් ඇති; උය්‍යානං, උද්‍යානයට; අගමා, ගියේසි.

(330) සො බිම්බිසාරනරින්දො, ඒ බිම්සර රජතෙම; මහෙසිනො, මහර්ෂිවූ සර්වඥයන්ගේ; ආගතභාවං, වැඩිබව; සුණිත්වා, අසා; පීතිපාමොජ්ජභූසනෙන, ප්‍රීතිප්‍රමොද්‍යනමැති අලඞ්කාරයෙන්; විභූසිතො, විශෙෂයෙන් අලඞ්කෘතවූයේ.

(331) මහාමච්චපුරක්ඛතො, මහත්වූ අමාත්‍යසමූහයා විසින් පිරිවරණලදුව; තං උය්‍යානං, ඒ ලෂ්ටිවනොද්‍යානයට; උපගන්ත්වාන, එළඹ; සත්ථු, සර්වඥයන්ගේ; පාදරවින්දෙහි, පාදනමැති පද්මයෙන්; සිරොරුහෙ, කෙශයන්; සොභයන්තො, හොබවමින්.

332 නිසින්නො බිම්බිසාරං තං සද්ධම්මඅමතම්බුනා
දෙවින්දගීයමානග්ගවණ්ණො වණ්ණාභිරාජිතො.

333 දෙවදානවභොගින්දපූජිතො සො මහායසො
රම්මං රාජගහං ගන්ත්වා දෙවින්දපුරසන්නිභං.

334 නරින්දගෙහං ආනීතො නරින්දෙන නරාසභො
භොජනස්සා'වසානම්හි වාලයන්තො මහාමහිං.

335 පතිගණ්හිය සම්ඵුල්ලතරුරාජවිරාජිතං
රම්මං වෙළුවනාරාමං විලොචන රසායනං.

336 සිතපුලිනසමූහඡන්නභාලඞ්කතස්මිං
සුරභිකුසුමගන්ධාකිණ්ණමන්දානිලස්මිං
විවිධකමලමාලාලඞ්කතම්බාසයස්මිං
විපුලවිමලතස්මිං වල්ලියාමණ්ඩපස්මිං.

---

(332) නිසින්නො, හුන්නේ; තං බිම්බිසාරං, ඒ බිම්සරරජහු; සද්ධම්ම, සද්ධර්මනමැති; අමතම්බුනා, අමෘතජලයෙන්; දෙවින්ද, ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින්; ගීයමාන, ගායනා කරණුලබන්නාවූ; අග්ගවණ්ණො, උතුම්වූ ගුණඇති; වණ්ණාභිරාජිතො, ශරීරවර්ණයෙන් බබලන්නාවූ (ඒ සර්වඥතෙම).

(333) දෙව, දෙවියන් විසින්ද; දානව, අසුරයන් විසින්ද; භොගින්ද, නාගෙන්ද්‍රයන් විසින්ද; පූජිතො, පුදනලද්දාවූ; මහායසො, මහත්වූ යසපිරිවර ඇත්තාවූ; සො, ඒ සර්වඥතෙම; දෙවින්දපුරසන්නිභං, ශක්‍රපුරය හා සමානවූ; රම්මං, සිත්කළුවූ; රාජගහං ගන්ත්වා, රජගහනුවරට ගොස්.

(334) නරින්දෙන, බිම්සරරජහු විසින්; නරින්දගෙහං, රජගෙට; ආනීතො, වඩාගෙණ එනලද; නරාසභො, නරොත්තමවූ (සර්වඥතෙම); භොජනස්සාවසානම්හි, භොජනාවසානයෙහි; මහාමහිං, මහත්වූ පෘථිවිය; වාලයන්තො, කම්පාකොරෙමින්.

(335) විලොචන, නෙත්‍රයට; රසායනං, රසායනයක්බඳුවූ; සම්ඵුල්ල, සුපුෂ්පිතවූ; තරුරාජ, වෘක්‍ෂරාජයන් විසින්; විරාජිතං, බබලන්නාවූ; රම්මං, සිත්කළුවූ; වෙළුවනාරාමං, වෙළුවනාරාමය; පතිගණ්හිය, පිළිගෙණ.

(336) සිත, ධවලවූ; පුලිනසමූහ, වාලුකාසමූහයෙන්; ඡන්න, තනනලද; භූ, පෘථිවියෙන්; අලඞ්කතස්මිං, සැරහුනාවූ; සුරභි, සුවඳැත්තාවූ; කුසුමගන්ධ, සුගන්ධකුසුමයෙන්; ආකිණ්ණ, ගැවසීගත්තාවූ; මන්දානිලස්මිං, මන්දමාරුතයන් ඇති; විවිධ, අනෙකප්‍රකාරවූ; කමල මාලා, පද්මමාලායෙන්; අලඞ්කත, සැරහුනාවූ; අම්බාසයස්මිං, ජලාශ්‍රය ඇති; විපුල, මහත්වූ; විමල, නිර්මලවූ; තස්මිං වල්ලියාමණ්ඩපස්මිං, ඒ ලතාමඩුවෙහි.

337 සුරනරමහනීයො චාරුපාදරවින්දො
විමලකමලනෙත්තො කුන්දදන්තාභිරාමො
ගුණරතනසමුද්දො නාථනාථො මුනින්දො
කනකකිරණසොභො සොමසොම්මානනො සො.

338 විමලපවරසීලක්ඛන්ධවාරං ච කත්වා
රුචිරවරසමාධීකුන්තමුස්සාපයිත්වා
තිඛිණතරසුභග්ගං බුද්ධඤාණොරුඛග්ගං
විහරති භමයන්තො කාමමග්ගා විහාරා.

339 තදා සුද්ධොදනො රාජා "පුත්තො සම්බොධිමුත්තමං
පත්වා පවත්තසද්ධම්මචක්කො ලොකහිතාය මෙ

340 රාජගහං'ව නිස්සාය රම්මෙ වෙළුවනෙ'ධුනා
වසතී"ති සුණිත්වාන බුද්ධභූතං සකත්‍රජං.

---

(337) සුරනර, දිව්‍යමනුෂ්‍යයන් විසින්; මහනීයො, පිදියයුතුවූ; චාරු, මනොඥවූ; පාදරවින්දො, පාදනමැති පද්මයන් ඇති; විමල, නිර්මලවූ; කමලනෙත්තො, පද්මපත්‍රයන්ටබඳුවූ නෙත්‍ර ඇති; කුන්ද, කොඳකැකුලුබඳුවූ; දන්ත, දන්තපන්තීන් විසින්; අභිරාමො, සිත්කලුවූ; ගුණරතන, ගුණනමැති රත්නයන්ට; සමුද්දො, සමුද්‍රයවැනිවූ; අනාථනාථො, අනාථයන්ට ස්වාමිවූ; කනකකිරණ, ස්වර්ණකිරණයක් හා සමානවූ; සොභො, සොභාවන් ඇති; සොම, චන්ද්‍රයාසේ; සොම්ම, සෞම්‍යවූ; ආනනො, මුහුණුඇති; සො මුනින්දො, ඒ සර්වඥ තෙම.

(338) විමල, නිර්මලවූ; පවර, උතුම්වූ; සීලක්ඛන්ධවාරං, සිල්නැතිකඳයුරක්ද; කත්වා, කොට; රුචිර, සිත්කලුවූ; වර, උතුම්වූ; සමාධි, සමාධිභාවනානමැති; කුන්තං, කොන්තය; උස්සාපයිත්වා, නගා (ඔසවා); තිඛිණතර, අතිශයින් තියුණුවූ මුවහත් ඇති; සුභග්ගං, සොඳුරුවූ; බුද්ධඤාණ, සර්වඥතාඥානනමැති; උරු, මහත්වූ; ඛග්ගං, ශරය; භමයන්තො, ලෙලවමින්; අග්ගා විහාරා, උතුම්වූ විහරණයෙන්; කාමං, කැමැතිපරිද්දෙන්; විහරති, වාසයකරන්නේයි.

(339) තදා, එසමයෙහි; සුද්ධොදනො රාජා, ශුද්ධොදනමහරජතෙම; මෙ පුත්තො, මාගේ පුත්‍රයානන්වහන්සේ; උත්තමං, උතුම්වූ; සම්බොධිං පත්වා, සම්‍යක්සම්බොධියට පැමිණ; ලොකහිතාය, ලෝවැඩපිණිස; පවත්ත සද්ධම්මචක්කො, පවත්වනලද දම්සක්පැවතුම්සූත්‍ර ඇතිසේක්.

(340) රාජගහංව නිස්සාය, රජගහනුවරනිසාම; රම්මෙ, සිත්කලුවූ; වෙළුවනෙ, වෙළුවනාරාමයෙහි; අධුනා, දැන්; වසතීති, වසනසේකැයි; සුණිත්වාන, අසා; බුද්ධභූතං, බුදුවූ; සකත්‍රජං, ස්වකීය පුත්‍රයානන්වහන්සේ.

341 දට්ඨුකාමො නවක්ඛත්තුං නවාමච්චෙව මහෙසිනො
නවයොධසහස්සෙහි සද්ධිං පෙසෙසි සන්තිකං.

342 ගන්ත්වා තෙ ධම්මරාජස්ස සුත්වා'නොපමදෙසනං
උත්තමත්ථං ලභිත්වාන සාසනම්පි නපෙසයුං.

343 තෙසෙ'කම්පි අපස්සන්තො කාළුදායිං සුභාරතිං
ආමන්තෙත්වා මහාමච්චං පබ්බජ්ජාභිරතං සදා.

344 "සුතඞ්ගරතනං නෙත්වා මම නෙත්තරසායනං
යෙන කෙනචු'පායෙන කරොහී"ති තම'බ්‍රවී.

345 අථ යොධසහස්සෙන තම්පි පෙසෙසි සො'පි ච
ගන්ත්වා සපරිසො සත්ථු සුත්වා සුන්දරදෙසනං.

346 අරහත්තඤ්ජසං පත්වා පබ්බජිත්වා නරාසභං
නමස්සන්තො ස සම්බුද්ධං පග්ගය්හ සිරසඤ්ජලිං.

---

(341) දට්ඨුකාමො, දක්නාකැමැතිව; නවක්ඛත්තුං, නවවාරයෙක; නවාමච්චෙව, අමාත්‍යයන් නවදෙනෙකු; නවයොධසහස්සෙහි සද්ධිං, නවදහසක් යොධයන් හා සමග; මහෙසිනො සන්තිකං, මහර්ෂිවූ සර්වඥයන්වහන්සේගේ සමීපයට; පෙසෙසි, යවූසේක.

(342) තෙ, ඔහු; ගන්ත්වා, ගොස්; ධම්මරාජස්ස, ධර්මරාජන්වූ (සර්වඥයන්ගේ); අනොපමදෙසනං, උපමාරහිතවූ දෙශනාව; සුත්වා, අසා; උත්තමත්ථං, උත්තමාර්ථය; ලභිත්වාන, ලැබ; සාසනම්පි, අස්නක්පමණකුදු; නපෙසයුං, නොයවූවාහුයි.

(343) තෙසු, ඔවුන්අතුරෙහි; එකම්පි, එකකුදු; අපස්සන්තො, නොදක්නේ; සුභාරතිං, මනාවූ කථා ඇති; සදා, හැමකල්හි; පබ්බජ්ජාභිරතං, පැවිජ්වීමෙහි ඇලුම් ඇති; කාළුදායිං මහාමච්චං, කාළුදායිනම්වූ මහාඅමාත්‍යයා; ආමන්තෙත්වා, කැඳවා.

(344) මම, මාගේ; සුතඞ්ගරතනං, උතුම්වූ පුත්‍රරත්නය; නෙත්වා, ගෙණහැර; යෙන කෙනචි උපායෙන, යම්කිසි උපායකින්; නෙත්තරසායනං, නෙත්‍රරසායනය; කරොහීති, කරවයි; තං, ඒ අමාත්‍යයාහට; අබ්‍රවි, කී.

(345) අථ, ඉක්බිත්තෙන්; යොධසහස්සෙන, දහසක්යොධයන් හා සමග; තම්පි, ඒ කාළුදායිනම් අමාත්‍යයාද; පෙසෙසි, යැවීය; සොපි ච, ඒද; ගන්ත්වා, ගොස්; සපරිසො, පිරිස්සහිතව; සත්ථු, සර්වඥයන්ගේ; සුන්දරදෙසනං, සොඳුරුවූ දෙශනාව; සුත්වා, අසා.

(346) අරහත්තඤ්ජසං, අර්හත්මාර්ගයටද; පත්වා, පැමිණ; පබ්බජිත්වා, මහණව; නරාසභං, නරොත්තමවූ; සම්බුද්ධං, සම්‍යක්සම්බුද්ධයන්

347 "වසන්තකාලජනිතාතිරත්තවණ්ණාභිරාමඞ්කුරපල්ලවානි
සුනීලවණ්ණුජ්ජලපත්තයුත්තා සාඛාසහස්සානි මනොරමානි.

348 විසිට්ඨගන්ධාකුලපාලිඵුල්ලනානාවිචිත්තානි මහීරුහානි
සුවිත්තනානාමිගපක්ඛිසඞ්ඝසඞ්ගීයමානුත්තමකානනානි.

349 සුනීලසාතොදකපූරිතානි සුනාදිකාදම්බකාදම්බකානි
සුගන්ධඉන්දීවරකල්ලහාරා රවින්දරත්තම්බුජභූසිතානි.

350 තීරන්තරෙ ජාතදුමෙසු පුප්ඵකිඤ්ජක්ඛරාජීහි විරාජිතානි
මුත්තාතිසෙතාමලසෙකතානි රම්මානි නෙකානි ජලාසයානි.

---

වහන්සේට; සිරසි, මස්තකයෙහි; අඤ්ජලිංපග්ගය්හ, ඇඳිලිබැඳ; නමස්සනෙතා, නමස්කාරකෙරෙමින්; සො, ඒ කාලුදායිස්ථවිරතෙම.

(347) වසන්තකාල, වසන්තකාලයෙහි; ජනිත, හටගත්තාවූ; අති රත්ත, අතිශයින්රත්වූ; වණ්ණ, වර්ණයෙන්; අභිරාම, සිත්කලුවූ; අඞ්කුරපල්ලවානි, අඞ්කුරයන් හා පල්ලවයන් ඇති; සුනීල, අති ශයින් නිල්වූ; වණ්ණ, වර්ණයෙන්; උජ්ජල, දිලිසෙන්නාවූ; පත්ත යුත්තා, පත්‍රයෙන් යුක්තවූ; මනොරමානි, සිත්කලුවූ; සාඛාසහස්සා නි, දහස්ගණන් අතු ඇති.

(348) විසිට්ඨ, විසිතුරුවූ; ගන්ධ, සුගන්ධයෙන්; ආකුල, ගැවසීගත් තාවූ; පාලිඵුල්ල, (අගසිටමුලදක්වා) පැලීපිපීගියාවූ මල්ඇති; නා නා, අනෙකප්‍රකාරයෙන්; විචිත්තානි, විසිතුරුවූ; මහීරුහානි, වෘක්ෂ යෝ වන්නාහ; සුවිත්ත, අතිශයින් විසිතුරුවූ; නානා, අනෙකප්‍රකා රවූ; මිගපක්ඛිසඞ්ඝ, මෘගපක්ෂිසමූහයා විසින්; සඞ්ගීයමාන, ගායනා කරණලබන්නාවූ; උත්තම, උතුම්වූ; කානනානි, වනයන් ඇති.

(349) සුනීල, අතිශයින්නිල්වූ; සාත, මිහිරිවූ; උදකපූරිතානි; ජලයෙන් පිරුනාවූ; සුනාදි, මනාවූ නාදයෙන් යුක්තවූ; කාදම්බකාද ම්බකානි, කාලහංසසමූහයන්ඇති; සුගන්ධ, සුවඳඇත්තාවූ; ඉන්දීවර, නිලුපුල්හා; කල්ලහාර, හෙල්මැලිය; අරවින්ද, හෙලපියුම; රත්තම්බු ජ; රත්පියුම, යන මෙයින්; භූසිතානි, අලඞ්කෘතවූ.

(350) තීරන්තරෙ, විල්පොකුණුතෙර; ජාත, හටගත්තාවූ; දුමෙ සු, වෘක්ෂවල්හි; පුප්ඵකිඤ්ජක්ඛරාජීහි, මල්රෙහෙණු ආදීන්; විරජි තානි, බබලන්නාවූ; මුත්ත, මුතුසේ; අතිසෙත, ඉතා ධවලවූ; අමල, නිර්මලවූ; සෙකතානි, වාලුකාතලයන් ඇති; රම්මානි, සිත්කලුවූ; නෙකානි, අනෙකප්‍රකාරවූ; ජලාසයානි, ජලාශයෝ වන්නාහ (හෙ වත් විල්පොකුණු වන්නෝයි).

351 මඤ්ජුසදවෙළුරියකන්දුකානිව ගුණ්ඨිතානී'ව සුසද්දලෙහි
සුනීලභූතානි මහීතලානි නභානි මන්දානිලසඞ්කුලානි.

352 අනන්තභොගෙහි ජනෙහි ඵීතං
සුරාජධානිං කපිලාභිධානිං
ගන්තුං භදන්තෙ සමයො''ති ආදිං
සංවණ්ණනී වණ්ණං ගමනස්සස්ස.

353 සුවණ්ණිතං තං සුගතො සුණිත්වා
''වණ්ණෙසි වණ්ණං ගමනස්සු'දායි
කිනන්නු''ති භාසිත්ථ තතො උදායි
කථෙසි'දං තස්ස සිවඞ්කරස්ස.

354 ''භදන්ත පිතා දස්සනමි'ච්ඡතෙ තෙ
සුද්ධොදනො රාජවරො යසස්සී
තථාගතො ලොකහිතෙකනාථො
කරොතු සඤ්ඤාතකසඞ්ගහන්ති''.

---

(351) සුසද්දලෙහි, මනාවූ ඊතණින්; මඤ්ජුසද, මනොඥවූ; වෙළුරිය කන්දුකානි, වෛදූර්‍ය්‍යමාණික්‍යමයවූ සැට්ටයෙන්; අවගුණ්ඨිතානිව, ඉස්වසාපෙරවියාක්වැනිවූ; සුනීලභූතානි, අතිශයින් නිල්වූ; මහීතලානි, පෘථිවීතලයෝ වන්නාහ; මන්දානිල, මන්දමාරුතයෙන්; සඞ්කුලානි, ගැවසීගත්තාවූ; නභානි, ආකාශප්‍රදෙශයෝ වන්නාහ.

(352) අනන්ත, අපරිමිතවූ; භොගෙහි, උපභොග පරිභොගවස්තු ඇති; ජනෙහි, ජනයා විසින්; ඵීතං, පිරුණාවූ; කපිලාභිධානිං, කපිලය යන නමක් ඇති; සුරාජධානිං, සුන්දරවූරාජධානියට; ගන්තුං, යන්නට; භදන්ත, ස්වාමීනි; සමයො ඉති, කල්වන්නේයයි යන; ආදිං, මේආදිවූ; ගමනස්සස්ස, වඩනාවූ මාර්ගයාගේ; වණ්ණං, වර්ණනාව; සංවණ්ණනී, වර්ණනාකළසේක.

(353) තං සුවණ්ණිතං, ඒ සුන්දරවූවර්ණනාව; සුගතො, සර්වඥතෙම; සුණිත්වා, අසා; උදායි, උදායිස්ථවිරය; ගමනස්ස, ගමනයාගේ; වණ්ණං, වර්ණනාව; වණ්ණෙසි, වර්ණනාකෙළෙහිය; කිනන්නූති, කිමෙක්දැයි; භාසිත්ථ, වදාළසේක; තතො, ඉක්බිත්තෙන්; උදායි, උදායිස්ථවිරතෙම; තස්ස සිවඞ්කරස්ස, ඒ ශාන්තිකරවූ සර්වඥයන්ට; ඉදං, මේ වචනය; කථෙසි, කීයේයි.

(354) භදන්ත, ස්වාමීනි; තෙ පිතා, නුඹවහන්සේගේ පිතෘවූ; යසස්සී, යසපිරිවර ඇත්තාවූ; සුද්ධොදනො රාජවරො, ශුද්ධොදනනම්වූ රාජොත්තමතෙම; තෙ දස්සනං, නුඹවහන්සේගේ දර්ශනය; ඉච්ඡතෙ, කැමැතිවන්නේය; ලොකහිතෙකනාථො, ලෝවැඩකිරී මෙහි එකස්වාමිවූ; තථාගතො, සර්වඥතෙම; සඤ්ඤාතකසඞ්ගහං, ස්වකීයවූ

355 සුණිත්වා මධුරං තස්ස ගිරං ලොකහිතෙ රතො
"සාධූ'ති කරිස්සාමි ඤාතකානන්ති සඞ්ගහං".

356 ජඞ්ගමො හෙමමෙරූ'ව රත්තකම්බලලඞ්කතො
විමලො පුණ්ණචන්දෝ'ව තාරකාපරිවාරිතො.

357 සද්ධිං වීසසහස්සෙහි සන්තචිත්තෙහි තාදිහි
ගච්ඡන්තො සිරිසම්පන්නො අඤ්ජසෙ සට්ඨියොජනෙ.

358 දිනෙ දිනෙ වසිත්වාන යොජනෙ යොජනෙ ජිනො
ද්වීහි මාසෙහි සම්පත්තො බුද්ධො ජාතපුරං වරං.

359 බුද්ධං විසුද්ධකමලානනසොභමානං
බාලංසුමාලිසතභානුසමානභානුං
චක්කඞ්කිතොරුචරණං චරණාධිවාසං
ලොකත්තයෙකසරණං අරණඞ්ගකායං.

---

ඤාතිසඞ්ග්‍රහය; කරොතු ඉති, කරණසේක්වයි යන; (ඉදං, මේ වචනය; කථෙසි, කීයේයි).

(355) ලොකහිතෙ රතො, ලෝවැඩකිරීමෙහි ඇලුනාවූ ඒ සර්‍වඥතෙම; තස්ස, ඒ උදායිස්ථවිරයාගේ; මධුරං ගිරං, මිහිරිතෙපුල්; සුණිත්වා, අසා; උදායි, උදායිස්ථවිරය; ඤාතකානං, නෑයන්ට; සඞ්ගහං, සඞ්ග්‍රහයක්; කරිස්සාමි, කොළෙම්වීන්නම්; සාධු ඉති, යහපත් වන්නේයි.

(356) රත්තකම්බලලඞ්කතො, රත්පලසකින් සරහනලද්දාවූ; ජඞ්ගමො, සඤ්චාරණයකරන්නාවූ; හෙමමෙරූ ඉව, සුවර්ණපර්‍වතරාජයා මෙන්ද; තාරකාපරිවාරිතො, තාරකාසමූහයා විසින් පිරිවරණලද්දේ; විමලො, නිර්මලවූ; පුණ්ණචන්දෙව, පූර්ණචන්ද්‍රයාමෙන්ද.

(357) සන්තචිත්තෙහි, ශාන්තවූ සිත් ඇති; තාදිහි, තාදිර්ගුණයෙන් යුක්තවූ; වීසසහස්සෙහි සද්ධිං, විසිදහසක් ක්ෂීණාශ්‍රවයන් හා සමග; සට්ඨියොජනෙ අඤ්ජසෙ, සැටයොදුන් මාර්ගයෙහි; සිරිසම්පන්නො, ශ්‍රීයෙන්සමෘද්ධවූ; ගච්ඡන්තො, වඩනාවූ; (ජිනො, පස්මරුන් ජයගත් හෙයින් ජිනනම්වූ සර්‍වඥතෙම).

(358) දිනෙ දිනෙ, දවසක් දවසක්පාසා; යොජනෙ යොජනෙ, යොදුනෙක් යොදුනෙක්හි; ජිනො, සර්‍වඥතෙම; වසිත්වාන, වැස; ද්වීහි මාසෙහි, දෙමසකින්; වරං, උතුම්වූ; ජාතපුරං, උත්පත්තිපුරට; බුද්ධො, සර්‍වඥතෙම; සම්පත්තො, පැමිණිසේකි.

(359) විසුද්ධ, පිරිසුදුවූ; කමල, පද්මයක් හා සමානවූ; ආනන, මුඛමණ්ඩලයෙන්; සොභමානං, බබලන්නාවූ; බාලංසුමාලී, බාලාකී

360 සම්පුණ්ණහෙමඝටතොරණධූමගන්ධ
මාලෙහි වෙණුපණවාදිහි දුන්දුභීහි
විතෙතහි ඡත්තධජචාමරවීජනීහි
සුද්ධොදනාදිවනිපා අභිපූජයිංසු.

361 සුසජ්ජිතං පුරං පත්වා මුනින්දො තං මනොරමං
සුගන්ධිපුප්ඵකිඤ්ජක්ඛාලඞ්කතොරුතලාකුලං.

362 සුඵුල්ලජලජාකිණ්ණ අවෙජ්ජාදකජලාලයං
මයූරමණ්ඩලාරද්ධ රඞ්ගෙහි ච විරාජිතං.

363 චාරුචඞ්කමපාසාද ලතාමණ්ඩපමණ්ඩිතං
පාවෙක්ඛි ජවරො රම්මං නිග්‍රොධාරාමමුත්තමං.

---

මණ්ඩලයාගේ; සතභානුසමාන, සියයක්රශ්මි හා සමානවූ; භානුං, රශ්මි ඇති; චක්කඞ්කිත, චක්‍රලක්ෂණයෙන් විහණිතවූ; උරු, මහත් වූ; චරණං, පාද්‍පද්මයන් ඇති; චරණාධිවාසං, පසළොස්චරණධර්මයන්ට වාසස්ථානවූ; ලොකත්තයං, ලොකත්‍රයට; එකසරණං, අසහායසරණවූ; අරණෙ, කෙලශයුඞ්රහිතවූ; අග්ගකායං, උතුම් ශරීර සොභා ඇති; බුද්ධං, සර්ඥයන්වහන්සේ.

(360) සම්පුණ්ණ, සම්පූර්ණවූ; හෙමඝට, සවර්ණඝටයෙන්ද; තොරණ, රන්තොරණින්ද; ධූම, සුවඳදුම්න්ද; ගන්ධ, සිව්දෑගඳින්ද; මාලෙහි, දෑසමන්ආදිවූ සුවඳමලින්ද; වෙණු, වස්කුළලින්ද; පණවාදිහි, පණාබෙර ආදිවූ; දුන්දුභීහි, මහබෙර ආදියෙන්ද; විතෙතහි, විසිතුරුවූ; ඡත්ත, ඡත්‍රයෙන්ද; ධජ, ධ්වජයෙන්ද; චාමර, වල්විදුනාවෙන්ද; වීජනීහි, තල්වැට ආදියෙන්ද; සුද්ධොදනාදි, සුද්ධොදනමහරජ්ජුරුවන් ආදිවූ; අවනිපා, රජදරුවෝ; අභිපූජයිංසු, විශෙෂයෙන් පූජාකළාහුයි.

(361) මුනින්දො, මුනීන්ද්‍රවූ සර්ඥතෙම; සුගන්ධි, සුවඳ ඇත්තාවූ; පුප්ඵකිඤ්ජක්ඛ, මල්රෙහෙණුයෙන්; අලඞ්කත, සැරසුනාවූ; උරු, මහත්වූ; තල, භූමිතලයෙන්; ආකුලං, ගැවසීගත්තාවූ; මනොරමං, සිත්කළුවූ; සුසජ්ජිතං, මනාකොටසරහණලද; තං පුරං, ඒ කිඹුල්වත්පුරයට; පත්වා, පැමිණ.

(362) සුඵුල්ල, මනාවිකසිතවූ; ජලජ, පද්මයෙන්; ආකිණ්ණ, ගැවසීගත්තාවූ; අවෙජ්ජාදක, නිර්මලජලයෙන් යුක්තවූ; ජලාලයං, විල්පොකුණු ඇති; මයූරමණ්ඩල, මයූරසමූහයා විසින්; ආරද්ධ, පටන්ගත්තාලද; රඞ්ගෙහි ච, නෘත්‍යයෙන්ද; විරාජිතං, බබලන්නාවූ.

(363) චාරු, මනොඥවූ; චඞ්කම, සක්මනින්ද; පාසාද, ප්‍රාසාදයෙන්ද; ලතාමණ්ඩප, ලියමඩුයෙන්ද; මණ්ඩිතං, සැරසුනාවූ;

364 "අම්හාකමෙ'ස සිද්ධත්ථො පුත්තො නත්තා'ති" ආදිනා
චින්තයිත්වාන සඤ්ජාතමානසථද්ධසාකියා.

365 දහරෙ දහරෙ රාජ කුමාරෙ ඉදම'බ්‍රවුං
"තුම්හෙ වන්දථ සිද්ධත්ථං නවන්දාම මයන්ති තං".

366 ඉදං වත්වා නිසීදිංසු කත්වා තෙ පුරතො තතො
අදන්තදමකො දන්තො තිලොකෙකවිලොචනො.

367 තෙසං අජ්ඣාසයං ඤත්වා "න මං වන්දන්ති ඤාතයො
හන්ද වන්දාපයිස්සාමි'දානි තෙසන්ති" තාවදෙ.

368 අභිඤ්ඤාපාදකජ්ඣානං සමාපජ්ජිත්ව ඣානතො
වුට්ඨාය හෙමහංසො'ව හෙමවණ්ණො පභඞ්කරො.

---

රම්මං, සිත්කලුවූ; උත්තමං, උතුම්වූ; නිග්‍රොධාරාමං, නිග්‍රොධාරාම යට; පවරො, උතුම්වූ (සර්වඥතෙම); පාවෙක්ඛි, වන්නේයි.

(364) එසො සිද්ධත්ථො, මේ සිද්ධාර්ථකුමාරතෙම; අම්හාකං, අප ගේ; පුත්තො, පුත්‍රය; නත්තා ඉති, මුනුබුරාය යන; ආදිනා, මේ ආදීන්; චින්තයිත්වාන, සිතා; සඤ්ජාතමානස, හටගත්තාවූ සිත් ඇති; ථද්ධසාකියා, තද්වූ ශාක්‍යරජදරුවෝ.

(365) තුම්හෙ, තෙපි; සිද්ධත්ථං, සිද්ධාර්ථකුමාරයන්; වන්දථ, වඳුව; මයං, අපි; නවන්දාම ඉති, නොවඳුම්හයි; දහරෙ දහරෙ රාජකුමාරෙ, බාල බාල රාජකුමාරවරුන්ට; ඉදං, මේ වචනය; අබ්‍රවුං, කීවාහුයි.

(366) ඉදං වත්වා, මෙසේ කියා; තෙ, ඒ රාජකුමාරවරුන්; පුරතො කත්වා, පෙරදූරිකොට; නිසීදිංසු, හුන්හ; තතො, ඉක්බිත්තෙන්; අදන්තදමකො, නොදූමුනන් දමනෙහි ලන්නාවූ; දන්තො, දාන්තවූ; තිලොකෙකවිලොචනො, ත්‍රෛලොක්‍යයට අසහායනෙත්‍රයක් හා සමානවූ සර්වඥතෙම.

(367) තෙසං, ඔවුන්ගේ; අජ්ඣාසයං ඤත්වා, අදහස්දැන; ඤාතයො, නෑයෝ; මං, මා; නවන්දන්ති, නොවඳිති; හන්ද, එබැවින්; ඉදානි, දැන්; තෙසං, ඔවුන්ලවා; වන්දාපයිස්සාමි ඉති, වන්දවමියි; තාවදෙ, එකෙණෙහි.

(368) අභිඤ්ඤාපාදකජ්ඣානං, අභිඥාපාදකධ්‍යානයට; සමාපජ්ජිත්වා, සමවැද; ඣානතො, ධ්‍යානයෙන්; වුට්ඨාය, නැගී; හෙමහංසො ඉව, ස්වර්ණහංසරාජයකුමෙන්; හෙමවණ්ණො, ස්වර්ණවර්ණවූ; පභඞ්කරො, සොභාකරවූ සර්වඥතෙම.

369 අබ්භුග්ගන්ත්වා නභං සබ්බසත්තනෙත්තරසායනං
ගණ්ඩම්බරුක්ඛමූලස්මිං පාටිහාරියසන්නිභං.

370 අසාධාරණම'ඤ්ඤෙසං පාටිහාරියමු'ත්තමං
රමනීයතරෙ තස්මිං අකාසි මුනිපුඞ්ගවො.

371 දිස්වා තම'බ්භුතං රාජා සුද්ධොදනොනරාසභො
සඤ්ජාතපීතිපාමොජ්ජො සක්‍යවංසෙකනායකො.

372 සත්ථුපාදරවින්දෙහි සකෙ චාරුසිරොරුහෙ
භූසිතෙ'කාසි තෙ සබ්බෙ සාකියා අකරුං තථා.

373 ධීරො පොක්ඛරවස්සස්ස අවසානෙ මනොරමං
ධම්මවස්සං පවස්සෙත්වා සත්තචිත්තාවනුගතං.

---

(369) නභං, ආකාශයට; අබ්භුග්ගන්ත්වා, පැනනැගී; සබ්බසත්ත, සියලුසත්ත්වයන්ගේ; නෙත්තරසායනං, නෙත්‍රයට රසායනයක් බඳුවූ; ගණ්ඩම්බරුක්ඛමූලස්මිං, ගණ්ඩම්බනම්වෘක්ෂමූලයෙහි; පාටිහාරියස න්නිභං, ප්‍රාතිහාර්‍ය්‍ය හා සමානවූ.

(370) අඤ්ඤෙසං, අන්‍යසත්ත්වයන්ට; අසාධාරණං, සාධාරණනො වන්නාවූ; උත්තමං, උතුම්වූ; පාටිහාරියං, ප්‍රාතිහාර්‍ය්‍ය; රමණීයත රෙ, ඉතා සිත්කලුවූ; තස්මිං, ඒ ස්ථානයෙහිදී; මුනිපුඞ්ගවො, සර්වඥ ශ්‍රෙෂ්ඨතෙම; අකාසි, කෙළේයි.

(371) සක්‍යවංසෙකනායකො, ශාක්‍යවංශයට එකනායකවූ; නරා සභො, නරොත්තමවූ; සුද්ධොදනොරාජා, සුද්ධොදනනම්මහරජතෙම; තං අබ්භුතං, ඒ ආශ්චර්‍ය්‍ය; දිස්වා, දැක; සඤ්ජාත, හටගත්තාවූ; පී තිපාමොජ්ජො, ප්‍රීතිප්‍රමොද්‍ය ඇත්තේ.

(372) සත්ථු, සර්වඥයන්ගේ; පාදරවින්දෙහි, පාදනමැති පද්මයෙන්; සකෙ, ස්වකීයවූ; චාරු, මනොඥවූ; සිරොරුහෙ, කෙශයන්; භූසි තෙ අකාසි, අලඞ්කාර කෙළේය; තෙ සබ්බෙ, ඒ සියලු; සාකියා, ශාක්‍යරජදරුවෝ; තථා අකරුං, එපරිද්දෙන් කළාහුයි.

(373) ධීරො, ප්‍රාඥවූසර්වඥතෙම; පොක්ඛරවස්සස්ස, පුෂ්කරවර්ෂා වගේ; අවසානෙ, කෙළවර; මනොරමං, සිත්කලුවූ; ධම්මවස්සං, ධර්ම නමැතිවර්ෂාව; පවස්සෙත්වා, වස්වා; සත්තචිත්තාවනුගතං, සත්ත්ව යන්ගේ සිත්නමැති පෘථිවියෙන් නැංගාවූ.

374 මහාමොහරජං හන්ත්වා සසඞ්ඝො දුතියෙ දිනෙ
පාවෙක්ඛි සපදානෙන පිණ්ඩාය පුරමුත්තමං.

375 තස්ස පාදරවින්දානි'රවින්දානි අනෙකධා
උග්ගන්ත්වා පතිගණ්හිංසු අක්කන්තක්කන්තඨානතො.

376 දෙහජොතිකදම්බෙහි ගොපුරට්ටාලමන්දිරා
පිඤ්ජරත්තං ගතො තස්මිං පාකාරප්පභුතී තදා.

377 චරන්තං පවිසිත්වාන පිණ්ඩාය පුරවීථියං
ලොකාලොකකරං වීරං සන්තං දන්තං පභඞ්කරං.

378 පසාදජනකෙ රම්මෙ පාසාදෙ සා යසොධරා
සීහපඤ්ජරතො දිස්වා සීතා පෙමපරායණා.

---

(374) මහාමොහරජං, මහත්වූ මොහනමැතිරජස්‍ය; හන්ත්වා, නසා; සසඞ්ඝො, සඞ්ඝසහිතවූ සර්‍වඥතෙම; දුතියෙ දිනෙ, දෙවෙනි දවස්; සපදානෙන, ගෙපිළිවෙළින්; පිණ්ඩාය, පිඬුපිණිස; උත්තමං පුරං, උතුම්වූ පුරයට; පාවෙක්ඛි, වන්නේයි.

(375) තස්ස, ඒසර්‍වඥයන්ගේ; පාදරවින්දානි, පාදනමැතිපද්මයන්; අරවින්දානි, පද්මයෝ; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; අක්කන්තක්කන්තඨානතො, පියවර එබු එබූතෙනින්; උග්ගන්ත්වා, පැන නැගී; පතිගණ්හිංසු, පිළිගත්තාහුයි.

(376) තදා, එසමයෙහි; දෙහජොතිකදම්බෙහි; ශරීරරශ්මිකදම්බයෙන්; තස්මිං, ඒ පුරයෙහි; ගොපුර, වාසල්ද; අට්ටාල, අට්ටාලද; මන්දිරා, ප්‍රාසාදයෝද; පාකාරප්පභුතී, පවුරුපදනම්ආදීහුද; පිඤ්ජරත්තං ගතා, රන්වන්බවට ගියාහුයි.

(377) පවිසිත්වාන, නුවරටවැද; පුරවීථියං නුවරවීථියෙහි; පිණ්ඩාය, පිඬුපිණිස; චරන්තං, හැසිරෙන්නාවූ; ලොකාලොකකරං, ලොකයට ආලොකකරවූ; වීරං, වීරගුණයෙන් යුක්තවූ; සන්තං; ශාන්තගුණඇති; දන්තං, දැමූනාවූ පඤ්චෙන්ද්‍රියයන් ඇති; පභඞ්කරං, සොභාකරවූ; (ඒ සර්‍වඥයන්).

(378) පසාදජනකෙ, ප්‍රසාදඑලවන්නාවූ; රම්මෙ, සිත්කලුවූ; පාසාදෙ, ප්‍රාසාදයෙහි; සීතා, සිටියාවූ; සා යසොධරා, ඒ යසොධරාදෙවීතොම; සීහපඤ්ජරතො, සිංහමැදුරුකවුළුවෙන්; දිස්වා, දැක; පෙමපරායනා, ප්‍රෙමය පරමප්‍රතිෂ්ඨාකොට ඇත්තී.

379 භූසනෙ මණිරංසීහි භාසුරං රාහුලං වරං
ආමන්තෙත්වා පදස්සෙත්වා "තුය්හමෙ'සො පිතා"ති තං.

380 නිකෙතමු'පසඞ්කම්ම සුද්ධොදනයසස්සිනො
වන්දිත්වා තම'නෙකාහි ඉත්ථීහි පරිවාරිතා.

381 "දෙව දෙවින්දලීලාය පුත්තො තෙ'ධ පුරෙ පුරෙ
චරිත්වා චරතෙ'දානි පිණ්ඩායා'ති ඝරෙ ඝරෙ".

382 පවෙදෙසි පවෙදෙත්වා'ගමා මන්දිරම'ත්තනො
ආනන්දජලසන්දොහ පූරිතො'රුවිලොචනා.

383 තතො සෙසනරින්දානං ඉන්දො ඉන්දෙ'ව ලඞ්කතො
කම්පමානො'පගන්ත්වාන වෙගෙන ජිනසන්තිකං.

---

(379) භූසනේ, කුමාරාභරණයෙහි; මණිරංසීහි, මාණික්‍ය රශ්මීයෙන්; භාසුරං, බබලන්නාවූ; වරං, උතුම්වූ; රාහුලං, රාහුලකුමාරයන්; ආමන්තෙත්වා, කැඳවා; එසො, මේතෙම; තුය්හං පිතා ඉති, තොපගේ පියානන්වහන්සේයයි; තං, ඕහට; පදස්සෙත්වා, දක්වා.

(380) සුද්ධොදනයසස්සිනො, යශපිරිවර ඇත්තාවූ ශුද්ධොදනරජහුගේ; නිකෙතං, මාලිගාවට; උපසඞ්කම්ම, එළඹ; අනෙකාහි ඉත්ථීහි, නොයෙක්සියගණන් ස්ත්‍රීන්විසින්; පරිවාරිතා, පිරිවරණලද්දුව; තං, ඒශුද්ධොදනමහරජහට; වන්දිත්වා, වැඳ.

(381) දෙව, රජ්ජුරුවන්වහන්ස; තෙ පුත්තො, නුඹවහන්සේගේ පුතනුවන්වහන්සේ; ඉධ පුරෙ, මේපුරයෙහි; පුරෙ, පෙර; දෙවින්දලීලාය, ශක්‍රදෙවෙන්ද්‍රලීලාවෙන්; චරිත්වා, ඇවිද; ඉදානි, දැන්; ඝරෙ ඝරෙ, ගෙයක්ගෙයක්පාසා; පිණ්ඩාය, පිඬුපිණිස; චරතීති, ඇවිදිනාසේකැයි.

(382) පවෙදෙසි, දැන්වූව; පවෙදෙත්වා, දන්වා; ආනන්දජලසන්දොහ, සන්තොෂබාෂ්පජලසමූහයෙන්; පූරිත, පිරුණාවූ; උරු, මහත්වූ; විලොචනා, නෙත්‍රයන් ඇත්තී; අත්තනො මන්දිරං, තමාගේ මාලිගාවට; අගමා, ගියාසි.

(383) තතො, ඉක්බිත්තෙන්; අලඞ්කතො, සැරසුනාවූ; ඉන්දො ඉව, ශක්‍රදෙවෙන්ද්‍රයාමෙන්; සෙසනරින්දානං, අවශෙෂරජදරුවන්ට; ඉන්දො, නායකවූ; (ශුද්ධොදනමහරජතෙම) කම්පමානො, වෙව්ලමින්; වෙගෙන, වහා; ජිනසන්තිකං, සර්වඥයන් සමීපයට; උපගන්ත්වාන, එළඹ.

384 "සක්‍යපුඞගව තෙ නෙ'ස වංසො මා චර මා චර
වංසෙ පුත්තෙ'කරාජා'පි න පිණ්ඩාය චරී පුරෙ".

385 ඉති වුත්තෙ නරින්දෙන මුනින්දො ගුණසෙඛරො
"තුය්හමෙ'සො මහාරාජ වංසො මය්හං පන'ඤ්ඤයො

386 බුද්ධවංසො"ති සම්බුද්ධවංසං තස්ස පකාසයී.
අථො තස්මිං ඨිතො යෙව දෙසෙන්තො ධම්මමු'ත්තරිං.

387 "උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මම්"ච්චාදිමු'ත්තමං.
ගාථං මනොරමං වත්වා සොතූනං සිවමා'වහං.

388 දස්සනග්ගරසං දත්වා සත්තපෙපත්වා තමු'ත්තමො
තෙනා'භියාචිතො තස්ස නිකෙතං සමුපාගතො.

---

(384) සක්‍යපුඞගව, ශාක්‍යශ්‍රෙෂ්ඨයානන්වහන්ස; එසො වංසො, මේපිඩුසිහන්නාවූ වංශයතෙම; තෙ වංසො න, තුබවහන්සේගේ වංශයෙක්නොවෙයි; (එහෙයින්) මාචර මාවර, නොහැසුරුණමැන ව නොහැසුරුණමැනව; පුත්ත, පුත්‍රයානන්වහන්ස; වංසෙ, අපගේ රාජවංශයෙහි; එකරාජාපි, එකරජකුත්; පුරෙ, පෙර; පිණ්ඩාය, පිඩු පිණිස; නචරී, නොහැසුරුණේසි.

(385) නරින්දෙන, නරෙන්ද්‍රවූ; (ශුද්ධොදනමහරජහුවිසින්); ඉතිවුත්තෙ, මෙසේකීකල්හි; ගුණසෙඛරො, ගුණයටමුදුන්මල්කඩක්බඳු වූ; මුනින්දො, මුනීන්ද්‍රවූ සර්වඥතෙම; මහාරාජ, මහරජ; එසො, මේ රාජවංශයතෙම; තුය්හං වංසො, තොපගේවංශය; මය්හං අඤ්ඤයො පන, මාගේ වංශය වනාහි.

(386) බුද්ධවංසොඉති, සර්වඥවංශයයි; සම්බුද්ධවංසං, සර්වඥවංශය; තස්ස, ඒ රජහට; පකාසයී, ප්‍රකාශකොටවදාළසේක; අථො, ඉක්බිත්තෙන්; තස්මිං ඨිතොයෙව, ඒ ස්ථානයෙහි සිටියේම; උත්තරිං, මතුයෙහි; ධම්මං දෙසෙන්තො, ධර්මදෙශනා කරන්නේ.

(387) උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මංඉති, "උත්තිට්ඨෙ නප්පම ජ්ජෙය්‍ය ධම්මං"යන; ආදිං, මේ ආදිවූ; මනොරමං, සිත්කලුවූ; සො තූනං, අසන්නාවුන්ට; සිවමාවහං, නිර්වාණයඑලවන්නාවූ; උත්තමං ගාථං, උතුම්වූ ගාථාව; වත්වා, වදාරා.

(388) දස්සනග්ගරසං, ප්‍රථමමාර්ගනමැතිඋතුම්වූ රසය; දත්වා, දී; තං, ඒ රජහු; සත්තපෙපත්වා, පිණවා; උත්තමො, උතුම්වූ (ඒ සර්වඥ තෙම); තෙන, ඒරජහුවිසින්; අභියාචිතො, විශෙෂයෙන් යාච්ඤා කරණලද්දේ; තස්ස නිකෙතං, ඒරජහුගේමාලිගාවට; සමුපාගතො, එළඹියේය.

389 සද්ධිං වීසසහස්සෙහි තාදිහි දිපදුත්තමං
මධුරොදනපානෙන සන්තප්පෙත්වා මහීපති.

390 චූළාමණිමරීචීහි පිඤ්ජරඤ්ජලිකෙහි තං
රාජූහි සහ වන්දිත්වා නිසීදි ජිනසන්තිකෙ.

391 තා'පි නෙකසතා ගන්ත්වා සුන්දරා රාජසුන්දරී
නරින්දෙන අනුඤ්ඤාතා නිසීදිංසු තහිං තදා.

392 දෙසෙත්වා මධුරං ධම්මං තිලොකතිලකො ජිනො
අහමජ්'ජ න ගච්ඡෙය්‍යං සචෙ බිම්බාය මන්දිරං.

393 දයාය හදයං තස්සා ඵාලෙය්‍යා'ති දයාලයො
සාවකග්ගයුගං ගය්හ මන්දිරං පිතරා ගතො.

---

(389) මහීපති, පෘථිවීශ්වරවූ ඒ රජතෙම; තාදිහි, තාදිර්ගුණයෙන් යුක්තවූ; වීසසහස්සෙහි සද්ධිං, විසිදහසක් ක්ෂීණාශ්‍රවයන්වහන්සේ හා සමග; දිපදුත්තමං, දිපදෙත්තමවූ සර්වඥයන්; මධුරොදනපානෙන, මිහිරිවූ ආහාරපානවර්ගයෙන්; සන්තප්පෙත්වා, පිණවා.

(390) චූළාමණිමරීචීහි, චූඩාමාණික්‍යරශ්මීන්; පිඤ්ජර, රන්වන්වූ; අඤ්ජලිකෙහි, ඇඳිලිඇති; රාජූහි සහ, රජදරුවන් හා සමග; තං, ඒ සර්වඥයන්; වන්දිත්වා, වැඳ; ජිනසන්තිකෙ, සර්වඥයන් සමීපයෙහි; නිසීදි, හුන්නේයි.

(391) තදා, එසමයෙහි; නෙකසතා, නොයෙක් සියගණන්; සුන්දරා, සොඳුරුවූ; තාපි රාජසුන්දරී, ඒරාජකුමාරිකාවෝද; නරින්දෙන, නරෙන්ද්‍රවූ ශුද්ධොදන මහරජහුවිසින්; අනුඤ්ඤාතා, අනුදන්නාලදුව; ගන්ත්වා, ගොස්; තහිං, ඒ ස්ථානයෙහි; නිසීදිංසු, උන්නාහුයි.

(392) තිලොකතිලකො, ත්‍රෛලොක්‍යයට තිලකාභරණයක් හා සමානවූ; ජිනො, සර්වඥතෙම; මධුරං ධම්මං, මිහිරිවූධර්මය; දෙසෙත්වා, දෙසා; අහං, මම; අජ්ජ, අද; බිම්බාය මන්දිරං, බිඹාදේවීන්ගේ මැදිරියට; සචෙ න ගච්ඡෙය්‍යං, ඉදින් නොගියෙම්වීම්නම්.

(393) තස්සා, ඒයශොධරාදේවීන්ගේ; දයාය, කාරුණායෙන්; හදයං, හෘදය; ඵාලෙය්‍යඉති, පැලීයන්නේයයි; දයාලයො, කාරුණාවට වාසස්ථානවූ සර්වඥතෙම; සාවකග්ගයුගං ගය්හ, අග්‍රශ්‍රාවකයුගලය ගෙණ; පිතරා, පියරජ්ජුරුවන් හා සමග; මන්දිරං, බිඹාදේවීන්ගේ මැදිරියට; ගතො, ගියේයි.

394 නිසීදි පවිසිත්වාන බුද්ධො බුද්ධාසනෙ තහිං
ඡබ්බණ්ණරංසිජාලෙහි භාසුරන්තො'ව භානුමා.

395 මනොසිලාචුණ්ණසමානදෙහමරීචිජාලෙහි විරාජමානා
පකම්පිතා හෙමලතා'ව බිම්බා බිම්බාධරා සුණ්හු සමීප'මාග.

396 සුණ්හු පාදෙසු සම්ඵස්සසීතලුත්තමවාරිනා
නිබ්බාපෙසි මහාසොකපාවකං හදයිඞ්ඛනෙ.

397 රාජා සුණ්හු පවෙදෙසි බිම්බායා'ති බහුං ගුණං
මුනින්දො'පි පකාසෙසි චන්දකින්නරජාතකං.

398 තදා නන්දකුමාරස්ස සම්පත්තෙ මඞ්ගලත්තයෙ
විවාහො අභිසෙකො ච ඉති ගෙහප්පවෙසනං.

399 මඞ්ගලානං පුරෙයෙව පබ්බාජෙසි පභඞ්කරො
අනිච්ඡන්තං'ව නෙත්වා තං ආරාමං රම්මමුත්තමං.

---

(394) බුද්ධො, සර්වඥතෙම; පවිසිත්වාන, (රාජමන්දිරයට) වැද; භානුමා'ඉව, සූර්යයාමෙන්; ඡබ්බණ්ණරංසිජාලෙහි, සවණක්බුදුරැසින්; භාසුරන්තො, බබලමින්; තහිං බුද්ධාසනෙ, ඒබුද්ධාසනමස්තකයෙහි; නිසීදි, හුන්නේයි.

(395) මනොසිලාචුණ්ණසමාන, රන්වන්වූ සිරියල්සුණුහාසමානවූ; දෙහමරීචිජාලෙහි, ශරීරරශ්මිජ්වාලාවෙන්; විරාජමානා, බබලන්නාවූ; පකම්පිතා, විශෙෂයෙන්කම්පිතවූ; හෙමලතාඉව, ස්වර්ණලතාවක්වැනිවූ; බිම්බාධරා, බිඹුපලයන්බඳුවූ අධරයුගලයක්ඇති; බිම්බා, බිඹාදේවීතොම; සුණ්හුසමීපං, ස්නුෂයන් සමීපයට; ආග, පැමිණීය.

(396) සුණ්හු, ස්නුෂයන්ගේ; පාදෙසු, පාදයෙහි; සම්ඵස්ස, ස්පර්ශනමැති; සීතල, සිහිල්වූ; උත්තම, උතුම්වූ; වාරිනා, ජලයෙන්; හදයිඞ්ඛනෙ, හෘදයනමැතිඉඞ්ඛනයෙහි (ඇවිලගත්තාවූ;) මහාසොකපාවකං, මහත්වූශොකනමැති වහ්නිය; නිබ්බාපෙසි, නිවූයේයි.

(397) රාජා, ශුද්ධොදනමහරජතෙම; බිම්බාය, බිඹාදෙවීන්ගේ; අතිබහුං ගුණං, ඉතාබොහෝගුණ; සුණ්හු, ස්නුෂයන්ට; පවෙදෙසි, දැන්විය; මුනින්දොපි, සර්වඥද; චන්දකින්නරජාතකං, චන්දකින්නරජාතකය; පකාසෙසි, ප්‍රකාශකෙළේයි.

(398) තදා, එසමයෙහි; නන්දකුමාරස්ස, නන්දකුමාරයාහට; විවාහො, විවාහයද; අභිසෙකොච, අභිෂෙකයද; ගෙහප්පවෙසනං ඉති, ගෘහප්‍රවෙශණයද යන; මඞ්ගලත්තයෙ, මඟුල්තුන; සම්පත්තෙ, පැමිණිකල්හි.

(399) පභඞ්කරෝ, සොභාකරවූ සර්වඥතෙම; මඞ්ගලානං, මඞ්ගලයන්ට; පුරෙයෙව, පළමුකොටම; තං, ඒනන්දකුමාරයන්; අනිච්ඡ

400 අත්තානම'නුගච්ඡන්තං දායජ්ජත්ථං සකත්‍රජං
කුමාරං රාහුලං වා'පි කුමාරාභරණුජ්ජලං.

401 "සුඛා'ව ඡායා තෙ මෙ"ති උග්ගිරන්තං ගිරං පියං
"දායජ්ජං මෙ දදාහී'ති දායජ්ජං මෙ දදාහි ච".

402 ආරාමමෙව නෙත්වාන පබ්බාජෙසි නිරුත්තරං
සද්ධම්මරතනං දත්වා දායජ්ජං තස්ස ධීමතො.

403 නික්ඛම්ම තම්හා සුගතංසුමාලි තහිං තහිං ජනතාසරොරුහානි
සද්ධම්මරංසීහි විකාසයන්තො උපාගතො රාජගහං පුනා'පි.

404 කුසුමාකුල සුන්දරතරුපවනෙ පදුමුප්පලභාසුරසරනිකරෙ
පුථුවඩ්ඪකම්මමණ්ඩිතසිතසිකතෙ සුභසීතවනෙ විහරති සුගතො.

---

න්තං එව, නොකැමැතිපරිද්දෙන්ම; උත්තමං, උතුම්වූ; රම්මං, සිත් කලුවූ; ආරාමං නෙත්වා, විහාරයට ගෙණගොස්; පබ්බාජෙසි, මහණ කරවූයේයි.

(400) දායජ්ජත්ථං, දායාදපිණිස; අත්තානං, තමන්වහන්සේට; අනුගච්ඡන්තං, අනුව යන්නාවූ; සකත්‍රජං, ස්වකීය පුත්‍රවූ; කුමාරාභරණුජ්ජලං, කුමාරාභරණයෙන් දිලියෙන්නාවූ; රාහුලං වාපි කුමාරං, රාහුලකුමාරයන්ද.

(401) තෙ, තුඹවහන්සේගේ; ඡායා, ඡායාව; මෙ, මට; සුඛාවඉති, සැපම වන්නේයයි කියාද; මෙ, මට; දායජ්ජං දදාහි දායජ්ජං දදාහි ච ඉති, දායාද දුනමැනව දායාද දුනමැනවැයි කියාද; පියං ගිරං උග්ගිරන්තං, ප්‍රියතෙපුල් කියන්නාවූ රාහුලකුමාරයන්.

(402) ආරාමමෙව නෙත්වාන, විහාරයටම ගෙණගොස්; ධීමතො, ප්‍රාඥවූ; තස්ස, ඒ රාහුලකුමාරයාහට; නිරුත්තරං, උත්තරිතරයක් නැත්තාවූ; සද්ධම්මරතනං දායජ්ජං දත්වා, සද්ධර්මරත්නනමැති දායාද දී; පබ්බාජෙසි, මහණ කරවූසේකි.

(403) තම්හා, ඒ රජගහනුවරින්; නික්ඛම්ම, නික්ම; සුගතං සුමාලී, සර්වඥනමැති සූර්‍ය්‍යතෙම; තහිංතහිං, ඒ ඒ ස්ථානයෙහි; ජනතාසරොරුහානි, සත්ත්වනමැති පද්මයන්; සද්ධම්මරංසීහි, සද්ධර්මනමැති රශ්මීන්; විකාසයන්තො, ප්‍රබොධකෙරෙමින්; පුනාපි, නැවතද; රාජගහං, රජගහනුවරට; උපාගතො, පැමිණියේයි.

(404) කුසුම, පුෂ්පයෙන්; ආකුල, ගැවසීගත්තාවූ; සුන්දර, සොඳුරුවූ; තරුපවනෙ, උපවනවෘක්ෂයන් ඇති; පදුමුප්පල, පද්මොත්පලයෙන්; භාසුර, බබලන්නාවූ; සරනිකරෙ, පුෂ්කරණී සමූහයන්

405 තදා සුදත්තවහයසෙට්ඨිසෙට්ඨො
බහූහි භණ්ඩං සකටෙහි ගය්හ
සාවත්ථිතො රාජගහෙ මනුඤ්ඤෙ
සහායසෙට්ඨිස්ස ඝරූ'පගන්ත්වා.

406 තෙනෙ'ව වුත්තො සුභගෙන බුද්ධො
ජාතො'ති ලොකෙ දිපදුත්තමින්දො
සඤ්ජාතපීතීහි උදග්ගචිත්තො
රත්තිං පභාතං ඉති මඤ්ඤමානො.

407 නික්ඛම්ම තම්හා විගතන්ධකාරෙ
දෙවානුභාවෙන මහාපථම්හි
ගන්ත්වාන තං සීතවනං සුරම්මං
සම්පුණ්ණචන්දං'ව විරාජමානං.

---

ඇති; පුථු, මහත්වූ; චඞ්කම, සක්මනින්; මණ්ඩිත, හෙබියාවූ; සිත සිකතෙ, ධවලවූ වාලුකාස්තලයන් ඇති; සුභ, සුන්දරවූ; සීතවනෙ, ශීතවනාරාමයෙහි; සුගතො, සර්වඥතෙම; විහරති, වාසයකරන්නේයි.

(405) තදා, එසමයෙහි; සුදත්තවහයසෙට්ඨිසෙට්ඨො, සුදත්ත නම් සිටුශ්‍රෙෂ්ඨතෙම; බහූහි සකටෙහි, බොහෝගැලින්; භණ්ඩං ගය්හ, විකිණිබඩු ගෙණ; සාවත්ථිතො, සැවැත්නුවරින් නික්ම; මනුඤ්ඤෙ, මනොඥවූ; රාජගහෙ, රජගහනුවර; සහායසෙට්ඨිස්ස, යහලුසිටාණන්ගේ; ඝර, ගෘහයට; උපගන්ත්වා, එළඹ.

(406) තෙනෙවසුභගෙන, ඒ මහාකුසල් ඇති සිටුපුත්‍රයා විසින්ම; ලොකෙ, ලෝකයෙහි; දිපදුත්තමින්දො, දිපදොත්තමවූ; බුද්ධො, සර්වඥතෙම; ජාතො'ති, පහළවූයේයයි; වුත්තො, කියනලද්දේ; සඤ්ජාත, හටගත්තාවූ; පීතීහි, ප්‍රීතීන්; උදග්ගචිත්තො, ඔද වැඩියාවූ සිත් ඇතිව; රත්තිං, රාත්‍රිය; පභාතං ඉති, අළුවියයි (හෙවත් පහන් වියයි;) මඤ්ඤමානො, සිතන්නේ.

(407) තම්හා, ඒනුවරින්; නික්ඛම්ම, නික්ම; විගතන්ධකාරෙ, පහවූ අන්ධකාරයන් ඇති; මහාපථම්හි, මහත්වූමාර්ගයෙහි; දෙවානුභාවෙන, දිව්‍යානුභාවයෙන්; සුරම්මං, අතිශයින් සිත්කළුවූ; තංසීතවනං, ඒ ශීතවනාරාමයට; ගන්ත්වාන, ගොස්; සම්පුණ්ණචන්දංව, සම්පූර්ණචන්ද්‍රයාමෙන්; විරාජමානං, බබලන්නාවූ.

408 තං දීපරුක්ඛං විය පජ්ජලන්තං
විලොචනානන්දකරං මහෙසිං
දිස්වාන තස්සු'ත්තමපාදරාගං
පටිග්ගහෙත්වා සිරසා සුධීමා.

409 ගම්භීරං නිපුණං ධම්මං සුණිත්වා විමලං වරං
සොතාපත්තිඵල'මපත්වා සහස්සනය මණ්ඩිතං.

410 නිමන්තෙත්වාන සම්බුද්ධං සසඞ්ඝං ලොකනායකං
වණ්ණගන්ධරසූපෙතං දත්වා දානං සුඛාවහං.

411 සත්ථු ආගමනත්ථාය සාවත්ථිනගරං වරං
පටිඤ්ඤං සො ගහෙත්වාන ගච්ඡන්තො අන්තරාපථෙ.

412 යොජනෙ යොජනෙ චාරු චිත්තකම්මසමුජ්ජලෙ
විහාරෙ පවරෙ දත්වා කාරාපෙත්වා බහුං ධනං.

---

(408) දීපරුක්ඛංවිය, ප්‍රදීපවෘක්ෂයක්මෙන්; පජ්ජලන්තං, දිලිහෙන්නාවූ; විලොචන, නෙත්‍රයට; ආනන්දකරං, සන්තොෂකරවූ; තං මහෙසිං, ඒ මහර්ෂීවූ සර්වඥයන්; දිස්වාන, දැක; තස්ස, ඒ සර්වඥයන්ගේ; උත්තමපාදරාගං, උතුම්පාදපද්මය; සිරසා, මස්තකයෙන්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; සුධීමා, සුන්දරවූප්‍රඥඇති ඒ සිටුපුත්‍රතෙම.

(409) ගම්භීරං, ගැඹුරුවූ; නිපුණං, සූක්ෂමවූ; විමලං, නිර්මලවූ; වරං, උතුම්වූ; ධම්මං, ධර්මය; සුණිත්වා, අසා; සහස්සනය මණ්ඩිතං, දහසක්නයින් හෙබියාවූ; සොතාපත්තිඵලං, ශ්‍රොතාපත්තිඵලයට; පත්වා, පැමිණ.

(410) සසඞ්ඝං, සංඝසහිතවූ; ලොකනායකං, ලොකස්වාමිවූ; සම්බුද්ධං, සර්වඥයන්; නිමන්තෙත්වාන, පවරා; වණ්ණගන්ධරසූපෙතං, වර්ණගන්ධරසයෙන්යුක්තවූ; සුඛාවහං, සැපඑලවන්නාවූ; දානං දත්වා, දන්දී.

(411) වරං, උතුම්වූ; සාවත්ථිනගරං, සැවැත්නුවරට; සත්ථු, සර්වඥයන්ගේ; ආගමනත්ථාය, වැඩීම්පිණිස; පටිඤ්ඤං ගහෙත්වාන, ප්‍රතිඥගෙණ; අන්තරාපථෙ, අතුරුමග; ගච්ඡන්තො, යන්නාවූ; සො, ඒ සිටුපුත්‍රතෙම.

(412) යොජනෙ යොජනෙ, යොදනක් යොදනක් පාසා; බහුං ධනං, බොහෝවස්තු; දත්වා, දී; චාරු, මනොඥවූ; චිත්තකම්මසමුජ්ජලෙ, චිත්‍රකර්මාන්තයෙන් බබලන්නාවූ; පවරෙ, උතුම්වූ; විහාරෙ, විහාරයන්; කාරාපෙත්වා, කරවා.

413 සාවත්ථිං පුන'රාගන්ත්වා පාසාදසතමණ්ඩිතං
තොරණඞ්ගිකපාකාරගොපුරාදිවිරාජිතං.

414 පුරං අපහසන්තං'ව දෙවින්දස්සා'පි සබ්බදා
සබ්බසම්පත්තිසම්පන්නං නච්චගීතාදිසොභිතං.

415 තස්මිං සො විහරෙය්‍යා'ති භගවා ලොකනායකො
සමන්තානුවිලොකෙන්තො විහාරාරහභූමිකං.

416 ජෙතරාජකුමාරස්ස උය්‍යානං නන්දනොපමං
ඡායූදකාදිසම්පන්නං භූමිභාගං උදික්ඛිය.

417 හිරඤ්ඤකොටිසන්ථාරවසෙනෙ'ව මහායසො
කිණිත්වා පවරෙ තම්හි නරාමරමනොහරෙ.

418 නිච්චං කිඞ්කිණිජාලනාදරුචිරං සිඞ්ගීව සිඞ්ගාකුලං
රම්මං නෙකමණීහි ඡන්නඡදනං ආමුත්තමුත්තාවලිං
නානාරාගවිතාන භාසුරතරං පුප්ඵාදිනා'ලඞ්කතං
චිත්‍රං ගන්ධකුටිං වරං සුවිපුලං කාරෙසි භූසෙඛරං.

---

(413–414) පාසාදසතමණ්ඩිතං, සියගණන් ප්‍රාසාදයෙන් හෙබියාවූ; තොරණ, තොරණින් හා; අඞ්ගික, ඇගෑයෙන් හා; පාකාර, පවුරෙන් හා; ගොපුරාදි, වාසල්ආදියෙන්; විරාජිතං, බබලන්නාවූ; සබ්බදා, හැමකල්හි; දෙවින්දස්සාපි, ශක්‍රදෙවෙන්ද්‍රයාගේද; තං පුරං, ඒ අමරවතීනම්රාජධානියට; අපහසන්තංඉව, අපහාසකරන්නාක් වැනිවූ; සබ්බසම්පත්තිසම්පන්නං, සියලුසම්පත්තීන්සමෘඬවූ; නච්චගීතාදි, නෘත්‍යගීතාදීන්; සොභිතං, බබලන්නාවූ; සාවත්ථිං, සැවැත්නුවරට; පුනරාගන්ත්වා, නැවත අවුත්.

(415) ලොකනායකො, ලොකස්වාමීවූ; සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජතෙම; තස්මිං විහරෙය්‍යඉති, කොතැනෙක්හි වාසයකෙරේදෙහෝයි; විහාරා රහභූමිකං, විහාරයට සුදුසුවූභූමිප්‍රදෙශයක්; සමන්තානුවිලොකෙන්තො, හාත්පසින් පරීක්‍ෂාකොට බලන්නේ.

(416) ජෙතරාජකුමාරස්ස, ජෙතනම්රාජකුමාරයාගේ; නන්දනොපමං, නන්දනොද්‍යානයට බඳුවූ උපමා ඇති; ඡායූදකාදිසම්පන්නං, ඡායෝදකාදීන්සමෘඬවූ; භූමිභාගං, භූමිප්‍රදෙශඇති; උය්‍යානං, උද්‍යානය; උදික්ඛිය, බලා.

(417) මහායසො, මහත්වූයශපිරිවරඇති; සො, ඒ සිටුපුත්‍රතෙම; හිරඤ්ඤකොටිසන්ථාර වසෙනෙව, රන්මසු වටින් සිටුවා ඇතිරීම් වශයෙන්ම; කිණිත්වා, මිහිණිගෙණ; නරාමරමනොහරෙ, දිව්‍යමනුෂ්‍යයන්ට සිත්කලුවූ; පවරෙ, උතුම්වූ; තම්හි, ඒ උද්‍යානයෙහි.

(418) නිච්චං, අනවරතයෙන්; කිංකිණිජාලනාද, කිඞ්කිණිකාජාලධවනියෙන්(හෙවත්) රන්රසුදැල්හඬින්; රුචිරං, සිත්කලුවූ; සිඞ්ගීඉව,

419 ජිනත්‍රජානමපි විසාලමාලයං
විතානනානාසයනාසනුජ්ජලං
සුමණ්ඩිතං මණ්ඩපචඞ්කමාදිනා
විලුම්පමානං මනලොචනං සදා.

420 අථාපි සණ්හාමලසෙතවාලුකං
සවෙදිකාචාරුවිසාලමාලකං
ජලාසයං සාතතිසීතලොදකං
සුගන්ධිසොගන්ධිකපඞ්කජාකුලං.

421 සුඵුල්ලසාලාසනසොකනාග
පුන්නාගපූගාදිවිරාජමානං
මනොරමං ජෙතවනාභිධානං
කාරාපයී සෙට්ඨි විහාරසෙට්ඨං.

---

පණිතකූටයක්මෙන්; සිඞ්ඝාකුලං, කොත්කැරැල්ලෙන්ගැවසීගත්ත වූ; රම්මං, සිත්කලුවූ; අනෙක, අනෙකප්‍රකාරවූ; මණීහි, මාණික්‍යයෙන්; ජනත„සොයනලද; ඡදනං, සෙවෙනිඇති; ආමුත්ත, වට කොට එල්වනලද; මුත්තාවලිං, මුතුදැල්පන්තිඇති; නානාරාග, නොයෙක් පැහැඇති; විතාන, වියනින්; භාසුරතරං, ඉතාබබලන් නාවූ; පුප්ඵාදිනා, සුවඳමල්ආදීන්; අලඞ්කතං, සැරහුනාවූ; චිත්‍රං, විසිතුරුවූ; වරං, උතුම්වූ; සුවිපුලං, ඉතාමහත්වූ; භූසෙඛරං, භූමි නමැති කාන්තාවට මුදුන්මල්කඩක්වැනිවූ; ගන්ධකුටිං, ගඳකිළිය; කාරෙසි, කරවී.

(419) ජිනත්‍රජානමපි, සර්වඥපුත්‍රවූ භික්ෂූන්වහන්සේලාටද; විතාන, වියනින් හා; නානා, අනෙකප්‍රකාරවූ; සයනාසන, සයනාසනයෙන්; උජ්ජලං, දිලියෙන්නාවූ; සුමණ්ඩිතං, මනාකොටසැරහුනාවූ; මණ්ඩප චඞ්කමාදිනා, මණ්ඩප හාසක්මන්මලුආදියෙන්ද; සදා, හැමකල්හි; මන, චිත්තයද; ලොචනං, නෙත්‍රයද; විලුම්පමානං, පැහැරගන්නාක් වැනිවූ; විසාලං, මහත්වූ; ආලයං, වාසස්ථානඇති.

(420) අථාපි, නැවතද; සණ්හ, සියුම්වූ; අමල, නිර්මලවූ; සෙත වාලුකං, සුදුවැලිතනනලද; සවෙදිකා, වෙදිකාසහිතවූ; (හෙවත්) පදනම්සහිතවූ; චාරු, මනොඥවූ; විසාල, මහත්වූ; මාලකං, මලු ඇති; සාත, මධුරවූ; අතිසීතල, ඉතාසිහිල්වූ; උදකං, ජලයඇති; සුගන්ධි, සුවඳැත්තාවූ; සොගන්ධික, හෙල්මැල්ලෙන් හා; පඞ්කජ, පඤ්චවිධපද්මයෙන්; ආකුල, ගැවසීගත්තාවූ; ජලාසයං, පොකුණු සමූහඇති.

(421) සුඵුල්ල, මනාවිකසිතවූ; සාල, සල්ගසින්ද; අසන, පියා ගසින්ද; අසොක, හෝපලුගසින්ද; නාග, නාගසින්ද; පුන්නාග, දොඹගසින්ද; පූගාදි, පුවක්ගස්ආදීන්ද; විරාජමානං, බබලන්නාවූ; මනොරමං, සිත්කලුවූ; ජෙතවනාභිධානං, ජෙතවනයයන නම් ඇති; විහාරසෙට්ඨං, උත්තමවූවිහාරය; සෙට්ඨි, අනේපිඬුමහසිටු තෙම; කාරාපයී, කරවී.

422 විසාලකෙලාසධරාධරුත්තමා–
භිරාමපාකාරපනිඤ්ඤගොපිතො
ජනස්ස සබ්බාභිමතත්ථසාධකො
විහාරචින්තාමණී සො විරාජතෙ.

423 තතො ආගමනත්ථාය මුනින්දං නාථපිණ්ඩිකො
දූතං පාහෙසි සො සත්ථා සුත්වා දූතස්ස සාසනං.

424 මහතා භික්ඛුසංඝෙන තදා තමහා පුරක්ඛතො
නික්ඛමිත්වා'නුපුබ්බෙන පත්තො සාවත්ථිමුත්තමං.

425 සමුජ්ජලානි නෙකානි ධජානාදය සුන්දරා
කුමාරා පුරතො සත්ථු නික්ඛමිංසු සුරා යථා.

426 නික්ඛමිංසු තතො තෙසං පච්ඡතො තරුණඞ්ගනා
චාරුපුණ්ණඝටාදය දෙවකඤ්ඤා යථා තථා.

(422) විසාල, මහත්වූ; කෙලාසධරාධර, කෛලාසකූටපර්වතය මෙන්; උත්තම, උතුම්වූ; අභිරාම, සිත්කලුවූ; පාකාරපනිඤ්ඤ, ප්‍රාකාර නමැතිනාගරාජයාවිසින්; ගොපිතො, රක්‍ෂාකරණලද්දවූ; ජනස්ස, සියලුජනයාහට; සබ්බාභිමතත්ථසාධකො, සියලුඅභිමතාර්ථසිද්ධක රන්නාවූ; සො විහාරචින්තාමණී, ඒ විහාරනමැතිචින්තාමාණික්‍යය තෙම; විරාජතෙ, බබලන්නේයි.

(423) තතො, ඉක්බිත්තෙන්; අනාථපිණ්ඩිකො, අනේපිඬුමහසිටු තෙම; මුනින්දං, සර්වඥයන්; ආගමනත්ථාය, වැඩීමපිණිස; දූතං, දූත යකු; පාහෙසි, යවූයේය; සො සත්ථා, ඒ ශාස්තෲවූ සර්වඥතෙම; දූත ස්ස, දූතයාගේ; සාසනං, හසුන්; සුත්වා, අසා.

(424) (සො සත්ථා, ඒ සර්වඥතෙම;) තදා, එසමයෙහි; මහතාභික්ඛු සඞෙඝන, මහත්වූභික්‍ෂුසමූහයාවිසින්; පුරක්ඛතො, පිරිවරණලද් දේ; තමහා, ඒ නුවරින්; නික්ඛමිත්වා, නික්ම; අනුපුබ්බෙන, අනුක්‍ර මයෙන්; උත්තමං, උතුම්වූ; සාවත්ථිං, සැවැත්නුවරට; පත්තො, පැමිණියේය.

(425) සමුජ්ජලානි, දිලිසෙන්නාවූ; නෙකානි, අනෙකප්‍රකාරවූ; ධජානි, ධ්වජයන්; ආදය, ගෙණ; සුන්දරා, සොඳුරුවූ; කුමාරා, කුමා රවරහු; සුරා යථා, දිව්‍යකුමාරවරුයම්සේද; (එපරිද්දෙන්) සත්ථු, සර්වඥයන්ගේ; පුරතො, අභිමුඛයෙහි; නික්ඛමිංසු, නික්මුණාහුයි.

(426) තතො, ඉක්බිත්තෙන්; තෙසං පච්ඡතො, ඔවුන්ගේපසුපස් සෙහි; චාරු, මනොඥවූ; තරුණඞ්ගනා, තරුණස්ත්‍රීහු; පුණ්ණඝටා දය, පූර්ණඝටයන්ගෙණ; දෙවකඤ්ඤා යථා, දිව්‍යකන්‍යාවෝයම්සේද; තථා, එපරිද්දෙන්; නික්ඛමිංසු, නික්මුනාහුයි.

427 පුණ්ණපාතිං ගහෙත්වාන සෙට්ඨිනො භරියා තථා
සද්ධිං නෙකසතිත්ථිහි නෙකාලඞ්කාරලඞ්කතා.

428 මහාසෙට්ඨි මහාසෙට්ඨිසතෙහි සහ නායකං
අබ්භුග්ගඤ්ඡි මහාවීරං පූජිතො තෙහි නෙකධා.

429 ඡබ්බණ්ණරංසීහි මනොරමෙහි
පුරං වරං පිඤ්ජරවණ්ණභාවං
නෙනෙන්තො මුනින්දො සුගතො සුගත්තො
උපාවිසී ජෙතවනං විහාරං.

430 චාතුද්දිසස්ස සඞ්ඝස්ස සම්බුද්ධපමුඛස්ස'හං
ඉමං දම්මි විහාරන්ති සත්ථු චාරුකරම්බුජෙ.

431 සුගන්ධවාසිතං වාරිං හෙමභිඞ්කාරතො වරං
ආකිරිත්වා අදා රම්මං විහාරං චාරුදස්සනං.

---

(427) සෙට්ඨිනො භරියා, අනේපිඬුමහසිටුහුගේ භාර්‍ය්‍යාතොම; පුණ්ණපාතිං ගහෙත්වාන, පූර්‍ණපාත්‍රීන්ගෙණ; නෙකසතිත්ථිහිසද්ධිං, නොයෙක් සියගණන් ස්ත්‍රීන්හාසමග; නෙකාලඞ්කාරලඞ්කතා, අනෙකප්‍රකාරවූ ආභරණයෙන්සැරහී; තථා, එසේම; (නික්ඛමි, නික්මුනායි).

(428) මහාසෙට්ඨි, අනේපිඬුමහසිටුතෙම; මහාසෙට්ඨිසතෙහිසහ, සියගණන් මහාසිටුවරුන්හාසමග; නායකං, ලොකස්වාමිවූ; මහාවීරං, සර්‍වඥයන්ට; අබ්භුග්ගඤ්ඡි, අභිමුඛව නික්මුනේය; තෙහි, ඔවුන් විසින්; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; පූජිතො, පුදනලද්දේ.

(429) මනොරමෙහි, සිත්කලුවූ; ඡබ්බණ්ණරංසීහි, සවණක්බුදුරැසින්; වරං, උතුම්වූ; පුරං, සැවැත්නුවර; පිඤ්ජරවණ්ණභාවං, රන්වන්බවට; නෙනෙන්තො, පමුණුවන්නාවූ; මුනින්දො, මුනීන්ද්‍රවූ; සුගත්තො, මනාවූගාත්‍රඇති; සුගතො, සර්‍වඥතෙම; ජෙතවනං විහාරං, ජෙතවනමහාවිහාරයට; උපාවිසී, පැමිණියේයි.

(430) අහං, මම; සම්බුද්ධපමුඛස්ස, සර්‍වඥයන් ප්‍රධානකොටඇති; චාතුද්දිසස්ස සඞ්ඝස්ස, සතරදිගින්වඩනාවූ භික්ෂුසඞ්ඝයාවහන්සේට; ඉමං විහාරං දම්මිඉති, මේවිහාරයදන්දෙමියි; සත්ථු, සර්‍වඥයන්ගේ; චාරු, මනොඥවූ; කරම්බුජෙ, හස්තනමැති පද්මයෙහි.

(431) හෙමභිඞ්කාරතො, සවර්ණභිඞ්කාරයෙන්; වරං, උතුම්වූ; සුගන්ධවාසිතං, සුවඳකවනලද්දාවූ; වාරිං, ජලය; ආකිරිත්වා, වත්කොට; රම්මං, සිත්කලුවූ; චාරුදස්සනං, මනොඥවූදර්ශනයන්ඇති; විහාරං, විහාරය; අදා, දන්දිනි (හෙවත්) පිළිගැන්වූයේයි.

432 සුරම්මං විහාරං පටිග්ගය්හ සෙට්ඨං
අනඝෙ විචිත්තාසනස්මිං නිසින්නො
ජනින්දුතමින්දෙ තිලොකෙකනෙත්තො
තිලොකප්පසාදාවහං තං මනුඤ්ඤං.

433 උදාරානිසංසං විහාරප්පදානෙ
අනාථප්පදානෙන නාථස්ස තස්ස
සුදත්තාභිධානස්ස සෙට්ඨිස්ස සත්ථා
යසස්සී හිතෙසී මහෙසී අදෙසී.

434 උදාරානිසංසං විහාරප්පදානෙ
කථෙතුං සමත්ථො විනා භූරිපඤ්ඤං
තිලොකෙකනාථං නරො කොසි යුත්තො
මුඛානං සහස්සෙහි නෙකෙහි වා'පි.

435 ඉති විපුලයසො සො තස්ස ධම්මං කථෙත්වා
අපි සකලජනානං මානසෙ තොසයන්තො
පරමමධුරනාදං ධම්මභෙරිං මහන්තං
විහරති පහරන්තො තත්ථ තත්ථූපගන්ත්වා.

---

(432) සුරම්මං, අතිශයින් සිත්කළුවූ; සෙට්ඨං, ශ්‍රේෂ්ඨවූ; තිලොකප්පසාදාවහං, ත්‍රෛලෝක්‍යයට ප්‍රසාද එළවන්නාවූ; මනුඤ්ඤං, මනොඥවූ; තං විහාරං, ඒ විහාරය; අනඝෙ, අනඝවූ; විචිත්තාසනස්මිං, විසිතුරුඅස්නෙහි; නිසින්නො, හුන්නාවූ; ජනින්දුතමින්දෙ, ජනේන්ද්‍රයන්ටශ්‍රේෂ්ඨවූ; තිලොකෙකනෙත්තො, ත්‍රෛලෝක්‍යයට අසහාය නෙත්‍රවූසර්වඥතෙම; පටිග්ගය්හ, පිළිගෙණ.

(433) විහාරප්පදානෙ, විහාරදන්දීමෙහි; උදාරානිසංසං, උදාරවූ ආනිසංසයන්; අනාථප්පදානෙන, අසරණයන්ටදන්දීම හෙතුකොට ගෙණ; අනාථස්ස, අනාථයයනනම්ඇති, තස්ස සුදත්තාභිධානස්ස සෙට්ඨිස්ස, ඒ සුදත්තනම්සිටුපුත්‍රයාහට (හෙවත්) ඒ අනේපිඬුමහසිටුහට; සත්ථා, ශාස්තෲවූ; යසස්සී, යසපිරිවරඇත්තාවූ; හිතෙසී, සියලුසත්ත්වයන්ටහිතවැඩකිරීමෙහිඇලුනාවූ; මහෙසී, මහර්ෂිවූ සර්වඥ තෙම; අදෙසී, දෙශනාකළේයි.

(434) විහාරප්පදානෙ, විහාරදන්දීමෙහි; උදාරානිසංසං, මහත්වූ අනුසස්; කථෙතුං, කියන්ට; තිලොකෙකනාථං, ත්‍රෛලෝක්‍යයට අසහායස්වාමිවූ; භූරිපඤ්ඤං විනා, පොළොවහාසමානවූනුවණඇති සර්වඥයන්හැර; මුඛානං, මුඛයන්සම්බන්ධිවූ; නෙකෙහිසහස්සෙහි, නොයෙක්දහස්ගණනින්; යුත්තොවාපි, යුක්තවූත්; කො නරො, කවරනම්සත්ත්වයෙක්; සමත්ථො ආසි, සමර්ථවීද.

(435) ඉතිවිපුලයසො, මෙසේමහත්වූයසපිරිවරඇති; සො, ඒ සර්වඥතෙම; තස්ස, ඒ අනේපිඬුමහසිටුහට; ධම්මංකථෙත්වා, ධර්මදෙශනාකොට; සකලජනානංඅපි, සියලුජනයන්ගේද; මානසෙ, චිත්තයන්;

436 එවං තිලොකහිතදෙන මහාදයෙන
ලොකුත්තමෙන පරිභුත්තපදෙසපන්තිං
නිච්චංසුරාසුරමහොරගරක්ඛසාදි
සම්පූජිතං අහමි'දානි නිදස්සයිස්සං.

437 සද්ධම්මරංසිනිකරෙහි ජිනංසුමාලි
වෙනෙය්‍යපඞ්කජවනානි විකාසයන්තො
වාසං අකාසි පවරො පඨමම්හි වස්සෙ
බාරාණසිම්හි නගරෙ මිගකානනම්හි.

438 නානප්පකාරරතනාපණපන්තිවීථි
රම්මෙ පුරෙ පවරරාජගහාභිධානෙ
වාසං අකාසි දුතියෙ තතියෙ චතුත්ථෙ
වස්සෙපි කානනතරවෙළුවනෙව නාථො.

---

තොසයන්තො, සතුටුකරවමින්; පරම, උත්කෘෂ්ටවූ; මධුරනාදං, මිහිරිවූනාදඇති; මහන්තං, මහත්වූ; ධම්මභෙරිං, ධර්මනමැතිබෙරිය; පහරන්තො, ගසමින්; තත්ථතත්ථූපගන්ත්වා, ඒ ඒ ස්ථානයට ගොස්; විහරති, වාසයකරන්නේයි.

(436) එවං, මෙසේ; තිලොකහිතදෙන, ත්‍රෛලොක්‍යයටහිතදායකවූ; මහාදයෙන, මහත්වූකරුණාඇති; ලොකුත්තමෙන, ලොකොත්තමවූසර්වඥයන්විසින්; පරිභුත්තපදෙසපන්තිං, ප්‍රයොජනවිඳිනාලදප්‍රදෙශපන්තිය; නිච්චං, නිරන්තරයෙන්; සුර, දෙවියන්විසින්ද; අසුර, අසුරයන්විසින්ද; මහොරග, මහත්වූ නාගමානවකයන්විසින්ද; රක්ඛසාදි, රාක්ෂසාදීන්විසින්ද; සම්පූජිතං, පුදනලද්ද; අහං, මම; ඉදානි, දැන්; නිදස්සයිස්සං, දක්වමි.

(437) පවරො, උතුම්වූ; ජිනංසුමාලි, සර්වඥනමැති සූර්‍ය්‍යතෙම; සද්ධම්මරංසිනිකරෙහි, සද්ධර්මනමැතිරශ්මි සමූහයෙන්; වෙනෙය්‍යපඞ්කජවනානි, විනෙයජනනමැති පද්මවනයන්; විකාසයන්තො, ප්‍රබොධකෙරෙමින්; පඨමම්හි වස්සෙ, පළමුවෙනිවසෙහි; බාරාණසිම්හි නගරෙ, බරණැස්නුවරසමීපයෙහිවූ; මිගකානනම්හි, මිගදෑවනයෙහි වාසං අකාසි, වාසයකෙළේයි.

(438) නාථො, ලොකස්වාමිවූසර්වඥතෙම; නානප්පකාර, අනෙකප්‍රකාරවූ; රතනාපණපන්ති, රුවන්සල්පිල්පන්තිඇති; වීථිරම්ම, වීථීන්සිත්කලුවූ; පවර, උතුම්වූ; රාජගහාභිධානෙ පුරෙ, රජගහනුවරසමීපයෙහිවූ; කානනතරවෙලුවනෙඑව, සිත්කලුවූවෙළුවනාරාමයෙහිම; දුතියෙ, දෙවෙනිවසද; තතියෙ, තුන්වෙනිවසද; චතුත්ථෙපිවස්සෙ, සතරවනවසද; වාසංඅකාසි, වාසයකෙළේයි.

439 භූපාලමොළිමණිරංසිවිරාජමානං
වෙසාලිනාමවිදිතං නගරං සුරම්මං
නිස්සාය සක්‍යමුනිකෙසරි පඤ්චමම්හි
වස්සම්හි වාසමකරිත්ථ මහාවනස්මිං.

440 උල්ලාතිනීලවිමලුප්පලචාරුනෙත්තො
සිඛිසමානතනුජොතිහි ජොතමානො
බුද්ධො අනන්තගුණසන්නිධි ඡට්ඨවස්සෙ
වාසං අකා විපුලමඞ්කුලපබ්බතස්මිං.

441 ගම්භීරදුද්දසතරං මධුරං මරූනං
දෙසෙත්ව ධම්මමතුලො සිරිසන්නිවාසො
දෙවින්දසීතලවිසාලසිලාසනස්මිං
වස්සම්හි වාසමකරී මුනි සත්තමම්හි.

442 උල්ලාරවින්දචරණො චරණාධිවාසො
සො සුංසුමාරගිරිනාමධරාධරම්හි
වාසං අකා පරමමාරජී අට්ඨමස්මිං
වස්සම්හි නානාතරභෙසකලාවනම්හි.

---

(439) සක්‍යමුනිකෙසරී, ශාක්‍යමුනිශ්‍රෙෂ්ඨතෙම; භූපාල, රජදරුවන්ගේ; මොළිමණිරංසි, මකුටමාණික්‍යරශ්මීන්; විරාජමානං, බබලන්නාවූ; සුරම්මං, අතිශයින් සිත්කලුවූ; වෙසාලිනාමවිදිතං, විශාලනමින්ප්‍රසිද්ධවූ; නගරං නිස්සාය, පුරයනිසා; මහාවනස්මිං, මහවනයෙහි; පඤ්චමම්හිවස්සම්හි, පස්වෙනිවසෙහි; වාසං අකරිත්ථ, වාසයකොළේයි.

(440) උල්ල, විකසිතවූ; අතිනීල, විශෙෂයෙන්නිල්වූ; විමල, නිර්මලවූ; උප්පල, උත්පලයන් හා සමානවූ; චාරුනෙත්තො, මනොඥවූ නෙත්‍රයන් ඇති; සිඛිසමාන, සිඛීසවණීයක් හාසමානවූ; තනුජොතිහි, ශරීරශොභාවෙන්; ජොතමානො, බබලන්නාවූ; අනන්තගුණසන්නිධි, අපරියන්තගුණයන්ට වාසස්ථානවූ; බුද්ධො, සර්වඥතෙම; විපුල, මහත්වූ; මඞ්කුලපබ්බතස්මිං, මකුල්පව්වෙහි; ඡට්ඨවස්සෙ, සවෙනිවස; වාසංඅකා, වාසයකොළේයි.

(441) ගම්භීර, ගැඹුරුවූ; දුද්දසතරං, ඉතාදක්කනොහැක්කාවූ; මධුරං, මිහිරිවූ; ධම්මං, ධර්මය; මරූනං, දෙවියන්ට; දෙසෙත්වා, දෙසා; අතුලො, අසදෘශවූ; සිරිසන්නිවාසො, ශ්‍රියටවාසස්ථානවූ; මුනි, සර්වඥතෙම; දෙවින්ද, ශක්‍රදෙවෙන්ද්‍රයාගේ; සීතල, සිහිල්වූ; විසාල, මහත්වූ; සිලාසනස්මිං, පාණ්ඩුකම්බලශෛලාසනමස්තකයෙහි; සත්තමම්හි වස්සම්හි, සත්වෙනිවසෙහි; වාසං අකාරි, වාසයකොළේයි.

(442) උල්ල, විකසිතවූ; අරවින්ද, පද්මයන් හා සමානවූ; චරණො, පාදමණ්ඩයන් ඇති; චරණාධිවාසො, පසළොස්චරණධර්මයන්ට වාසස්ථානවූ; පරමමාරජී, උත්කෘෂ්ටවූමාරවිජයකළාවූ; සො, ඒ සර්වඥ

443 නානාමතාතිබහුතිත්ථියසප්පදප්පං
හන්ත්වා තිලොකතිලකො නවමම්හි වස්සෙ
වාසං අකාසි රුචිරෙ අතිදස්සනීයෙ
කොසම්බිසිම්බලිවනෙ ජිනපක්ඛිරාජා.

444 තෙසං මහන්තකලහං සමිතුං යතීනං
නිස්සාය වාරණවරං දසමම්හි වස්සෙ
පුප්ඵාභිකිණ්ණවිපුලාමලකානනස්මිං
වාසං අකා මුනිවරො වරපාරලෙය්‍යෙ.

445 ධම්මාමතෙන ජනතං අජරාමරත්තං
නෙන්තො විලොචනමනොහරසුද්ධදන්තො
නාලාභිධානදිජගාමවරෙ මුනින්දො
වාසං අකා අමිතබුද්ධි දසෙකවස්සෙ.

---

තෙම; සුංසුමාරගිරිනාමධරාධරම්හි, සුංසුමාරගිරිනම් පර්වතය සමීපයෙහි; කානනතර, ඉතාසිත්කලුවූ; භෙසකලාවනම්හි, භෙසකලාවනයෙහි; අට්ඨමස්මිංවස්සම්හි, අටවෙනිවසෙහි; වාසං අකා, වාසය කෙළේය.

(443) නානාමත, අනෙකප්‍රකාරවූ මතාන්තරයන්ඇති; අතිබහු, ඉතාබොහෝවූ; තිත්ථියසප්ප, තීර්ථකනමැති සර්පයින්ගේ; දප්පං, එඩි; හන්ත්වා, නසා; නවමම්හිවස්සෙ, නවවෙනිවසෙහි; රුචිරෙ, සිත්කලුවූ; අතිදස්සනීයෙ, අතිශයින්දර්ශනීයවූ; කොසම්බිසිම්බලිවනෙ, කොසඹෑනුවර කොලහිඹුල්වනයෙහි; තිලොකතිලකො, ත්‍රෛලෝක්‍යයටතිලකාභරණයක්හාසමානවූ; ජිනපක්ඛිරාජා, සර්වඥනමැති පක්ෂිරාජතෙම; වාසං අකාසි, වාසයකෙළේය.

(444) තෙසං යතීනං, ඒකොසම්බකඛණ්ඩකභික්ෂූන්ගේ; මහන්තකලහං, මහත්වූවිවාදය; සමිතුං, සංහිඳුවනුපිණිස; වාරණවරං නිස්සාය, උතුම්වූපාරලෙය්‍යනම් හස්තිරාජයානිසා; දසමම්හිවස්සෙ, දසවෙනිවසෙහි; වර, උතුම්වූ; පාරලෙය්‍යෙ, පාරලෙය්‍යනම්වූ; පුප්ඵ, පුෂ්පයෙන්; අභිකිණ්ණ, ගැවසීගත්තාවූ; විපුල,මහත්වූ; අමල, නිර්මලවූ; කානනස්මිං, වනයෙහි; මුනිවරො, සර්වඥරාජතෙම; වාසං අකා, වාසයකෙළේය.

(445) ධම්මාමතෙන, ධර්මනමැතිඅමෘතයෙන්; ජනතං, ජනසමූහයා; අජරාමරත්තං, අජරාමරබවට; නෙන්තො, පමුණුවන්නාවූ; විලොචන, නෙත්‍රයට; මනොහර,සිත්කලුවූ; සුද්ධදන්තො, පිරිසිදුවූ දන්තයන්ඇති; මුනින්දො, මුනීන්ද්‍රවූ; අමිතබුද්ධි, ප්‍රමාණාතික්‍රාන්තවූ බුද්ධිඇතිසර්වඥතෙම; දසෙකවස්සෙ, එකොළොස්වෙනිවසෙහි; නාලාභිධානදිජගාමවරෙ, නාලානම්වූ බ්‍රාහ්මණග්‍රාමයෙහි; වාසං අකා, වාසයකෙළේය.

446 වෙරඤ්ජචාරුදිජගාමසමීපභූතෙ
ආරාමකෙ සුරභිපුප්ඵඵලාභිරාමෙ
සබ්බඤ්ඤු සක්‍යමුනි බාරසමම්හි වස්සෙ
වාසං අකාසි පුචිමන්දදුමින්දමූලෙ.

447 ඵුල්ලාරවින්දවදනො රවිචාරුසොභො
ලොකස්ස අත්ථචරියාය දයාධිවාසො
වාසං අකා රුචිරවාලියපබ්බතස්මිං
වීරො තිලොකගරු තෙරසමම්හි වස්සෙ.

448 බන්ධූකපුප්ඵසමපාදකරාභිරාමො
ධම්මිස්සරො පවරජේතවනෙ සුරම්මෙ
ධීරො මහිද්ධි මුනි චුද්දසමම්හි වස්සෙ
වාසං අකා සකලසත්තහිතෙසු යුත්තො.

---

(446) වෙරඤ්ජ, වෙරඤ්ජනම්වූ; චාරු, මනොඥවූ; දිජගාමසමීපභූතෙ, බ්‍රාහ්මණග්‍රාමයට සමීපවූ; සුරභි, සුවඳැත්තාවූ; පුප්ඵඵලාභිරාමෙ, පුෂ්පඵලයෙන් සිත්කලුවූ; ආරාමකෙ, විහාරයෙහි; සබ්බඤ්ඤු, සියල්ලදත්තාවූ; සක්‍යමුනි, ශාක්‍යමුනිවූ සර්වඥතෙම; බාරසමම්හි වස්සෙ, දොළොස්වෙනිවසෙහි; පුචිමන්දදුමින්දමූලෙ, කොසඹරුක්මුල්හි; වාසං අකාසි, වාසය කෙළේයි.

(447) ඵුල්ල, විකසිතවූ; අරවින්දවදනො, පද්මයක් හා සමානවූ මුඛඇති; රවි, සූර්‍ය්‍යයා හා සමානවූ; චාරුසොභො, මනොඥවූ ශොභාඇති; දයාධිවාසො, දයාවටවාසස්ථානවූ; තිලොකගරු, ත්‍රෛලොක්‍යයට ගුරුවූ; වීරො, වීරගුණයෙන් යුක්තවූ සර්වඥතෙම; ලොකස්ස අත්ථචරියාය, ලොකවාසීවූ සත්ත්වයන්ට හිතවැඩෙහිහැසිරීම පිණිස; රුචිර, මනොඥවූ; වාලියපබ්බතස්මිං, වාලියපර්වතයෙහි, තෙරසමම්හිවස්සෙ, තෙළෙස්වැනිවසෙහි; වාසං අකා, වාසය කෙළේයි.

(448) බන්ධූකපුප්ඵසම, බඳුවදමලකටබඳුවූ; පාද, ශ්‍රීපාදයෙන් හා; කර, හස්තයෙන්; අභිරාමො, මනොඥවූ; ධීරො, ප්‍රාඥවූ; මහිද්ධි, මහත්වූ ඍද්ධිඇති; සකලසත්තහිතෙසු, සියලුසත්ත්වයන්ටහිතවැඩකිරීමෙහි; යුත්තො, යෙදුනාවූ; ධම්මිස්සරො, ධර්මෙශ්වරවූ; මුනි, සර්වඥතෙම; සුරම්මෙ, අතිමනොඥවූ; පවරජෙතවනෙ, උතුම්වූජෙතවනාරාමයෙහි; චුද්දසමම්හි වස්සෙ, තුදුස්වෙනිවසෙහි; වාසං අකා, වාසයකෙළේයි.

449 වෙනෙය්‍යබන්ධවනරාගගජේ විහන්ත්වා
වස්සම්හි පඤ්චදසමෙ මුනිසීහරාජා
වාසං අකා කපිලවත්ථුවරාධරොරු
නිග්‍රොධරාමරමණීයමණීගුහායං.

450 යක්ඛම්පි කක්ඛලතරං සුවිනීතභාවං
නෙත්වා පුරෙ වරතමාලවකාභිධානෙ
වස්සම්හි වාසමකරී දසඡට්ඨමම්හි
නෙන්තො ජනං බහුතරම්පි ච සන්තිමග්ගං.

451 පාකාරගොපුරනිකෙතනතොරණාදි
නෙත්තාභිරාමවරරාජගහෙ මහෙසි
වාසං අකානධිවරො දසසත්තමම්හි
වස්සම්හි පත්ථටයසො භුවනත්තයස්මිං.

452 ධම්මොසධෙන මධුරෙනසුඛාවහෙන
ලොකස්ස ඝොරතරරාගරජං විහන්ත්වා
වස්සම්හි වාසමකරී දසඅට්ඨමස්මිං
අඞ්ගීරසො පවරවාලියපබ්බතස්මිං.

---

(449) වෙනෙය්‍යබන්ධුවන, විනෙයබන්ධුනමැතිවනයෙහි; රාගගජේ, රාගනමැතිහස්තීන්; විහන්ත්වා, නසා; මුනිසීහරාජා, සර්වඥනමැතිසිංහ රාජන්තෙම; පඤ්චදසමෙවස්සම්හි, පසළොස්වැනිවසෙහි; කපිලවත්ථුවරාධරොරු, කිඹුල්වත්පුරනමැති මහත්පතීතයෙහි; නිග්‍රොධරාම, නිග්‍රොධාරාමනමැති; රමණීයමණීගුහායං, සිත්කලුවූ මාණික්‍යගුහායෙහි; වාසං අකා, වාසයකොළේයි.

(450) කක්ඛලතරං, අතිශයින් කර්කශවූ; යක්ඛම්පි, ආලවකයක්ෂයාද; සුවිනීතභාවං, අතිශයින්විනීතභාවයට; නෙත්වා, පමුණුවා; වරතමාලවකාභිධානෙපුරෙ, අතිශයින් උතුම්වූ ඒඅලව්පුරයෙහි; මුනි, සර්වඥතෙම; බහුතරම්පිච, ඉතා බොහෝවූද; ජනං, ජනයා; සන්තිමග්ගං, උතුම්වූනිර්වාණමාර්ගයට; නෙන්තො,පමුණුවන්නේ; දසඡට්ඨමම්හි වස්සම්හි, සොළොස්වෙනිවසෙහි, වාසං අකරී, වාසයකොළේයි.

(451) භුවනත්තයස්මිං, ලොකත්‍රයෙහි; පත්ථටයසො, පතළාවූ යශස්ඇති;අනධිවරො,තමන්වහන්සේටවඩා අධිකතරයක්නුනැති හෙයින් අනධිවරනම්වූ; මහෙසි,මහර්ෂීවූ සර්වඥතෙම; පාකාර, පව්රෙන්ද; ගොපුර, වාසලින්ද; නිකෙතන, මාලිගාවෙන්ද; තොරණාදි, තොරණාදියෙන්ද; නෙත්ත, නෙත්‍රයට; අභිරාම, සිත්කලුවූ; වර, උතුම්වූ; රාජගහෙ, රජගහනුවර; දසසත්තමම්හි වස්සම්හි, සතළොස්වෙනිවසෙහි; වාසං අකා, වාසයකොළේයි.

(452) මධුරෙන, මිහිරිවූ; සුඛාවහෙන, සැපඑලවන්නාවූ; ධම්මො

453 වෙනෙය්‍යබන්ධුජනමොහරිපුං උළාරං
හන්ත්වාන ධම්මඅසිනා වරධම්මරාජා
එකූනවීසතිමකෙ පුන තත්‍ථ වස්සෙ
වාසං අකා මධුරභාරති ලොකනාථො.

454 සුද්ධාසයො පවරරාජගහෙ විචිත්තෙ
වාසං අකාසි සමවීසතිමම්හි වස්සෙ
ලොකස්ස අත්‍ථචරණෙ සුභකප්පරුක්ඛො
චින්තාමණිප්පවරභද්දඝටො මුනින්දො.

455 එවං තිලොකමහිතො අනිබද්ධවාසං
කත්වා වරම්පඨමබොධියුදාරපඤ්ඤො
ඡබ්බණ්ණරංසිසමුපෙතවිචිත්තදෙහො
ලොකෙකබන්ධු භගවා අවසෙසකාලෙ.

---

සධෙන, ධර්මනමැතිඛඞ්ගයෙන්; ලොකස්ස, ලොකවාසිසත්ත්වයන් ගේ; ඝොරතර, අතිශයින්දරුණුවූ; රාගරජං, රාගනමැතිරජස; විහන්ත්වා, විශෙෂයෙන්නසා; දසඅට්ඨමස්මිං වස්සම්හි, අටළොස්වෙනි වසෙහි; පවර, උතුම්වූ; චාලියපබ්බතස්මිං, චාලියපර්වතයෙහි; අඞ්ගීරසො, ශරීරයෙන්රශ්මිනික්මෙනහෙයින් අඞ්ගීරසනම්වූ සර්වඥතෙම; වාසං අකරි, වාසයකොළේසි.

(453) වෙනෙය්‍යබන්ධුජන, විනෙයබන්ධුජනයාගේ; උළාරං, මහත් වූ; මොහරිපුං, මොහනමැතිශත්‍රැන්; ධම්මඅසිනා, ධර්මනමැති ඛඞ්ගයෙන්; හන්ත්වා, නසා; වරධම්මරාජා, උතුම්වූ ධර්මරාජන්වූ; මධුරභාරති, මිහිරිවූ ධර්මදෙශනාඇති; ලොකනාථො, ලොකස්වාමිවූ සර්වඥතෙම; පුන, නැවත; තත්‍ථෙව,එමචාලිය පර්වතයෙහිම;එකූනවීසතිමකෙවස්සෙ, එකූන්විසිවසෙහි; වාසං අකා, වාසයකොළේසි.

(454) සුද්ධාසයො, පිරිසිදුවූ අදහස්ඇති; ලොකස්ස, ලොකවාසී සත්ත්වයාහට; අත්‍ථචරණෙ, වැඩහැසිරීමෙහි; සුභ, සුන්දරවූ; කප්ප රුක්ඛො, කල්පවෘක්ෂයක් හා සමානවූද; චින්තාමණි, චින්තාමාණික්‍යයක් හා සමානවූද; පවර, උතුම්වූ; භද්දඝටො, භද්‍රඝටයක් හා සමානවූද; මුනින්දො, මුනීන්ද්‍රවූ සර්වඥතෙම; විචිත්තෙ, විසිතුරුවූ; පවරරාජගහෙ, උතුම්වූ රජගහනුවර; සමවීසතිමම්හි වස්සෙ, සමවිසිවසෙහි; වාසං අකාසි, වාසයකොළේසී.

(455) එවං, මෙසේ; තිලොකමහිතො, ත්‍රෛලොක්‍යවාසීන්විසින් පුදනලද; උළාරපඤ්ඤො, මහත්වූ ප්‍රඥඇති සර්වඥතෙම; පඨමබොධියා, ප්‍රථමබොධියෙහිපටන්; අනිබද්ධවාසං කත්වා, අනිරන්තරවාසයකොට; වරං,හැසිරෙන්නේ; ඡබ්බණ්ණරංසි, සවණක්බුදුරැසින්; සමුපෙත,යුක්තවූ; විචිත්තදෙහො, විසිතුරුවූ ශරීරඇති; ලොකෙකබන්ධු, ලොකයාට අසහායබන්ධුවූ; භගවා, භාග්‍යවත්වූ බුදුරජතෙම; අවසෙසකාලෙ, අවශෙෂකාලයෙහි.

456 සාවත්ථියං පවරජේතවනෙ ච රම්මෙ
දිබ්බාලයෙ ච සමලංකතපුබ්බාරාමෙ
වාසං අකාසි මුනි වීසතිපඤ්චවස්සෙ
ලොකාභිවුද්ධිනිරතො සුඛසන්නිවාසො.

457 ඉති අමිතදයො යො පඤ්චතාළීසවස්සෙ
මනුජමනවනස්මිං ජාතරාගග්ගිරාසිං
පරමමධුරධම්මම්බූහි නිබ්බාපයන්තො
අවසි සමුනිමෙසො ලොකසන්තිං කරොතු!

---

458 පඤ්ඤාවරඞ්ගනා මය්හං සඤ්ජාතා මනමන්දිරෙ
තොසයන්ති සබ්බජනං වුද්ධිං ගච්ඡතු සබ්බදා.

459 චිත්තං යං රචයන්තෙන ජිනස්ස චරිතං මයා
පුඤ්ඤං තස්සානුභාවෙන සම්පත්තො තුසිතාලයං.

---

(456) සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; රම්මෙ, සිත්කලුවූ; පවර, උතුම්වූ; ජේතවනෙච, ජේතවනාරාමයෙහිද; දිබ්බාලයෙච, දිව්‍යවාසස්ථානයක්මෙන්; සමලංකත, සැරහුනාවූ; පුබ්බාරාමෙච, පූර්වාරාමයෙහිද; ලොකාභිවුද්ධිනිරතො, ලොකවාසිසත්ත්වයන්ට අභිවෘද්ධියෙහි ඇලුනාවූ; සුඛසන්නිවාසො, සැපයටවාසස්ථානවූ; මුනි, සර්වඥතෙම; වීසතිපඤ්චවස්සෙ, පස්විසිඅවුරුද්දක්මුලුල්ලෙහි; වාසං අකාසි, වාසයකොළේසි.

(457) ඉති, මෙසේ; අමිතදයො, ප්‍රමාණාතික්‍රාන්තවූකරුණාඇති; යො, යම්සර්වඥයෙක්තෙම; පඤ්චතාළීසවස්සෙ, පන්සාළිස්අවුරුද් දක්මුලුල්ලෙහි; මනුජ, සත්ත්වයන්ගේ, මනවනස්මිං, සිත්නමැතිවන යෙහි; ජාත, හටගත්තාවූ; රාගග්ගිරාසිං, රාගනමැතිවහ්නිරාශිය; පරම, උත්කෘෂ්ටවූ; මධුර, මිහිරිවූ; ධම්මම්බූහි, ධර්මනමැති ජල යෙන්; නිබ්බාපයන්තො, නිවමින්; අවසි, විසීද; සො මුනිමෙසො ඒ සර්වඥනමැතිමෙඝයතෙම; ලොකසන්තිං කරොතු, ලොකවාසිවූ සත්ත්වයන්ටශාන්තියක් (අභිවෘද්ධියක්) කෙරේවා.

(458) මය්හං, මාගේ; මනමන්දිරෙ, සිත්නමැතිමන්දිරයෙහි; සඤ්ජා තා, උපන්නාවූ; පඤ්ඤාවරඞ්ගනා, ප්‍රඥනමැති උත්තම ස්ත්‍රීතොම; සබ්බජනං, සියලුජනයා; තොසයන්ති, සතුටුකොරෙමින්; සබ්බදා, හැමකල්හිම; වුද්ධිංගච්ඡතු, අභිවෘද්ධියට පැමිණේවා.

(459) ජිනස්සචරිතං, සර්වඥයන්ගේචරිතය; රචයන්තෙන, කරන් නාවූ; මයා, මාවිසින්; යංපුඤ්ඤංචිත්තං, යම්කුසලයෙක් රැස්කරණ ලදද; තස්ස, ඒ කුසලයාගේ ආනුභාවෙන, ආනුභාවම්හිමයෙන්; තුසිතාලයං, තුසිතභවනයට; සම්පත්තො, පැමිණියාවූ (මම.)

460 මෙත්තෙය්‍යලොකනාථස්ස සුණන්තො ධම්මදෙසනං
තෙන සද්ධිං චිරං කාලං වින්දන්තො මහතිං සිරිං.

461 බුද්ධෙ ජාතෙ මහාසත්තොරම්මෙ කෙතුමතීපුරෙ
රාජවංසෙ ජනිත්වාන තිහෙතුපටිසන්ධිකො.

462 චීවරං පිණ්ඩපාතං ච අනග්ඝං විපුලං වරං
සෙනාසනං ච භෙසජ්ජං දත්වා තස්ස මහෙසිනො.

463 සාසනෙ පබ්බජිත්වාන ජොතෙන්තො තමනුත්තරං
ඉද්ධිමා සතිමා සම්මා ධාරෙන්තො පිටකත්තයං.

464 ව්‍යාකතො තෙන බුද්ධො යං හෙස්සතීති අනාගතෙ
උප්පන්නානුප්පන්නබුද්ධානං දානං දත්වා සුඛාවහං.

465 සංසාරෙ සංසරන්තො හි කප්පරුක්ඛොව පාණිනං
ඉච්ඡිතිච්ඡිතමන්නාදිං දදන්තො මධුරං වරං.

456 මංසලොහිතනෙත්තාදිං දදං චිත්තසමාහිතො
සීලනෙක්ඛම්මපඤ්ඤාදිං පූරෙන්තො සබ්බපාරමිං.

---

(460) මෙත්තෙය්‍යලොකනාථස්ස, මෛත්‍රෙයබොධිසත්ත්වයන්ගේ; ධම්මදෙසනං, ධර්මදෙශනාව; සුණන්තො, අසන්නේ; තෙනසද්ධිං, ඒ මෛත්‍රෙයබොධිසත්ත්වයන්හා සමග; චිරකාලං, බොහෝකාලයක්; මහතිං සිරිං, මහත්වූ ශ්‍රීවිභූතිය; වින්දන්තො, විඳිනේ.

(461) රම්මෙ, සිත්කලුවූ; කෙතුමතීපුරෙ, කෙතුමතීනම් රාජධානියෙහි; මහාසත්තො, මහාබොධිසත්ත්වයන්; බුද්ධෙජාතෙ, බුදුවූකල්හි; තිහෙතුපටිසන්ධිකො, ත්‍රිහෙතුකප්‍රතිසන්ධිඇතිව; රාජවංසෙ, රාජවංශයෙහි; ජනිත්වාන, ඉපද.

(462) අනග්ඝං, අනර්ඝවූ; විපුලං, මහත්වූ; වරං, උතුම්වූ; චීවරං, සිවුරුද; පිණ්ඩපාතංච,ආහාරයද; සෙනාසනංච,සෙනසුන්ද; භෙසජ්ජංච,භෛෂජ්‍යයද;මහෙසිනො,මහර්ෂිවූ; තස්ස,ඒසර්වඥයන්ට;දත්වා,දී.

(463) සාසනෙ, ශාසනයෙහි; පබ්බජිත්වාන, පැවිදිව; අනුත්තරං නිරුත්තරවූ; තං, ඒශාසනය; ජොතෙන්තො, බබුලුවමින්; ඉද්ධිමා, ඍද්ධිමත්ව; සතිමා, ස්මෘතිමත්ව; පිටකත්තයං, පිටකත්‍රය; සම්මා, මනාකොට; ධාරෙන්තො, දරන්නෙම්.

(464) තෙනබුද්ධෙන, ඒසර්වඥයන්විසින්; අයං, මේතෙම; අනාගතෙ, අනාගතකාලයෙහි; බුද්ධොහෙස්සතිඉති, බුදුවන්නේයයි; ව්‍යාකතො, විවරණදෙනලද්දේම්; උප්පන්නානුප්පන්නබුද්ධානං,උපන්නුපන්නාවූ සර්වඥවරයන්ට; සුඛාවහං; සැපඑලවන්නාවූ; දානංදත්වා,දන්දී.

(465) සංසාරෙ, සසර; සංසරන්තො, සැරිසරාඇවිදිනාවූ (මේමම;)පාණිනං, සත්ත්වයන්ට; කප්පරුක්ඛොව, කල්පවෘක්ෂයක්මෙන්; ඉච්ඡිතිච්ඡිතං, කැමැතිකැමැතිවූ; මධුරං, මිහිරිවූ; වරං, උතුම්වූ; අන්නාදිං, ආහාරාදිය; දදන්තො, දෙන්නෙම්.

(466) චිත්තසමාහිතො, එකහවූසිත්ඇතිව; මංසලොහිතනෙත්තාදිං, මාංසරුධිරනෙත්‍රාදිය; දදන්තො, දෙන්නෙම්; සීලනෙක්ඛම්ම

467 පාරමිසිඛරං පත්වා බුද්ධො හුත්වා අනුත්තරො
දෙසෙත්වා මධුරං ධම්මං ජනතුනං සිවමාවහං.

468 සබ්බං සදෙවකං ලොකං බ්‍රහාසංසාරබන්ධනා
මොචයිත්වා වරං ඛෙමං පාපුණෙය්‍යං සිවං පුරං.

469 ලඞ්කාලඞ්කාරභූතෙන භූපාලන්වයකෙතුනා
විජයබාහුනා රඤ්ඤා සකනාමෙන කාරිතෙ.

470 සතොයාසයපාකාර ගොපුරාදිවිරාජිතෙ
පරිවෙණවරෙ රම්මෙ වසතා සන්තවුත්තිනා.

471 මෙධඞ්කරාභිධානෙන දයාවාසෙන ධීමතා
ථෙරෙන රචිතං එතං සබ්භි සංසෙවිතං සදා.

472 භවෙ හෙ'ධ ගාථානං තෙසත්තති චතුස්සතං
ගන්ථතො පඤ්චපඤ්ඤාසාධිකං පඤ්චසතං ඉති.

---

පඤ්ඤාදිං, ශීලනෛෂ්ක්‍රම්‍ය ප්‍රඥාදිවූ; සබ්බපාරමිං, සියලුපාරමිතාධර්ම්‍ය; පූරෙත්වා, පුරන්තෙමි.

(467) පාරමිසිඛරංපත්වා, පාරමිතායෙහිමස්තකප්‍රාප්තව; අනුත්තරො, නිරුත්තරවූ; බුද්ධො හුත්වා, බුදුව; ජනතුනං, සත්ත්වයන්ට; සිවමාවහං, ශාන්තිඵලවඩන්නාවූ; මධුරංධම්මං, මිහිරිවූධර්ම්‍ය; දෙසෙත්වා, දෙසා.

(468) සබ්බං, සියලු; සදෙවකං ලොකං, දෙව්විනිසුන් සහිතවූ ලොකයා; බ්‍රහාසංසාරබන්ධනා, මහත්වූසංසාරනමැතිබන්ධනයෙන්; මොචයිත්වා, මුදා; වරං, උතුම්වූ; ඛෙමං, නිර්භයවූ; සිවංපුරං, ශාන්තිපුරයට; පාපුණෙය්‍යං, පමුණුවම් වා.

(469) ලඞ්කාලඞ්කාරභූතෙන, ලඞ්කාවට අලඞ්කාරයක් හා සමානවූ; භූපාලන්වයකෙතුනා, රාජවංශයටධ්වජයක්බඳුවූ; විජයබාහුනාරඤ්ඤා, විජයබාහුනම්රාජොත්තමයා විසින්; සකනාමෙන, ස්වකීයවූ නාමයෙන්; කාරිතෙ, කරවනලද.

(470) සතොයාසය, ජලාශ්‍රයසහිතවූ; පාකාරගොපුරාදි, ප්‍රාකාරගොපුරාදින්; විරාජිතෙ, බබලන්නාවූ; රම්මෙ, සිත්කලුවූ; පරිවෙණවරෙ, උතුම්පිරිවෙණෙහි; වසතා, වසන්නාවූ; සන්තවුත්තිනා, ශාන්තවූප්‍රවෘත්තිඇති.

(471) දයාවාසෙන, කරුණාවටවාසස්ථානවූ; ධීමතා, ප්‍රශස්තවූබුද්ධිඇති; මෙධඞ්කරාභිධානෙනථෙරෙන, මෙධඞ්කරයයනනම් ඇතිතෙරුන්වහන්සේවිසින්; සදා, හැමකල්හි; සබ්භි, සත්පුරුෂයන්විසින්; සංසෙවිතං, විශෙෂයෙන්සෙවුනාලද; එතං, මේජිනචරිතය; රචිතං, කරණලදී.

(472) ඉධ, මේජිනචරිතයෙහි; ගාථානං, ගාථාවන්සම්බන්ධිවූ; තෙසත්තති, තෙසැත්තෑවක්ද; චතුස්සතං, සාරසියයෙක්ද;(හෙවත්),සාරසියතෙසැත්තෑවෙක්; භවෙ, වන්නේය; ගන්ථතො, ග්‍රන්ථයෙසින් පඤ්චපඤ්ඤාසාධිකං, පස්පණසක්අධිකකොටඇති; පඤ්චසතංඉති, පන්සියයෙකැයි; (හෙවත්), පන්සියපණසෙක්; භවෙ, වන්නේයි.

නිමි.

# ශුද්ධි පත්‍රය.

| පිට | ගාථාවේ හෝ සනතයේ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 6 | 29 ස | ජලකාණිකා | ජලකණිණිකා |
| 7 | 33 ,, | සෘෂිවෙිස් | සෘෂිවෙස් |
| 21 | 96 ගා | අශොගමසමී | අශොගමසම් |
| 27 | 123 ස | ඇතතවු | ඇත්තාවූ |
| 29 | 129 ,, | ඒ ජනසමූහතොම | ඒ ජනසමූහතුමූ |
| 30 | 134 ,, | ලාචනසස | ලොචනසස |
| ,, | ,, ,, | ළුතතමාඞගසෙන් | උතතමාඞගයෙන් |
| ,, | 136 ගා | උතුනමනුරූප | උතුතමනූරූප |
| 31 | 141 ස | පඤචකමයන් | පඤචකාමයන් |
| 32 | 142 ,, | ප්‍රවුජතරූපයක්ද | ප්‍රවූජිතරූපයක්ද |
| 34 | 152 ,, | පුයසීයාමෙන් | සූයසීයාමෙන් |
| 41 | 189 ,, | දමනදල | දමනලද |
| 52 | 243 ගා | කරිසසාමිනි | කාරිසසාමිති |
| 55 | 252 ස | භුකුටිපපූචාරං | භුකුටිපපචාරං |
| ,, | 253 ,, | දූමිය | දූමිය |
| ,, | 255 ,, | දූක | දූක |
| 57 | 266 ගා | ජනවෙසධාරි | ජනවෙසධාරී |
| 66 | 307 ස | ලොකනාතදසසිං | ලොකනාතදසසිං |
| ,, | 308 ,, | ආවැත්නි | ඇවැත්නි |
| 68 | 319 ,, | ඝිභුජෙන | ඝීභුජෙන |
| 74 | 350 ,, | විරජිතානි | විරාජිතානි |
| ,, | ,, ,, | මුතත | මූතතා |
| 77 | 360 ,, | අරණෙ | අරණ්‍ය |
| 79 | 370 ,, | ප්‍රතිහායසීය | ප්‍රාතිහායසීය |
| 79 | 371 ,, | සුද්ධොතො | සුද්ධොදනො |
| 80 | 376 ,, | ගතො | ගතා |
| 81 | 381 ගා | දෙවිඳු | දෙවිඳු |
| 85 | 404 ස | පුෂකරණී | පුෂකරිණී |
| 86 | 405 ,, | ඝර | ඝරං |
| 88 | 413 ගා | තොරණඞගික | තොරනඞගිකා |
| ,, | ,, ස | අඞගික | අඞගික |
| 89 | 418 ,, | ගත්තවූ | ගත්තාවූ |
| 96 | 446 ,, | වාරු | වාරු |



